SRI LANKA AIR FORCE

2023

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT





ශ්‍රී ලංකා ගුවන් හමුදාව
இலங்கை விமானப் படை
SRI LANKA AIR FORCE

2023 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
වියදම් ශීර්ෂ අංක 224

පටුන

පිටු අංකය

ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය 05 - 06

01 වන පරිච්ඡේදය 07

1. විධායක සාරාංශය 07
1.1 හැඳින්වීම 07 - 08
1.2 දැක්ම,මෙහෙවර හා මූඛ්‍ය හැකියාවන් 08 - 09
1.3 ප්‍රධාන කාර්යයන් 09
1.4 සංවිධාන සටහන 10
1.5 2023 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන් 11 - 15

02 වන පරිච්ඡේදය 16

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 16
2.1 ප්‍රගතිය 16 - 23
2.1.1 2023 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය
අ. සැලසුම් අධ්‍යක්ෂකය 24
ආ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය 25 - 27
ඇ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය 27
ඈ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය 28 - 36
ඉ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය 36 - 38
ඊ. විද්‍යුත් හා පරිගණක ඉංජිනේරු අධ්‍යක්ෂකය 38 - 39
උ. සැපයුම් අධ්‍යක්ෂකය 39
ඌ. පරිපාලන අධ්‍යක්ෂකය 39
එ. ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකය 39 - 42
ඒ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය 42 - 43
ඔ. පුහුණු අධ්‍යක්ෂකය 43
ඕ. සුභසාධන අධ්‍යක්ෂකය 43 - 44
ඖ. විනයාරක්ෂක අංශය 44 - 45
ක. ගුවන් බුද්ධි අංශය 45
ඛ. තොරතුරු තාක්ෂණ අංශය 45 - 46
ග. ප්‍රාසාංගික කලා අංශය 47
ඝ. මාධ්‍ය අංශය 47 - 49
ඞ. ක්‍රීඩා අංශය 49
ත. දන්ත සේවා අංශය 49 - 50
ද. ප්‍රධාන බඳවාගැනීමේ කාර්යාලය 51
න. නීති අංශය 51
ප. අභ්‍යන්තර විගණන අංශය 51 - 58
බ. විදේශ සබඳතා අංශය 58

2.1.2 දීපව්‍යාප්තව පිහිටා ඇති ශ්‍රීලංගුහ මූලික කඳවුරු සහ කඳවුරු විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් 59 - 69
2.2 ඉදිරි දැක්ම 70 - 73

03 වන පරිච්ඡේදය 74

3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය 74
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 74
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 75
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 76
3.4 මූල්‍ය තත්වය පිළිබඳ සාරාංශ විශ්ලේෂණය 77 - 84
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 85
3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 86
3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 86
3.8 මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 87
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 88
3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව 89 - 102

04 වන පරිච්ඡේදය 103

4. කාර්යසාධන දර්ශක 103
4.1 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 103 - 104

05 වන පරිච්ඡේදය 105

5. තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සපුරාගැනීමේ කාර්යසාධනය 105 - 110

06 වන පරිච්ඡේදය 111

6. මානව සම්පත් පැතිකඩ 111
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 111 - 116
6.2 මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපෑම 117
6.3 මානව සම්පත් සංවර්ධනය 117 - 144

07 වන පරිච්ඡේදය 145

7. අනුකූලතා වාර්තාව 145 - 151

08 වන පරිච්ඡේදය 152

8. කමිටු වාර්තා 152 - 154

9. සමාප්තිය 155

10. කෙටි යෙදුම් 156 - 157

ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ (ශ්‍රී ලංගුහ) විරුවන් සහ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 මූල්‍ය වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා වාර්ෂික කාර්ය සාධන වාර්තාව, 2021 - 2023 වසර සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා සංයුක්ත සැලැස්ම සහ 2023 වසර සඳහා වන ගුවන් හමුදා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ඉදිරිපත් කිරීමට ලැබීම මට ගෞරවයකි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව (2021-2023) සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්ක එකොළොහක් (11) කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒවා අයවැය වැඩසටහන සමඟ සම්පාත කර ඇත. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් අනුව, 2023 වර්ෂය තුළ ආරක්ෂක වැඩසටහන පාලනය කළ ආකාරය සවිස්තරාත්මක සාධාරණීකරණයන් මගින් පෙන්නුම් කෙරේ. ගුවන් හමුදා භාවිතයන් සහ ක්‍රියාවලීන් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වන මෙම මාර්ග සිතියම මැනිය හැකි ඉලක්ක නිරූපණය කරන අතර අපගේ අභ්‍යන්තර මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා පැහැදිලි වගවීමේ සීමාවන් ස්ථාපිත කරයි. සැලැස්මේ අරමුණු අතර බල සේනාව ප්‍රතිව්‍යුහගත කිරීම, ගුවන් බලය වැඩි කිරීම,පවුල් සඳහා සහන ලබාදීමේ වැඩසටහන් හඳුන්වාදීම, දත්ත ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ අවි පද්ධති සඳහා විශ්ලේෂක නඩත්තු කිරීමේ හැකියාවන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

ගුවන් හමුදාව විසින් බදු ගෙවන්නන්ගේ අරමුදල්වල කළමනාකාරිත්වය සහ මූල්‍ය ඒකාග්‍රතාවය ඉහළම ප්‍රමුඛතාවයන් සඳහා යොදාගැනීමට අඛණ්ඩව කටයුතු කරයි. මෙම කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් කර තක්සේරු කර ඇති කාර්ය සාධන දත්ත ශ්‍රී ලංකා රජය මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල හා සම්පූර්ණ සහ විශ්වාසදායක වේ. කාර්ය සාධන වාර්තාවට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය කළමනාකරණ පද්ධති සහ පාලන මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සටහන් කර ඇති පාලන අවස්ථා පිළිබඳ තොරතුරු සහ සුරක්ෂිත බව ද ඇතුළත් වේ.

මෙම මූල්‍යමය වශයෙන් අභියෝගාත්මක කාලයේදී, වර්තමාන මෙහෙයුම් සූදානම මට්ටම් පවත්වා ගැනීම සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා අනාගත නවීකරණය සහ ප්‍රාග්ධනීකරණ ප්‍රයත්නයන් අතර සියුම් සමතුලිතතාවයේ ඇතිකිරීම සිදු කරන අතරම, ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්ගේ යහපැවැත්ම සහතික කිරීම අරමුණ විය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව මූලික හැකියාවන් ආරක්ෂා කර ගැනීම සඳහා සමතුලිත ප්‍රවේශයක් අනුගමනය කරන අතර තරඟකාරී හමුදාමය වන්දි පිරිනැමීම සඳහා අධිෂ්ඨානශීලීව කැපවී සිටියි. අපගේ ජාතිය ආරක්ෂා කිරීම සඳහා වෙහෙස නොබලා සේවය කරන ඉහළ පෙළේ ගුවන් විරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට මෙම කැපවීම අත්‍යවශ්‍ය වේ.


ගුවන් හමුදාව විසින් අඛණ්ඩ මෙහෙයුම් සුදානම සඳහා සීමිත උපයෝජනයක් සහිත වැඩසටහන් හා පහසුකම් ඉවත් කිරීම, අවසන් කිරීම සහ/හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දුෂ්කරතා මධ්‍යයේ අඛණ්ඩව උත්සාහ දැරිය යුතු වේ. මෙම උපායමාර්ගික ප්‍රවේශය ජාතික ආරක්ෂක උපාය මාර්ගය සමඟ සම්පාත වන අතර, අපගේ හමුදා නිලධාරීන් සහ සම්පත් වගකීමෙන් පරිහරණය කිරීම සම්බන්ධයෙන් බුද්ධිමත් හා විනයගරුක තේරීම් සිදු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. තවද, ගුවන් හමුදාව සිය මිත්‍ර ගුවන් හමුදාවන් සමඟ සහයෝගීතාවයෙන් පහසුකම් සපයන ගුවන් යානා ප්‍රේරණය කිරීමේ වැඩසටහන් හරහා සිය ගුවන් බල හැකියාවන් ඉහළ නැංවීමට දරන උත්සාහයන්හි අධිෂ්ඨානශීලීව රැඳී සිටියි. කැපී පෙනෙන ලෙස, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නවතම Y-12 IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා ප්‍රේරණය කිරීම සහ ගුවන් හමුදාවේ සමුද්‍රීය ආවේක්ෂන හැකියාව ඉහළ නැංවීම සඳහා Beech King Air 300 අත්පත් කර ගැනීම.

2023 මූල්‍ය වර්ෂයේ අයවැය මගින් බලසේනා ගැලපීම් වලට අනුරූප වන මිනිස් බලය අඩුවීමක් පිලිබිඹු කරයි. අනාගත ඉහළ මට්ටමේ කටයුතු සඳහා අවශ්‍ය හැකියාවන් සඳහා ආයෝජනය කිරීම සඳහා සම්පත් වෙන් කිරීම සඳහා ගුවන් හමුදාව නිවැරදි ප්‍රමාණයට පවත්වා ගැනීමට මෙම පියවරයන් අත්‍යවශ්‍ය වේ. 2023 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRA) 12ක් සමඟින් ජනාධිපති ලේකම් සහ ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා අතර 2023 කාර්ය සාධන ගිවිසුම (PA) ඇතුළත් විය. ගුවන් හමුදාවට අදාළ වන ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRA) 7 යටතේ රටේ ආරක්ෂක බලසේනා ශක්තිමත් කිරීම, ගුවන් අවකාශ ආරක්ෂාව, ස්වාභාවික විපත් වල බලපෑම කළමනාකරණය කිරීම, වැඩ ක්‍රියාවලිය සරල කිරීම සහ පුනරාවර්තන වියදම් අඩු කිරීම වැනි ප්‍රමුඛතා ඉටු කිරීම සඳහා ගුවන් හමුදාව සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.

ආදායම් උත්පාදනය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ බහුමාන ඒකාබද්ධ ස්ථායීකරණ මෙහෙයුමේ සිය ගුවන් සේවා අඛණ්ඩ යෙදවීම අඛණ්ඩව සිදු කර ඇති අතර, 2023 වර්ෂය තුළ ජාතික ආර්ථිකයට සහාය වෙමින් මහා භාණ්ඩාගාරයට අවශ්‍ය විදේශ මුදල් ප්‍රේෂණ වැඩි දියුණු කර ඇත.

සමස්ත මූල්‍ය කාර්ය සාධන අංශයට මෙම වසරේ විගණනයේ සොයාගැනීම් ගෙනහැර දක්වන විගණකාධිපති වාර්තාව ඇතුළත් වේ. තවද, විගණන ප්‍රතිකර්ම ප්‍රයත්නය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සම්පත් උපාය මාර්ග සමඟ පෙළගැස්වීම, උපායමාර්ගය ප්‍රතිපත්ති සමඟ සමපාත වන බව සහතික කිරීම සහ එම ප්‍රතිපත්තිය රටේ කැමැත්ත පිළිබිඹු කරන අපගේ අරමුණ සඳහා ප්‍රධාන වේ. අපගේ වෘත්තීය භාවිතයන් නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම මගින්, බදු ගෙවන්නන්ගේ සම්පත්වල වඩාත් ඵලදායී භාරකරුවන් බවට පත්වීම අපගේ අරමුණ වන අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්ට වඩා හොඳින් සහාය වීමට සහ කාලය, මුදල් සහ පිරිස් ඉහළ ප්‍රමුඛතා සඳහා වෙන් කිරීමට අපට හැකි වී ඇත.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව තාක්ෂණයෙන් මෙහෙයවන බලකායක් ලෙස අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා කැපවී සිටින අතර, පෙර ජයග්‍රහණ අභිබවා යාමටත්, 2024 දී සහ ඉන් ඔබ්බට වැඩිදියුණු කළ මෙහෙයුම් සූදානම සහ වගකිවයුතු මූල්‍ය කළමනාකරණය තුළින් ජාතියට වඩාත් හොඳින් සේවය කිරීම අරමුණු කර ගෙන ඇත.



(ආර්ජ්‍යූපී රාජපක්ෂ)

ආර්එස්පි(තෙවරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඒ) ඇමරිකා එක්සත් ජනපදය,
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්ඒ අයිඑස් සහ එස් (එක්සත් රාජධානිය),
බීඑස්සී (ආරක්ෂක අධ්‍යයන), එම්අයිඑම් (ශ්‍රී ලංකා), ඒඑම්අයිඊ (ශ්‍රී ලංකා), ආර්සීඩීඑස්, පීඑස්සී

එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

2024 මැයි මස 31 වන දින

01 පරිච්ඡේදය

1. විධායක සාරාංශය

1.1 හැඳින්වීම

අ. 2023 මූල්‍ය වර්ෂයේදී, 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වෙමින් හා රටේ ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය ලබා දී ඇත. ජාතික ආරක්ෂාව සඳහා ගුවන් බලය ඵලදායී ලෙස මෙහෙයවීමේ තම මූලික කාර්යභාරයට අතිරේකව වාර්ෂිකව රට තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය ලබා දී ඇත. විශේෂයෙන්ම 2023 මූල්‍ය වර්ෂයේ දී වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. රටේ ආර්ථික අභියෝගාත්මක තත්ත්වය වැනි සංකීර්ණ අභියෝග හමුවේ ඉදිරි වසරවලදී රජයේ වියදම් කළමනාකරණ ක්ෂේත්‍රයට ධනාත්මක බලපෑමක් ඇති කරන වැදගත් මුලපිරීම් 2023 මූල්‍ය වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් දියත් කර ඇත.

ආ. 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා අවශ්‍ය යැයි හඳුනාගත් ප්‍රධාන අවශ්‍යතාව වන අභ්‍යන්තර ගුවන් ගමන් කටයුතු වැඩිදියුණු කිරීමෙහිලා මූලිකත්වය ගෙන ක්‍රියාකොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතික ආපදා හා ව්‍යසනකාරී තත්ත්වවලදී තුවාලකරුවන් මුදවා ගැනීම මෙන්ම අවස්ථානුකූලව හට පිරිස් යෙදවීම ආදිය මඟින් තම ක්‍රියාකාරී දායකත්වය ලබා දී ඇත. 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව තුළ 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2023 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ද ඇතුළත්ය. තවද, 2023 වර්ෂය තුළ ඉටු කිරීමට ස්ථාපිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය එහි තත්‍ය කාර්යසාධනයට සාපේක්ෂව විශ්ලේෂණය කිරීම හා 2023 වර්ෂයේ අපේක්ෂිත සැලැස්ම සඳහා ඉස්මතු කිරීම සිදු කර ඇත.

ඇ. **වාර්ෂික අයවැය වාර්තාව සමඟ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විශ්ලේෂණය කිරීම**

(1) වාර්ෂික කාර්යසාධන වාර්තාව, සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ වාර්ෂික අයවැය වාර්තාවට සමාන පදනමක් මත සකස් කර ඇත. එමඟින් 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත ඉලක්ක වලට සාපේක්ෂව කාර්යසාධනය වාර්තා කරයි. සෑම අංශයකම කාර්යසාධනය පිළිබඳ කෙටි සාරාංශයක් හා ඇගයීමක් අන්තර්ගතවන අතර ඊට අතිරේකව වර්ෂය තුළ සිදු කරන ලද ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ ඇතැම් කරුණු පසුබිම්කොටගත් කරුණු දැක්වීම් ඇතුළත්ය.

(2) වාර්ෂික අයවැය වාර්තාව, නැඟී එන ඉහළ පෙළේ ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තුව සංවිධානය වීමේදී විය හැකි වෙනස්වීම් පිළිබිඹු කරමින් කාලයත් සමඟ විකසනය වීමට ඕනෑකමින් සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ව්‍යුහය ස්ථාවරව පැවතියද, ඉහළ මට්ටමේ සහයක අරමුණු වලදී හා එම අරමුණු එකිනෙකට යා කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී එක් වාර්ෂික අයවැය වාර්තාවකින් ඊළඟ අයවැය වාර්තාවට සැලකිය යුතු ප්‍රමාණයේ වෙනස්කම් මතු වීම නොවැළැක්විය හැකි කරුණකි.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉහළ මට්ටමේ අරමුණු 2021-2023. සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇත. ඒ අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇති ඉලක්ක හා 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට වන කාර්යසාධනය පිළිබඳ සාරාංශයකින් ආරම්භවේ. වියදම් සමාලෝචනයන්, වාර්තාව පුරාවටම දක්වා ඇත.

ඇ. **දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන 2023**

(1) එක් එක් මූල්‍ය වර්ෂ වලදී අවශ්‍ය වූ, රඳවා තබාගත් හා බැහැර කළ සම්පත් හා වර්ෂය තුළ දී ඒවා භාවිත කළ ආකාරය විස්තර කරමින් මූල්‍ය වාර්තා සකස් කිරීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ යුතුය. ඒ අනුව මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත සකස් කරනු ලබයි. වැඩි දුරටත් රජයේ ගිණුම්කරන මූලධර්මයන් පදනම් කරගෙන සකස් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ හා මූල්‍ය ප්‍රකාශන අනුව ද වේ.

(2) ඔවුන් විසින් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යයන්වල තත්වය, ශුද්ධ සම්පත් නිපැයුම, අරමුණු සාක්ෂාත් කරගැනීමට යොදාගත් සම්පත්, හඳුනාගත් ලාභ හා අලාභ සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ නිවැරදි හා සාධාරණ මතයක් ලබා දිය යුතුය. 2023 වර්ෂය සඳහා වන දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනය මෙම වාර්තාව සමඟ අමුණා ඇත.

ඉ. **කාර්යසාධන කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව**

(1) කාර්යසාධන කළමනාකරණය යනු උපායමාර්ගික අරමුණු හා ප්‍රමුඛතාවයන් නියම කිරීම, එහිලා වැඩසටහන් නිර්මාණය කිරීම, එම වැඩසටහන්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා දත්ත රැස්කිරීම හා ප්‍රගතිය මැන බැලීම, වැඩසටහන් හා සම්පත් විභජනය කෙරෙහි බලපෑ හැකි පරිදි කාර්යසාධන හා ඇගයුම් තොරතුරු උපයෝගී කරගැනීම, ආයෝජකයින් වෙත ප්‍රතිඵල සන්නිවේදනය හා තීරණ ගැනීම ආදී බහු අදියරයන්ගෙන් යුත් ක්‍රියාවලියකි.

(2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන කළමනාකරණය, 2021-2023 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම හා 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙහෙයවා ඇත.

1.2 <u>දැක්ම,මෙහෙවර හා මූඛ්‍ය හැකියාවන්</u>

අ. දැක්ම

"ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම"

ආ. මෙහෙවර

"ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනූන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම"

ඇ. මූඛ්‍ය හැකියාවන් ආයතනික මූඛ්‍ය හැකියාවන් එහි ඉලක්කගත අරමුණු ළඟා කරගැනීම සඳහා ආයතනය මෙහෙයවන ප්‍රධාන නිර්ණායකයන් වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුවද එවැනි අද්විතීය වූ මූඛ්‍ය හැකියාවන් පවතින අතර ඒවා පහත පරිදිය.

(1) <u>ගුවන් මෙහෙයුම් හා ගුවන් ආරක්ෂක හැකියාව</u>. ශ්‍රී ලංකාව තුළ ගුවන් මෙහෙයුම් සහ ගුවන් ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව වේ.

(2) <u>සීමිත සම්පත් නවෝත්පාදාත්මක ලෙස උපයෝජනය</u>. ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතීතයේ සිට විවිධ වූ තත්වයන් යටතේ සීමිත සම්පත් උපයෝජනය කිරීම හා යෙදවීම තුළින් උපරිම ප්‍රතිඵල ළඟා කරගැනීමේ අද්විතීය හැකියාවක් පෙන්නුම් කර ඇත.

(3) <u>අනේකවිධ මෙහෙයුම් අත්දැකීම් වලින් සන්නද්ධ වූ වෘත්තිමය, අභිප්‍රේරිත ශ්‍රම බලකායක්</u>. බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ පොහොසත් සම්ප්‍රදායන්ට උරුමකම් කියන, වෘත්තිමය සංවර්ධන ව්‍යුහයක් හා සුවිශේෂී පුහුණුවක් සහිත ආරම්භයේ සිටම විවිධ මෙහෙයුම් කාර්යයන් සඳහා ගුවන් බලය ලබා දීමෙන් ලද අත්දැකීම් සම්භාරයක්ද කැටිකර ගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සේවය වෙනුවෙන් කැප වූ අභිප්‍රේරිත සහ අනුවර්තිත හැකියාවෙන් ඉහළ වෘත්තිමය බලකායක් බිහි කර ඇත.

(4) ජාතික ආරක්ෂාව සඳහා සයිබර් අවකාශය හා විද්‍යුත් චුම්බක වර්ණාවලිය සඵලදායිව, ආරක්ෂාකාරීව හා වගකීමෙන් යුක්තව උපයෝජනය කිරීම.

(5) දීපව්‍යාප්ත විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ රේඩාර් ජාලයේ හිමිකාරිත්වය හරහා සන්නිවේදන හා ගුවන් නිරීක්ෂණ සඳහා විද්‍යුත් චුම්භක වර්ණාවලියත්, තොරතුරු කළමනාකරණය සඳහා සයිබර් අවකාශයත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ගුවන් හමුදාව සතුව අද්විතීය හැකියාවක් ඇත.

1.3 ප්‍රධාන කාර්යයන්

අ. මතුපිට ඇති සියලු මාධ්‍යයන් හරහා ගුවන් බලය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම.

ආ. රජයේ ඉල්ලීම මත මුදවා ගැනීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් සැලසීම.


ඇ. ගුවන්යානා, මාර්ග ප්‍රවාහන, විද්‍යුත් උපකරණ, වෙනත් පිරියත සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සඳහා ඉංජිනේරු හා සැපයුම් සේවා සම්පාදනය කිරීම.

ඈ. අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම් සඳහා භට පිරිස් සැපයීම.

ඉ. යුධමය නොවූ ගුවන් මෙහෙයුම්වල නිරත වීම සහ ජාතික සංවර්ධනය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම.

ඊ. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා භට පිරිස්, ගුවන්යානා හා වාහන ලබා දීම තුළින් සක්‍රීයව දායක වීම.

1.4 සංවිධාන සටහන


COMMANDER
Chief of Staff
Dy Chief of Staff
Director General Welfare
Director General Training
Director General Health Services
Director General Construction Engineering
Director General Administration
Director General Logistics
Director General Ground Operations
Director General Electronics & Computer Engineering
Director General General Engineering
Director General Aeronautical Engineering
Director General Air Operations
Director General Planning
Dir QA (DQA)
Dir Flight Safety (DFS)
Dir Capital Welfare Projects (DCWP)
Dir Performing Arts (D Per Arts)
Dir Sports (DS)
Chief Pub Off (C Pub O)
Chief EMO
Dir Ranaviru Welfare (DRW)
Dir Internaland Public Welfare (DI&PW)
Dir Agriculture & WelfareProjects (DA&W P)
Dir Trade Trg (DTT)
Dir Specialized Trg (DST)
Director Academic Studies (DAS)
Dir Medical Services (DMS)
Dir Dental Services (DDS)
SeniorStaffOfficer Health Services Personnel & Planning (SSOHS - P&P)
Dir Construction Engineering - Personnel & Planning (DCE-P&P)
Dir Civil, Mechanical & Elec Engineering (DCM&EE)
Dir Personnel Administration (D PA)
Dir Accounts Administration (DAA)
Dir Civil Admin (DCA)
Dir Finance (DF)
CO VAF
CO W/Wing
SeniorStaff Officer Administration- Personnel & Planning (SSOA – P&P)
Dir Logistics Personnel & Planning (DL-P&P)
Dir Supplies& Service (DS&S)
Chief PO
Dir Ground Operations Personnel & Planning (DGO-P&P)
Dir Force Protection (DFP)
Dir Special Operations (DSO)
Dir Electronics & Telecommunication Engineering (DETE)
Dir Information Technology (DIT)
SeniorStaffOfficer Elect& Comp Eng – Personnel & Planning (SSOE&CE - P&P)
Dir Motor Transport (DMT)
Dir Aircraft Ground Support & Armament (DAGS&A)
SeniorStaff Officer General Engineering Personnel & Planning (SSOGE-P&P)
Dir Aeronautical Engineering- Personnel & Planning (DAE-P& P)
Dir Aeronautical Engineering Maintenance (DAE-M)
SASO
Dir Air Operations (DAO)
Dir Air Traffic Services (DATS)
Dir Air Defence (DAD)
CIRE (F/W)
CIRE (R/W)
Chief FO
Dir Doctrine & Policy Development (DD&PD)
Dir R&D (DR&D)
Chief Recruiting Officer (CRO)
Chief Financial Controller (CFC)
Northern Air Command
Southern Air Command
Eastern Air Command
Provost Marshal (PM)
Dir Legal
Dir Media
Dir Foreign Affairs (DFA)
Dir AI (DAI)
Dir Budget
Dir Internal Audit (Svc)- (DIA-Svc)
Dir Internal Audit (Civil) - (DIA-Civ)
Dir Audit NPF
Judge Advocate

1.5 2023 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන්

අ. සැලසුම් අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථාන මට්ටමින් සැලසුම් කිරීම සඳහා මධ්‍යගත ආයතනයක් ඇති කිරීම සඳහා සැලසුම් අධ්‍යක්ෂක මණ්ඩලය ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැලසුම් ක්‍රියාකාරකම් සඳහා සමස්ත සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය, පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති පරිපාලනය, මානව සම්පත් පර්යේෂණ සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම මෙම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

ආ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් මෙහෙයුම් කාර්යයන් ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත් වේ. ගුවන් මෙහෙයුම්, ගුවන් ආරක්ෂාව, ගුවන් ගමන් පාලනය හා ගිනි නිවීම් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය වගකීම දරයි.

ඇ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය

හැඳින්වීම. 2014 පෙබරවාරි 28 වන දින ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය නැවත සේවයේ පිහිටුවන ලදී. ඕනෑම අයුරක බාහිර/ අභ්‍යන්තර සතුරු ප්‍රහාර වැළැක්වීම සහ ගුවන් මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් වත්කම් හා ස්ථාපිතයන් ආරක්ෂා කිරීම අරමුණු කොට ගෙන පක්ෂාංග 29කින් යුත් ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තුව, ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය යටතේ පිහිටුවන ලදී.

ඈ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් යානාවන් ගුවන් ගමන් වලට යොදා ගත හැකි මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා සම්මත ඉංජිනේරු ප්‍රයෝගයන් භාවිතයට ගැනීම හා එමඟින් ගුවන් ගමන් වල ආරක්ෂාව තහවුරු කිරීමට ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය වගකියනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව වර්ග 21ක ගුවන් යානා 95ක් ඇත. මෙම ගුවන් යානා 95, පියාපත් සහිත ගුවන් යානා 53ක් හා හෙලිකොප්ටර් යානා 42ක් ලෙස නැවත වර්ග කර දැක්විය හැක.

ඉ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් පරිපාලනය කිරීම සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූලික කාර්යය වන පියාසර කිරීම සඳහා අවශ්‍ය වන සහය සපයනු ලබයි. ප්‍රධාන අංශ 02ක් හා වෘත්තීන් 10ක් මෙම අධ්‍යක්ෂකයේ විෂයපථය යටතේ පාලනය වේ. සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය හා මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගය මෙම ප්‍රධාන අනුබණ්ඩ දෙක වේ. වෘත්තීන් 10කට අයත් විශේෂඥ දැනුමැති ගුවන්භටයින් මෙම අධ්‍යක්ෂකය සතු නමුත් සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් හා ගුවන් යානා ඉංජිනේරු සම්බන්ධ කාර්යයන්වල මාරුවෙන් මාරුවට නියැලී සිටින කාර්මික ඉංජිනේරු ශාඛාවේ නිලධාරීන් විසින් මෙහි සේවය සපයයි.

ඊ. විද්‍යුත් හා පරිගණක ඉංජිනේරු අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඵලදායී ලෙස විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික පහසුකම් සැපයීම හා නඩත්තුව මෙන්ම එම කාර්යයන් පරිපාලනය සඳහා විද්‍යුත් හා පරිගණක ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී.

උ. **සැපයුම් අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම මෙහෙයුම්, පුහුණුවීම්, පරිපාලනමය කටයුතු හා සුභසාධන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය සැපයුම් සහය ලබා දීම සඳහා මෙම අධ්‍යක්ෂකය පිහිටුවා ඇත.

ඌ. **පරිපාලන අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් මෙන්ම සාමාන්‍ය විනය සම්බන්ධ රාජකාරි, නිලධාරීන් සම්බන්ධ කාර්යයන්, ගුවන්භට/ ගුවන් කාන්තා සම්බන්ධ කාර්යයන්, වැටුප් හා දීමනා, ආයතනික කාර්යයන් හා අනෙකුත් පරිපාලනමය කරුණු යනාදිය මෙම අධ්‍යක්ෂකය වෙත පවරා ඇත.

එ. **ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ප්‍රතිපත්ති සකස් කිරීම සහ විද්‍යුත්, කාර්මික හා සිවිල් යන විවිධ ඉංජිනේරු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සියලුම ඉංජිනේරු කාර්යයන් සිදු කිරීම සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත්වන සියලුම ඉංජිනේරු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අනුමත මිනිස් බලය, අනෙකුත් අමුද්‍රව්‍ය හා වෙන් කළ මුදල් ඵලදායී ලෙස යොදාගැනීම අධ්‍යක්ෂකය සතු කාර්යභාරය වේ.

ඒ. **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය**

හැඳින්වීම. තාක්ෂණික වශයෙන් බලවත් හමුදාවක ප්‍රධාන හේතුකාරකයක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය රැකගැනීමේ කාර්යයෙහිලා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂකයෙහි ප්‍රමුඛ කාර්යය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අමතරව ගුවන් හමුදා රෝහල්වල රෝගීන්ට සත්කාර කිරීමේ කටයුතු හැසිරවීමට අවශ්‍ය ශක්‍යතාවන් සංවර්ධනය කළ යුතුව ඇත.

ඔ. **පුහුණු අධ්‍යක්ෂකය**

හැඳින්වීම. පුහුණු ප්‍රතිපත්ති සැකසීම, ආරම්භක, මූලික හා උසස් වෘත්තීය පුහුණු, විශේෂඥ හා උපදේශක පුහුණු, ගුවන්භටයින්ගේ හා නිලධාරීන්ගේ උසස්වීම් සඳහා වන විභාග සැලසුම් කිරීම හා පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පුහුණු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙම අධ්‍යක්ෂකය මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සියලුම පුහුණු මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතීන් සාක්ෂාත් කර ගනිමින් පවත්වාගෙන යන බව තහවුරු කරනු ලබයි.

ඕ. **සුභසාධන අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම නිලධාරීන්/ ගුවන්භටයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය ගුවන්හමුදාධිපතිට වග කියනු ලැබේ. ඒ අනුව සේවා පුද්ගලයින්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවන තත්වය ඉහළ දැමීමට මූල්‍ය හා වෙනත් අත්‍යවශ්‍ය සුභසාධන පහසුකම් සැපයීම සඳහා සුභසාධන කටයුතු ආරම්භ කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය වගකීම සහිතව මෙම අධ්‍යක්ෂකය කටයුතු කරනු ලැබේ. එමෙන්ම ක්‍රියාකාරී සේවයේදී ආබාධිත වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් පුනරුත්ථාපනය හා ඔවුන්ට අවශ්‍ය සුභසාධන කටයුතු සැලසීම සුභසාධන අධ්‍යක්ෂකයෙහි වගකීම වේ.

ඔ). **ගුවන් බුද්ධි අංශය**

<u>හැඳින්වීම</u>. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම බුද්ධි තොරතුරු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2017 මැයි 23 වන දින ගුවන් බුද්ධි අංශය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විෂය පථයට ගැනෙන ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය සහ ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්, ගොඩබිම් බුද්ධිය, ගෝලීය බුද්ධිය සහ සයිබර් බුද්ධිය ඇතුළු ගුවන් බුද්ධිය කාර්යක්ෂමව හා ඵලදායිව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අංශය වගකියනු ලැබේ.

ක. **අයවැය අංශය**

<u>හැඳින්වීම</u>. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්වාධීන අංශයක් ලෙස අයවැය අංශය පිහිටුවා ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් (ප්‍රතිපාදන) ලබා ගැනීම සහ රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය වර්ෂයක් තුළ අදාළ අධ්‍යක්ෂක ජනරාල්වරුන්/ අධ්‍යක්ෂකවරුන් වෙත වෙන් කළ ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය උදෙසා ඔවුන්හට සැලකිය යුතු මට්ටමේ පෙළඹවීමක් සිදු කිරීම, අයවැය අංශයේ මූලික කාර්යය වේ.

ඛ. **තොරතුරු තාක්ෂණ අංශය**

<u>හැඳින්වීම</u>. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ පිහිටි ස්වාධීන අංශයක් ලෙස තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය පිහිටුවා ඇත. ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති, තොරතුරු ජාලයන්, දෘඩාංග, දත්ත පද්ධති, බහුමාධ්‍ය සැලසුම් සහ සයිබර් ආරක්ෂාව ඇතුළු සියලුම තොරතුරු තාක්ෂණ පද්ධති හා මෙවලම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

ග. **නීති අංශය**

<u>හැඳින්වීම</u>. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නීතියේ ආධිපත්‍යය පිළිගන්නා, කවර හෝ බලපෑමකට යටත් වීමකින් තොරව ස්වාධීනව හා විනිවිද භාවයෙන් යුක්තව, කාර්යක්ෂම, ඵලදායි සහ නිරවද්‍ය නීති උපදෙස් හෝ වෙනත් ඕනෑම නීති සේවාවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සැපයීමේ පරමාර්ථයෙන් යුක්තව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධායක ව්‍යුහයේ ස්වාධීන අංශයක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නීති අංශය 2007 ජනවාරි පළමුවන දින ස්ථාපිත කරන ලදී.

ඝ. **මාධ්‍ය අංශය**

<u>හැඳින්වීම</u>. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාවේ මහජනයා වෙත වගකිව යුතු හා පිළිතුරු සැපයිය යුතුය. කෙසේ නමුත්, දෛනික රාජකාරීන්ට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම ආයතනික ප්‍රතිරූපය ගොඩනැංවීම හා ආරක්ෂා කර ගැනීම සලකා හෝ ආයතනයට පරිභාහිරව ගොඩනැඟෙන සංවාදයන්ට ප්‍රතිචාර දැක්වීම සලකා, සාමාන්‍ය ජනතාව සමඟ ඍජුව සම්බන්ධ වීම අත්‍යවශ්‍ය වනු ඇත. එය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ සාමාන්‍ය ජනතාව අතර සිදුවන ඕනෑම හා සියලුම ආකාරයේ සන්නිවේදනයන් ජාතික ආරක්ෂාවට ඇති බලපෑම පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගරුත්වය හා සදාචාරය ආරක්ෂා වන පරිදි සිදු කළ යුතු අතර එවැනි සියලුම ආකාරයේ සන්නිවේදනයන්ගේ අන්තර්ගතය හා හඬ හැසිරවීම, ශ්‍රී ලංකා ගුවන්හමුදාධිපතිගේ ඍජු විෂය පථයට ගැනෙන අධිකාරියක් විසින් පරීක්ෂාවට ලක් කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතුය.

ඟ. **විනයාරක්ෂක අංශය**

<u>හැඳින්වීම</u>. ශ්‍රී ලංකා ගුවන් හමුදා පොලිසිය, ගුවන් හමුදාව තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහ ඉහළ විනයක් පවත්වා ගෙන යාමට මූලිකවම වගකියනු ලැබේ. විශේෂ පුද්ගලයින් සඳහා යතුරුපැදි වලින් ගමන්ගන්නා පරිවාර ආරක්ෂකයින් ලබා දීම ,ගුවන් හමුදා උත්තමාචාර පෙළපාලි, පිරිස් පාලනය හා රථවාහන පාලනය ආදී සම්මානනීය අවස්ථා රාජකාරීන් සිදු කිරීම, පොලිස් නිලධාරියකු විසින් සිදු කරනු ලබන ප්‍රධාන රාජකාරීන්ගෙන් කිහිපයකි.

ත. **ප්‍රසාංගික කළා අංශය**

හැඳින්වීම. ජාතික වශයෙන් සහ සංවිධානයක් වශයෙන් උත්සව සහ විනෝදාස්වාදය සැපයීමේ අවශ්‍යතාව, සපුරාලීම මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවයේ නියුක්ත සහ විශ්‍රාමික පුද්ගලයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ සුභසාධනය සඳහා විනෝදාස්වාදය සැපයීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඇති එකම ආයතනය ප්‍රසාංගික කළා අධ්‍යක්ෂකය වේ. රට තුළ ඇති කීර්තිමත් ප්‍රසාංගික ආයතනයක් ලෙස ස්ථාපිත ප්‍රසාංගික කළා අංශය සංවිධානයේ ප්‍රධාන ආදායම් උත්පාදක අංශය ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදායම ශක්තිමත් කරයි.

ථ. **සිවිල් පරිපාලන අංශය**

හැඳින්වීම. විවිධ අධ්‍යක්ෂකයන් යටතට ගැනෙන විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සිවිල් සේවකයින් ලබා දීම සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය විසින් සිදු කරනු ලබයි. කාර්යක්ෂම පරිපාලනයක් සඳහා සහ සිවිල් සේවකයින්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහාද මෙම අධ්‍යක්ෂකය ගුවන්හමුදාධිපතිට වගකියනු ලබයි.

ද. **මූල්‍ය අංශය**

හැඳින්වීම. මුදල් අධ්‍යක්ෂකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ක්‍රියාකාරකම් රාජ්‍ය භාණ්ඩාගාරය හා සම්බන්ධ වෙමින් කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. අයවැය ගත සියලු වියදම් සඳහා පවතින දැවශීලතාවය තහවුරු කර ගැනීම හා අදාළ වියදම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දීම මෙම අධ්‍යක්ෂකය මඟින් සිදු කරනු ලබයි.

ධ. **දන්ත වෛද්‍ය සේවා අංශය**

හැඳින්වීම. රෝග වැළැක්වීමේ හා සුව කිරීමේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවක් ලෙස දන්ත වෛද්‍ය සේවය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් හා ව්‍යක්තිමය අයුරින් ලඟා කරගත හැකි විය යුතුය. දන්ත වෛද්‍ය සේවා කාර්යාලය තම සේවාවන් සියලුම ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතන වෙත ව්‍යාප්ත කරන අතරම දන්ත වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය නිරතුරුවම වැඩි දියුණු කිරීමට ක්‍රියාකරමින් සිටියි.

න. **අභ්‍යන්තර විගණන අංශය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මඟින් දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය 2011 වර්ෂයේදී ස්ථාපිත කරන ලදි. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය (සේවා) ගුවන්හමුදාධිපතිට සෘජුව වගකියන අංශයක් වන අතර "විධායක අභ්‍යන්තර විගණක" යටතේ පාලනය වේ. රජයේ සිවිල් නිලධාරියෙකු ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) ලෙස පත්කිරීමෙන් පසු 2017 වර්ෂයේදී මෙම පත්කිරීම "විධායක අභ්‍යන්තර විගණක (සේවා)" ලෙස නම් කරන ලදි. ඉහත කරුණු වලට අමතරව ශ්‍රී ලංකා ගුවන් හමුදා සංවිධාන ව්‍යුහය වෙනස් කිරීමත් සමඟ විධායක අභ්‍යන්තර විගණක (සේවා) පත් කිරීම 2023 වර්ෂයේදී අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන (සේවා) ලෙස සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන (සිවිල්) ලෙසද ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ප. **තත්ත්ව නීර්ණ නිරීක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ තත්ත්ව නීර්ණ නිරීක්ෂණ කාර්යයන් ඉටු කිරීම සඳහා තත්ත්ව නීර්ණ නිරීක්ෂණ කාර්යාලය පිහිටුවා ඇත. මෙහි ප්‍රධානියා ලෙස අධ්‍යක්ෂ තත්ත්ව නීර්ණ නිරීක්ෂක නිලධාරියා (DQA) කටයුතු කරයි. ඔහු තත්ත්ව නිරීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් ඒකකයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සෘජුවම ගුවන් හමුදාධිපතිට වග කියනු ලබයි.

එ. **විදේශ සබඳතා අංශය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ විදේශ සබඳතා අංශය 2014 සැප්තැම්බර් 01 වන දින සිය කාර්යය ආරම්භ කරන ලදී. මධ්‍යම අප්‍රිකානු ජනරජයේ මෙහෙයුම් හයක් සාර්ථකව සිදු කර ඇති අතර දකුණු සුඩානයේ මෙහෙයුම් පහක් සාර්ථකව සිදු කර ඇත. ගුවන්හමුදාපති යටතේ ඇති ගුවන් හමුදා මූලස්ථානයේ විදේශ කටයුතු අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ සියලුම විදේශ දූත මණ්ඩල මෙහෙයුම් සිදු කරන ලදී.

ඛ. **ගුවන් ආරක්ෂණ පරීක්ෂක අංශය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර ආරක්ෂණ සංවිධානයේ ප්‍රධානත්වය දරනු ලබන්නේ අධ්‍යක්ෂ පියාසර ආරක්ෂාව විසින් වන අතර ඔහු ගුවන් ආරක්ෂන පරීක්ෂක හි විෂය පථය යටතේ වන සියලුම කාර්යයන් සඳහා ගුවන් හමුදාපතිවරයාට වගකිව යුතු පියාසර ආරක්ෂක පරීක්ෂකයේ ප්‍රධානියා වේ. පියාසර ආරක්ෂාව පිළිබඳ පියාසර සහ ඉංජිනේරු අංශයන් හැසිරවීමට මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙක් සිටිති.

ඟ. **ප්‍රධාන බඳවා ගැනීමේ කාර්යාලය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය සහ ස්වේච්ඡා නිලධාරීන්, නිලධාරිනියන්, ගුවන් භටයින් සහ ගුවන් කාන්තාවන් සඳහා පවතින පුරප්පාඩු ගුවන් හමුදාපතිවරයා විසින් බලය පවරන ලද විට සම්පූර්ණ කිරීම සඳහා ප්‍රධාන බඳවා ගැනීමේ කාර්යාලයේ කාර්යභාරය සහ වගකීම යොමු කෙරේ.

ච. **කෘෂි ඒකකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදා කෘෂි ඒකකය පිහිටුවා ඇත්තේ කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදනය හා වාණිජ ව්‍යාපාර වල උන්නතිය හා සම්බන්ධීකරණය සඳහා මෙන්ම ගුවන් හමුදාවේ සියලුම සේවා හා සිවිල් කාර්ය මණ්ඩලය වෙත තම ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහාය.

ඡ. **ශ්‍රීලංගුහ සුභසාධන ව්‍යාපෘති ඒකකය**

හැඳින්වීම. සුභසාධන පියවරක් ලෙස ගුවන් හමුදා සාමාජිකයින්ගේ පරිභෝජනය සඳහා සහන මිලට සියලුම අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය සැපයීම සඳහා ගුවන් හමුදා සුභසාධන ව්‍යාපෘති ඒකකය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදා සුභසාධන ව්‍යාපෘති ඒකකයේ මෙහෙයුම් කාර්යයන් ලෙස බාහිර ආයතනයන්ගෙන් පාරිභෝජ්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයෙන් ප්‍රසම්පාදනය කිරීම, එම භාණ්ඩ ගබඩා කිරීම හා දීපව්‍යාප්තව පිහිටි ශ්‍රීලංගුහ ආයතනයන් වෙත ඒවා බෙදා හැරීම ආදී සැලකිය යුතු මට්ටමේ ගණුදෙනු සිදු කරනු ලබයි.

ය. **මූලික සුබසාධන ව්‍යාපෘති ඒකකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන කාර්යයන් වලට අවශ්‍ය ගල් වැලි සැපයීම සඳහා අධ්‍යක්ෂක මූලික සුබසාධන නිළධාරී යටතේ මූලික සුබසාධන ව්‍යාපෘති ඒකකය පිහිටුවා ඇත. ඉදිකිරීම් සඳහා අවශ්‍ය කළුගල් ඉල්ලුම සපුරා ගැනීම සඳහා තෝරාගත් ප්‍රදේශ වල ගල්වලවල් ආරම්භ කිරීම සඳහා වන වගකීම ගුවන් හමුදාව වෙත පවරා ඇත. සංවර්ධන කටයුතු වලට අමතරව යුධමය ඉදිකිරීම් සඳහා ත්‍රිවිධ හමුදාව වෙත තම නිෂ්පාදන සැපයීමට ද මෙම ව්‍යාපෘතිය බැඳි සිටියි.

2 වන පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2023 වර්ෂයේදී රට තුළ ඇතිවූ සමාජ හා ආර්ථික අර්බුදය වැනි බාධාවන් අභිබවා පහත පරිදි ප්‍රගතිය සිදුකර ඇත.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
ඉලක්කය-01 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවන් ඉහල නැංවීම හා ශක්තිමත් කිරීම.	(1) මධ්‍යම අප්‍රිකානු ජනරජයේ යොදවා ඇති හෙලිකොප්ටර් යානා මගින් පැය 1,823.21ක් පියාසර කර ඇති අතර මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වලින් ඇමෙරිකානු ඩොලර් 10,654,022.56ක් උපයා ඇත. (2) ආපදා සහය සහ ප්‍රතිචාර මෙහෙයුම් (DART) (එනම් Bambi Bucket මෙහෙයුම්) බෙල් - 212 හෙලිකොප්ටර් යානා මගින් හබරණ වනාන්තරය සහ අත්තලපිටිය ප්‍රදේශ හරහා දෙවරක් සිදු කරන ලදී. (3) පියාසර පැය 240.05ක සමුද්‍ර නිරීක්ෂණ සහ ඔත්තු බැලීමේ මෙහෙයුම් මුහුදු හරහා සිදු කරන ලද අතර නිරීක්ෂණ 34ක් වාර්තා විය. (4) වාණිජ මගී ප්‍රවාහනයේ යෙදීම සඳහා Y-12 IV ගුවන් යානා දෙකක් අත්පත් කර ගැනීම. (5) ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් යානා වාණිජ ගුවන් ගමන් සඳහා යෙදවීමෙන් ඉපැයූ මුළු මුදල රුපියල් 14,621,913.28 කි. (6) MI 17 හෙලිකොප්ටර් දෙකක් සහ Y-12 II ගුවන් යානා දෙකක් දේශීය අළුත්වැඩියාවක් සිදු කිරීමෙන් පියාසර පුහුණුව වැඩි දියුණු කරන ලදී. (7) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රහාරක හැකියාව වැඩි දියුණු කිරීම සඳහා කෆීර් බලඇණිය වැඩිදියුණු කිරීම ක්‍රියාවට නංවා ඇති අතර C12 තත්ත්වයට යාවත්කාලීන කිරීමට අනුකූලව Kfir C2/C7 බහුවිධ ජෙට් ගුවන් යානා 5ක ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම්වලින් ආසන්න වශයෙන් 90%ක් පමණ සම්පූර්ණ කර ඇත. (8) ගුවන් ආරක්ෂක අණ සහ පාලන මධ්‍යස්ථානයෙහි (ADC&CC) අඛණ්ඩ මෙහෙයුම් හැකියාවට සහය දැක්වීම සහ වැඩිදියුණු කිරීම සඳහා ගුවන් ආරක්ෂක අණ සහ පාලන මධ්‍යස්ථානයේ අකුණු ආරක්ෂණ පද්ධතිය සම්පූර්ණ කරන ලදී. (9) නව Y-12 IV ගුවන් යානා දෙකක් ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් යානා ඇණියට ඇතුළත් කිරීමෙන් සැහැල්ලු මධ්‍යම ගුවන් ප්‍රවාහන හැකියාව වැඩි දියුණු කරන ලදී. (10) කටුනායක ගුවන්යානා අළුත්වැඩියා පක්ෂාංගයේ දී SFI-783 F-7 GS බහුකාර්ය ජෙට් ගුවන් යානාවල ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙන් ආසන්න වශයෙන් 72% ක් පමණ අවසන් කර ඇත. (11) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් යානා සේවා හැකියාව වැඩි දියුණු කිරීම සඳහා බෙල් හෙලිකොප්ටර් තුනෙහි පැය 1000/5 වසරක සේවා කිරීම සැපයීම සාර්ථකව නිම කර ගුවන් ගමන් සේවාවේ ශක්‍යතාවය ඉහළ නංවන ලදී.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(12) ගුවන් හමුදාවේ ගුවන් යානා සේවා හැකියාව වැඩිදියුණු කිරීම සඳහා බෙල් 412 හෙලිකොප්ටරයක පැය 1000/අවුරුදු 5ක සේවා කිරීම සහ M 171E යානයේ පූර්ණ අළුත්වැඩියාව සාර්ථකව නිම කරන ලදී. (13) කිසිදු බාධාවකින් තොරව ගුවන් හමුදාවේ මූලික පියාසර පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා මූලික පුහුණු ගුවන් යානා වන Cessna 150 ගුවන් යානා පහක් සහ PT6 ගුවන් යානා 6ක් සේවා තත්ත්වයට පත් කර ඇත. (14) බෙල් 206 මූලික හෙලිකොප්ටර් පුහුණුකරු සේවා යෝග්‍ය කර ඇති අතර එමඟින් ගුවන් හමුදාවේ මූලික පියාසර පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ හෙලිකොප්ටර් පුහුණු කිරීමේ හැකියාව නැවත ස්ථාපිත කර ඇත. (15) ගුවන් යානා ඉන්ධන මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති මුළු අයවැයෙන් 92%ක් යොදා ගනිමින් ගුවන් යානා ඉන්ධන සහ ලිහිසි තෙල් සැපයීම මඟින් ගුවන් හමුදාවේ පියාසර මෙහෙයුම් හැකියාවන් ශක්තිමත් කිරීම සහ නංවාලීම සඳහා පුළුල් මෙහෙයුම් සහාය ලබා දීම. (16) ඔවුන්ගේ මෙහෙයුම් හැකියාවන් සහ පුහුණුව සහතික කරමින් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ගුවන් යානා කාර්ය මණ්ඩල ඇදුම් අයිතම ලබා දීම. (17) ගුවන් හමුදාවේ පියාසර ශකයතවන් ශක්තිමත් කිරීම සඳහා නිලධාරීන් 10 දෙනෙකු සහ ගුවන් භටයින් 05 දෙනෙකු සඳහා 2023 දී 20 වැනි මූලික එයාර් ලෝඩ් මාස්ටර් පාඨමාලාව පවත්වන ලදී.
ඉලක්කය-02 අනන්‍ය ආර්ථික කලාපය ද ඇතුලළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික හා උපායශීලී ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් වර්ධනය කිරීම.	(1) මුහුදු හරහා මුහුදු ඔත්තු බැලීමේ මෙහෙයුම් සඳහා පියාසර පැය 240.05ක් සිදු කරන ලද අතර නිරීක්ෂණ 34ක් වාර්තා විය. (2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පර්යේෂණ සහ සංවර්ධන කණ්ඩායම විසින් සංවර්ධනය කරන ලද තත්‍ය කාලීන දත්ත හුවමාරු පද්ධතිය හරහා 4 x INDRA Mk-II රේඩාර් දර්ශන ඒකාබද්ධ කරමින් ගුවන් ආරක්ෂණ අණ හා පාලන මධ්‍යස්ථානයෙහි තීරණ ගැනීමේ හැකියාව වැඩි දියුණු කරන ලදී. (3) Dji Zen muse H20T කැමරාව මිලදී ගත් අතර මෙමඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආවේක්ෂණ හැකියාව වැඩිදියුණු කිරීමට හැකි වී ඇත. (4) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ Indra MK II රේඩාර් හි තත්‍ය කාලීන රේඩාර් දත්ත ලබා ගැනීම පිළිබඳ ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන අරමුදල් සහිත පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය නිම කරන ලද අතර, මීරිගම ගුවන් හමුදා කඳවුරේ ප්‍රධාන ගුවන් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ පද්ධතිය ස්ථාපිත කරන ලදී. (5) සමුද්‍රීය ගුවන් නිරීක්ෂණ මෙහෙයුම් 180කදී ගුවන් නිරීක්ෂණ 70ක් සිදු කරන ලදී. (6) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමුද්‍රීය නිරීක්ෂණ හැකියාව නැවත ස්ථාපිත කිරීම සඳහා SMR-843 B-200 ගුවන් යානය ප්‍රතිසාධනය කර ඇත.
ඉලක්කය-03 ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු පිළිබඳ ඒකකය පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් හඳුන්වාදීම.	(1) ඩ්‍රෝන අවි 02ක්, ඩ්‍රෝන ජැමර්ස් 04ක් අත්පත් කර ගැනීමෙන් ඉලෙක්ට්‍රොනික යුධ හැකියාවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ වැඩි දියුණු කර ඇත.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(2) ගුවන් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයහි (ADOC) මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරමින් පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් සංවර්ධනය කර ගුවන් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත ඒකාබද්ධ කරන ලද INDRA Mk-II රේඩාර් පද්ධතිය
ඉලක්කය-04 අත්‍යවශ්‍ය ගුවන් වත්කම්, ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් ආරක්ෂාවක් ලබාදීම සහ VAs සහ VPs සඳහා ආරක්ෂාව සැපයීම.	(1) පහත සඳහන් අත්පත් කර ගැනීම හරහා අවධානමකට ලක්විය හැකි ප්‍රදේශ සහ අවධානමකට ලක්විය හැකි ස්ථාන සඳහා අත්‍යවශ්‍ය ගුවන් වත්කම්, ස්ථාපනයන් සහ ආරක්ෂාව සඳහා බල ආරක්ෂණය වැඩි දියුණු කරන ලදී. අ. මි.මී.7.62 Emtan MZ 47 රයිෆල් 40ක් අත්පත් කර ගැනීම. ආ. මි.මී 9 CZ scorpion EVO 3 A1 CAL රයිෆල් 40ක් අත්පත් කර ගැනීම. ඇ. මි.මී.7.62 CH 212 බෝල 1,500.000ක්, මි.මී.7.62 CH 216 හිස් 500,000ක් සහ මි.මී 9 බෝල පතොරම් 250,000ක් අත්පත් කර ගැනීම. ඈ. මි.මී 9 CZ P10 M පිස්තෝල 75ක් අත්පත් කර ගැනීම ඉ. මි.මී 23 Zu පතොරම් 3000ක් අත්පත් කර ගැනීම.
ඉලක්කය-05 දිවා/ රාත්‍රී/ සියලු කාලගුණික තත්ත්වයන් තුළ මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවනපථ වැඩිදියුණු කිරීම්.	(1) පුළුල් ගිනි ආවරණයක් ලබා දීම සඳහා අභ්‍යන්තර ගුවන් යානා ක්‍රියාකරුවන් ඔවුන්ගේ ගිනි වැළැක්වීමේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවන භටයින් සමඟ නුවමාරු කරගැනීමට පෙළඹවීම. (2) ශ්‍රීලංගුහ පාලවි කඳවුර, ශ්‍රීලංගුහ කොළඹ කඳවුර, ශ්‍රීලංගුහ කොග්ගල කඳවුර සහ ශ්‍රීලංගුහ මුලතිව් කඳවුරු වල ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සම්මත උපකරණ වන ඩිජිටල් බැරෝමීටරය, ඩිජිටල් උෂ්ණත්වමාන, ඩිජිටල් බිත්ති ඔරලෝසු සහ ගුවන් තොටුපළ බීකන් බල්බ සමඟ ගුවන් ගමන් පාලන (ATC) කුළුණු වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්යානා පාලනය කිරීමේ හැකියාව වැඩි දියුණු කරන ලදී. (3) වායු ක්ෂේත්‍ර සඳහා උපාංග සහිත ජලීය පටල සාදන පෙණ, CO2 - දුරේක්ෂ ලාන්ස් ඇප්ලිකේටර් ලබා දීමෙන් ගිනි නිවීම් සේවා වැඩි දියුණු කිරීම. (4) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) හි රෙගුලාසිවලට අනුව ගුවන් යානා සලකුණු ප්‍රමිතිගත කිරීම මගින් ගුවන් සංචලන පහසුකම් ගුවන් යානා සහ හෙලිපැඩ් වැඩිදියුණු කිරීම
ඉලක්කය-06 මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේදී නිදහස තහවුරු කිරීම හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/ අයථා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම.	(1) දැනට සිටින ශ්‍රීලංගුහ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයේහි (Cyber Operation Center) පුද්ගලයින්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර උසස් සයිබර් පුහුණු කිරීම් සහ අනවසරයෙන් ඇතුළුවීමේ හැකියාව පිළිබඳ තරඟ පැවැත්වීම. (2) සයිබර් තර්ජන සහ සයිබර් අවකාශයේ තර්ජන වලට මුහුණ දීම සඳහා දැනට පවතින විශේෂ සයිබර් ආරක්ෂණ කණ්ඩායම ප්‍රතිව්‍යුහගත කිරීම. (3) සේවාදායකය දැඩි කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම. (4) ගුවන් හමුදා ආයතනවල දත්ත මධ්‍යස්ථාන විගණනය සහ තොරතුරු තාක්ෂණ විගණන පැවැත්වීම. (5) අභ්‍යන්තර ස්වයංක්‍රීය පද්ධති සහ මොඩියුලවල අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම. (6) ශ්‍රී ලංගුහ වෙබ් අඩවි අතථ්‍ය වේදිකාවකට සංක්‍රමණය කිරීම.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(7) ශ්‍රී ලංගුහ නිල වෙබ් අඩවිය සඳහා cloud මත පදනම් වූ ආරක්ෂණ වේදිකාවක් යෙදවීම.
ඉලක්කය-07 අමතර සුභසාධන කටයුතු ඇති කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ප්‍රවාසතාව අවම කිරීම හා ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම.	(1) පවුලේ අය සමඟ සිටීමට වැඩි අවස්ථාවක් ලබා දීම හේතුවෙන්, වාර්ෂික ස්ථාන මාරු කාලසටහන්ගත කිරීමේදී සේවා පුද්ගලයින් විසින් ඉල්ලා සිටින ස්ථාන මාරු තේරීම්වලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. (2) පරිපාලන අධ්‍යක්ෂකයේ විෂයයන් යටතේ පවතින අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (HRMIS) සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. (3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අදාළ මානව සම්පත් හිඟය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුද්ගලයින් සඳහා වන කාර්යභාරය අවම කිරීම සඳහා පුද්ගල සිදුවීම් වාර්තාව (POR) සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් හඳුන්වා දී ඇත. (4) ඔවුන්ගේ විෂයට සුදුසු මෘදුකාංග වැඩසටහන් සංවර්ධනය කිරීමට පෙළඹවීම සහ අවස්ථාව ලබා දීම. (5) ප්‍රකාශිත අරමුණු සපුරාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින් විශ්‍රාම යාමට පෙර ගිනි නිවීම් පුහුණු පාඨමාලා දෙකක් සහ උපස්ථායක පුහුණු පාඨමාලා දෙකක් වැනි පුනරුත්ථාපන පාඨමාලා පවත්වනු ලැබේ. (6) ශ්‍රී ලංකා ගුවන් හමුදා පුහුණු ආයතනවල සියලුම පුහුණු පාඨමාලාවල පවත්වනු ලබන පාඩම් මධ්‍යගත කිරීම සහ ප්‍රමිතිගත කිරීම සඳහා අලුතින් නිර්මාණය කරන ලද ක්‍රියාවලියක් වන පුහුණු කළමනාකරණ පද්ධතියේ (TMS) වැඩසටහන පරීක්ෂා කර ක්‍රියාත්මක කෙරේ. (7) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මානව සම්පත් ප්‍රමිතිගත කිරීම සහ ඉහළ නැංවීමේ අරමුණින් සියලුම ශාඛා/ වෘත්තීන් නියෝජනය කරන නිලධාරීන්ට සහ සෙසු නිලයින් සඳහා දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා අනෙකුත් රටවල් වල ගුවන් හමුදාවල මානව සම්පත්වලට සමානව ස්ථානගත කිරීම සඳහා සපයනු ලැබේ. (8) විශේෂිත පුහුණු වැඩසටහන් සඳහා උපක්‍රමශීලීව ආයෝජනය කිරීමෙන් සහ සහන සත්කාර හෙද, ඖෂධාලය, ජෙව වෛද්‍ය තාක්ෂණය සහ හෙද සේවාව වැනි තීරණාත්මක ක්ෂේත්‍රවල කාර්ය මණ්ඩල මට්ටම් පුළුල් කිරීමෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෛද්‍ය ශ්‍රම බලකායේ විශේෂඥතාව, හැකියාවන් සහ ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස ඉහළ නංවා ඇත්තෙමු. (9) ගුවන් හමුදා රෝහල්වල නව වෛද්‍ය උපදේශන සායන හඳුන්වා දෙන ලදී. දැවැන්ත මූල්‍ය සහනයක් ලබා දෙමින් සෑම පුද්ගලයෙකුගේම පුද්ගලික වියදම් අඩු කිරීමට එම සායන සෘජුවම දායක විය. (10) විශ්‍රාමික ගුවන් හමුදා සාමාජිකයින් සඳහා රැකියා බැංකුවක් පවත්වාගෙන යනු ලැබේ. (11) වෛද්‍ය ආධාර ලෙස ක්‍රියාන්විතයේදී මිය ගිය (DIA) පුද්ගලයින් සඳහා එක් කෘතිම ඇසක්, කෘතිම අත් පා දෙකක්, රෝද පුටු හතරක් සහ කිහිලිකරු දෙකක් වැනි පරිත්‍යාග කරන ලදී. (12) වැඩිදියුණු කළ ප්‍රවේශ්‍යතාව සහ උසස් තාක්ෂණය හඳුන්වාදීම මඟින් උසස් දන්ත වෛද්‍ය පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම තුළින්

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් සඳහා දන්ත වෛද්‍ය සේවාවන් සපයනු ලැබේ. (13) ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරු සහ කඳවුරු වල සුභසාධන පහසුකම් සඳහා අවශ්‍ය වන රුපියල් 4,311,151.6 ක වටිනාකමකින් යුත් ගෘහ භාණ්ඩ මිලදී ගැනීමෙන් ගුවන් හමුදා සාමාජිකයින්ගේ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම. (14) ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරු සහ කඳවුරු වලට අවශ්‍ය වන 10,399,175.00ක් වටිනා ගෘහභාණ්ඩ මිලදී ගැනීමෙන් වැඩ කරන පරිසරය වැඩිදියුණු කර නඟා සිටුවීම. (15) කඩදාසි නාස්තිය සැලකිය යුතු ලෙස අවම කිරීම මගින් ටෙන්ඩර් ලිපි මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවය ඉවත් කරන උපකරණ සැපයීම සහ ගිණුම්කරණ පද්ධතියේ (EPAS) නවීකරණයක් ක්‍රියාත්මක කරන ලදී. තවද, මෙම වෙනස් කිරීම සුහුරු උපාංග හරහා ටෙන්ඩර් ලේඛන වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසයි. (16) ප්‍රාදේශීය මිලදී ගැනිම්/ සුළු වටිනාකම් සහිත මිලදී ගැනිම් (RPC/SVP) මිලදී ගැනීම් සඳහා ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතියක් (අරමුදල් නුවමාරු ක්‍රමය) ක්‍රියාවට නංවා ඇති අතර එය ගෙවීම් කාර්යක්ෂමතාව වැඩි කරයි. (17) වෙබ් පාදක ගුවන් මෙහෙයුම් ලේඛන කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීමෙන් ගුවන් ගමන් නිෂ්කාශන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සහ ගුවන් හමුදාවේ කාල ප්‍රමාදය අවම කිරීම. (18) ගුවන් හමුදා ගුවන් ගමනාගමන සේවාවන්හි වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම සඳහා ගුවන් ගමනාගමන පාලකවරුන්ගේ වර්ගීකරණ පද්ධතිය ගුවන් හමුදාව වෙත හඳුන්වා දෙන ලදී.
ඉලක්කය-08 ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තීකරණය	(1) මධ්‍යම අප්‍රිකානු ජනරජයේ යොදවා ඇති හෙලිකොප්ටර් යානා මගින් පැය 1,823.21ක් පියාසර කර ඇත. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වලින් ඇමරිකානු ඩොලර් 10,654,022.56ක් උපයා ඇත. (2) රු. 14,621,913.28 මුළු මුදලක් ගුවන් හමුදා ගුවන් යානා වාණිජ ගුවන් ගමන් පැවැත්වීමෙන් උපයා ඇත. (3) බෙල් - 212 හෙලිකොප්ටර් යානා මගින් හබරණ වනාන්තරය සහ අත්තලපිටිය ප්‍රදේශවල දෙවරක් බැම්බි බකට් මෙහෙයුම් සිදු කරන ලදී. (4) ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ හා ගලවා ගැනීමේ සේවය මගින් පහත සඳහන් වන බිම්වල ඇති වූ ස්වභාවික ගිනි විපත් මැඩ පැවැත්වීමට සහභාගී විය. අ. 2023 ජූලි 22 වන දින හිඟුරුගමුවේ ඇතිවූ ගින්න. ආ. 2023 ජූලි 23 වන දින ඇල්ල අත්තලපිටියේ ඇතිවූ ගින්න. ඇ. 2023 අගෝස්තු 10 වන දින අම්පාර ප්‍රදේශයේ ඇතිවූ ගින්න. ඈ. 2023 අගෝස්තු 14 වන දින තනම්පරිච්චාන්හි ඇතිවූ ගින්න. (5) පියාසර පැය 240.05ක සමුද්‍ර නිරීක්ෂණ සහ ඔත්තු බැලීමේ මෙහෙයුම් මුහුදු හරහා සිදු කරන ලද අතර නිරීක්ෂණ 34ක් වාර්තා විය. (6) වාණිජ මගී ප්‍රවාහනයේ යෙදීම සඳහා Y-12 IV ගුවන් යානා දෙකක් අත්පත් කර ගැනීම.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(7) ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ නඟා සිටුවීම. (8) රෝහල් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම. (9) ජාතිය ගොඩනැගීමේ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා භටයින් යොදවා ගැනීම පහත පරිදි වේ. අ. DHQC අකුරේගොඩ ව්‍යාපෘතිය. ආ. මහියංගනය ගඩොල් ව්‍යාපෘතය. ඇ. නීලගිරි මහා සෑයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය. ඈ. සඳහිරුසෑය ව්‍යාපෘතිය. (10) ශ්‍රී ලංකා ගුවන් හමුදාව රටේ ආපදා තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා පැය 24/7 පදනමින් සියලුම ගුවන් හමුදා ආයතනවල ආපදා සහය සහ ප්‍රතිචාර කණ්ඩායම් (DART) පවත්වාගෙන යයි. මීට අමතරව, ඕනෑම හදිසි අවස්ථාවකට සහය වීම සඳහා කොළඹ, හම්බන්තොට සහ පුත්තලම දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන තුනක් පැය 24/7ම සේවයේ යොදවා ඇත. (11) ජාතීන්ගේ ආපදාවන්ට මුහුණ දීමේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ජපාන ආසියා පැසිෆික් සන්ධානය සමග ජපාන ආසියා ශාන්තිකර සන්ධානය (APAD) සහයෝගීතාවයෙන් 2023 ජූලි 12 සිට ජූලි 20 දක්වා චීන වරාය ශ්‍රී ලංගුහ විද්‍යාපීඨයේ පවත්වන ලද ජාත්‍යන්තර කඩිනම් ජල සෝදිසි සහ ගලවා ගැනීමේ පුහුණුව. (12) 2023 ඔක්තෝබර් 24 වන දින, කොළඹ ලිබර්ටි ප්ලාසා අසල ධාවනය වන බස් රථයකට ගසක් කඩා වැටීමෙන් තුවාල ලැබූ පුද්ගලයින් ඉවත් කිරීම සඳහා මානුෂීය ආධාර සහ ආපදා සහන (HADR) මෙහෙයුමක් ආරම්භ කරන ලදී. (13) 2023 ඔක්තෝම්බර් 24 වන දින දියතලාව බොරලන්ද පාරේ සිදුවූ ස්වභාවික විපතට (නායයෑම) ප්‍රතිචාර දක්වන ලදි. (14) 2023 ඔක්තෝම්බර් 27 වන දින කොළඹ 2 වන හරස් වීදියේදී ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කර පුද්ගලයින් 22 දෙනෙකු බේරා ගන්නා ලදී. (15) 2023 නොවැම්බර් 09 වන දින අම්පාර - නවගම්පුර කර්මාන්ත ශාලාවේ ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කරන ලදී. (16) 2023 දෙසැම්බර් 26 වන දින කොළඹ ආමර් වීදියේ ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කරන ලදී. (17) රසායනික, ජෛව, විකිරණ සහ න්‍යෂ්ටික පුපුරණ ද්‍රව්‍ය වලින් තර්ජනවලට ගොදුරු විය හැකි රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ CBRNE පක්ෂාංගය ක්‍රියාකාරීව සම්බන්ධ වේ. මීට අමතරව, ඉහත සඳහන් ආයතනවල වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා බාහිර ආයතන, සහෝදර සේවා සහ පොලිසිය වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර, ඕනෑම ආකාරයක CBRNE තර්ජනවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ව යොමු කිරීම. තවද, CBRNE අංශයේ ශක්තිය වැඩිදියුණු කිරීම සඳහා 2023 වර්ෂය තුළ CBRNE පාඨමාලා තුනක් පවත්වන ලදී. (18) ගංගාරාම විහාරස්ථානයේ මහා පෙරහැර සහ බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ මහා පෙරහැර පැවැත්වීම සඳහා සහාය ලබා දෙන ලදී.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(19) බුද්ධ රශ්මි වෙසක් උත්සවය, පුත්තලම, කැබෙල්ලාව ශ්‍රී රත්න ශ්‍රී පිරිවෙන් විහාරස්ථානයේ ජාතික වෙසක් උත්සවය සහ බෞද්ධාලෝක වෙසක් කලාපය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය සහ ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය සහාය ලබා දෙන ලදී. (20) ආරක්ෂක අමාත්‍යාංශය සහ අනෙකුත් සහෝදර සේවාවන් සම්බන්ධ කර ගනිමින් සඳහිරු සෑය අභියස පැවති ජය පිරිත සජ්ඣායනා මහෝත්සවය පැවැත්වීම සඳහා සහය ලබා දෙන ලදී. (21) දීඝවාපිය සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදී. (22) ශ්‍රී පාදය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2023 මාර්තු මාසයේදී පවත්වන ලදී. (23) කටුනායක ගුවන් හමුදා කඳවුරු පාසලේ පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ 1 වන සහ 2 වන අදියරයන් මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කර ඇත. (24) රට තුළ මත්ද්‍රව්‍ය උවදුර මැඩපැවැත්වීම සඳහා, සිවිල් පොලිසිය සහ අනෙකුත් සහායක ආයතන සමඟ සහයෝගයෙන් ගුවන් හමුදාව විසින් මෙහෙයුම් 197ක් සිදු කරන ලද අතර, සැකකරුවන් 245ක් අත්අඩංගුවට ගැනීමට හැකිවිය. (25) අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් සිදුකළ සාර්ථක මෙහෙයුම් 32කින් වැලි ගොඩදැමීම, වන විනාශය වැනි නීති විරෝධී ක්‍රියාවල නිරත වූ පුද්ගලයන් 43 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. (26) අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් සිදුකළ සාර්ථක මෙහෙයුම් 54කදී නීතිවිරෝධී ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි පුද්ගලයින් 51 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.
<u>ඉලක්කය-09</u> කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා වෘත්තීමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට	(1) ශ්‍රී ලංගුහ මූලස්ථානය විසින් පත් කරන ලද විශේෂිත නිලධාරීන්ගෙන් සමන්විත ස්වාධීන මණ්ඩල මගින් බොහෝ විෂයමාලා සමාලෝචනය කර ඇත. (2) ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ එක්ව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය ලබා ගැනීමෙන් වෛද්‍ය නිලධාරීන් සඳහා වෘත්තීය පිළිගැනීමක් ලබා ගන්නා ලදී. (3) මෙහෙයුම් ගුවන් නිලධාරීන්ගේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම සහ ජාතික ගුවන් ආරක්ෂක පද්ධතියේ මෙහෙයුම් හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රහාරක පාලකවරුන්ගේ මූලික පුහුණුව පවත්වන ලදී.
<u>ඉලක්කය-10</u> නව තාක්ෂණය හඳුන්වාදීම හා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.	(1) වැඩිදුර කටයුතු සඳහා අවශ්‍යතා විශ්ලේෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම සිදු වෙමින් පවතී. (2) නිසි ප්‍රමාණයේ ශක්තිමත් සහ දක්ෂ බලකායක් පවත්වා ගැනීම සඳහා, ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාමගෙන පිටවන සේවා පුද්ගලයින් අතරින් 2023 වසර සඳහා ශිෂ්‍යභටයින් 75ක් සහ ගුවන් භටයින් 1,234ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය මගින් අවසර ලබා දී ඇත. (3) 2023 වර්ෂය තුළ සෘජු බඳවාගැනීම් මගින් නිලධාරීන්, කැඩෙට් නිලධාරීන් සහ කැඩෙට් නිලධාරිනියන් 61 දෙනෙකු බඳවා ගන්නා ලදී. මීට අමතරව, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කැඩෙට් නිලධාරීන් සහ කැඩෙට් නිලධාරිනියන් 74

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	දෙනෙකු ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගනිමින්, 2023 දී බඳවා ගත් මුළු නිලධාරීන් සංඛ්‍යාව 135 දක්වා ගෙන එන ලදී. (4) තවද, 2023 වර්ෂය තුළ ගුවන් භටයින් 1,175ක් බඳවා ගන්නා ලදී.
ඉලක්කය 11 නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් ශ්‍රීලංගුහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තත්ත්වය පිළිබඳ දැනුවත්වීම වැඩි දියුණු කිරීම.	(1) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දත්ත ජාලයේ ඉහළ පවත්වාගැනීම වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා පුනරාවර්තන මධ්‍යස්ථාන සඳහා පැය 3ක බැටරි උපස්ථයක් සහිත 2KVA මාර්ගගත UPS ස්ථාපනය කිරීම. (2) දත්ත සහ හඬ සන්නිවේදන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කටුනායක ගුවන් හමුදා කඳවුරේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා නව ෆයිබර් ඔප්ටික් කේබල් එලීම. (3) අවස්ථානුකූලව දැනුවත් කිරීම සඳහා නිරීක්ෂණ සහ ඔත්තු බැලීමේ අරමුණින් අසාමාන්‍යතා හඳුනාගැනීමේ පද්ධතියට ඩ්‍රෝනයානා ඇතුළත් කිරීම. (නියමු ව්‍යාපෘතිය රත්මලාන ගුවන් හමුදා කඳවුරේදී ක්‍රියාත්මක කෙරේ) (4) භූ තොරතුරු (Geo informatics) මෙහෙයුම් සඳහා LIDA පද්ධතිය අත්පත් කර ගැනීම.

වගුව - 01

2.1.1 2003 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය

අ. සැලසුම් අධ්‍යක්ෂකය

(1) වර්ෂයේදී නිම කරන ලද ශ්‍රී ලංකා ගුවන් හමුදා පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති පහත පරිදි වේ.

අනු/අංකය	ව්‍යාපෘතියේ නම	උත්පාදකයා	අධ්‍යක්ෂකය
01	AN-32B ගුවන්යානා එන්ජින් ඔයිල් මික්සර්	අංක 2 බලසෙණය	ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය
02	AN-32B ගුවන්යානා සඳහා ප්‍රධාන ගොඩබෑමේ ආම්පන්න අගුළු දැමීමේ ආරක්ෂිත උපාංගය		
03	ගලවා ගැනීමේ අයිතම ප්‍රවාහනය සහ පැටවීමේ වේදිකාව නිෂ්පාදනය කිරීම	අංක 6 බලසෙණය	
04	අතේ ගෙන යා හැකි ප්‍රධාන රෝටර් හබ් නඩත්තු කිරීම සහ ප්‍රවාහන වේදිකාව නිෂ්පාදනය කිරීම		
05	ඇඟවුම් සහ සිසිලන පද්ධතිය සහිත අතේ ගෙන යා හැකි හයිඩ්‍රොලික් පරීක්ෂණ - රිග් වේදිකාව නිෂ්පාදනය කිරීම		
06	Bell 206 හෙලිකොප්ටර් සම්ප්‍රේෂණ බිම් හැසිරවීමේ ආධාරකය නිෂ්පාදනය කිරීම	අංක 7 බලසෙණය	
07	බිම ගොඩබෑමේ ආම්පන්න මෙහෙයුම සඳහා B-200 ගුවන්යානා සඳහා වායු පීඩන නියාමකය නිෂ්පාදනය කිරීම	අංක 8 බලසෙණය	
08	ජල සක්‍රීය ආලෝක ඒකක බැටරි පරීක්ෂක සැලසුම් කිරීම සහ සැකසීම	AEW Safety Bay	
09	Bleed Valve Functional Checking Fixture (PT6T Series Engine) සැලසුම් කිරීම සහ සැකසීම	AEW Engine Bay	
10	ට්‍රාන්සිස්ටර පරීක්ෂක	AEW Electrical Bay	
11	උපකරණ පරීක්ෂණ ස්ථාවරය	AEW Instrument Bay	
12	වාහන ගෙනයන ට්‍රේලරය නිෂ්පාදනය කිරීම	MTROW ගුවන් හමුදා මූලික කඳවුර කටුනායක	සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය
13	EOD රොබෝ වාහනය	EOD පුහුණු පාසල පාලවි	
14	සුළං බලයෙන් ජලය පොම්ප කිරීම සහ වාරිමාර්ග පද්ධතිය	පර්යේෂණ සහ සංවර්ධන පක්ෂාංගය මූලික කඳවුර කටුනායක	
15	ලෝහ අනාවරකය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම		
16	අලි වැට සඳහා සුහුරු පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය සහ වැළැක්වීමේ පද්ධතිය	ගුවන් හමුදා කඳවුර මොරවැව	ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය


වගුව - 01

ආ. <u>ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය</u>

(1) පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ/මෙහෙයුම් යටතේ 2023 වර්ෂය තුළ මුළු පියාසර පැය 6,505.50ක් පියාසර කර ඇත.

අනු අංකය	මෙහෙයුම් වර්ගය	පියාසර පැය
01	මෙහෙයුම්	2,835.45
02	පුහුණු	3,017.40
03	විශේෂ පුද්ගල ගුවන් ගමන්	148.55
04	ප්‍රභූ පුද්ගල ගුවන් ගමන්	68.25
05	වාණිජ	17.35
06	පරීක්ෂණ පියාසර කිරීම්	412.00
07	දිවයිනෙන් බැහැරට පියාසර කිරීම්	3.40
08	ආපදා සහන මෙහෙයුම්	3.10
එකතුව		**6,505.50**

වගුව - 02



රූප සටහන - 01

(2) 2023 වර්ෂය තුළ සිදු කරන ලද ගිනි නිවීමේ මෙහෙයුම් පහත දැක්වේ.



(අ) 2023 ජූලි 19 වන දින හබරණ ප්‍රදේශයේ සිදු කරන ලද ගිනි නිවීමේ (බැම්බි) මෙහෙයුම (10 වරක් සිදු කරන ලදී).

(ආ) 2023 ජූලි 23 වන දින ඇල්ල සහ අත්තලපිටිය ප්‍රදේශයේ සිදු කරන ලද ගිනි නිවීමේ (බැම්බි) මෙහෙයුම (07 වරක් සිදු කරන ලදී).



(3) 2023 වර්ෂය තුළ සිදු කරන ලද පියාසර පුහුණු.






(4) ඊට අමතරව, මගීන් 205ක් සහ මුළු භාණ්ඩ කිලෝග්‍රෑම් 21,760ක් අදාළ ගමනාන්ත වෙත ගුවන් මගින් ප්‍රවාහනය කර ඇත.

(5) පසුගිය සය වසර (6) තුළ පියාසර පැය ගණන් සැසඳීම පහත පරිදිය.

මෙහෙයුම් වර්ගය	වර්ෂය					
	2018	2019	2020	2021	2022	2023
මෙහෙයුම්	4,448.40	3,793.25	3,337.85	3,969.50	2,527.30	2,835.45
ඒකාබද්ධ මෙහෙයුම්	112.20	264.45	-	-	-	-
මෙහෙයුම් විදේශීය	2,077.55	2,165.13	2,341.64	-	-	-
පුහුණු	6,412.19	7,890.14	6,868.40	5,757.01	3,122.45	3,017.40
ප්‍රභූ පුද්ගල ගුවන් ගමන්	618.15	641.50	329.85	221.05	131.55	148.55
විශේෂ පුද්ගල ගුවන් ගමන්	220.15	153.05	84.30	131.50	81.58	68.25
වාණිජ	117.50	235.00	35.80	37.50	17.10	17.35
මුහුදින් එතෙර	20.00	-	64.25	67.15	4.00	03.40
වෙනත්	617.40	86.05	-	751.57	412.59	415.10
එකතුව	**14,645.14**	**15,229.37**	**13,062.09**	**10,926.48**	**6,298.17**	**6,505.50**

වගුව - 03



රූප සටහන - 02

(6) ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව පහත ප්‍රසම්පාදනයන් සිදු කරන ලදි.

අනු අංකය	අයිතමයන්	මුදල (ලං.රු.මි)
01	වල්නාශක (ලීටර් 500)	1.2
02	ජලීය පටල පෙණ නඟින පෙන (ලීටර් 1000)	01
03	Mist blower (ඒකක-02)	0.13
04	ඩිජිටල් උෂ්ණත්වමාන (ඒකක-06)	0.24
05	ඩිජිටල් බිත්ති ඔරලෝසු (ඒකක-10)	0.16
06	නැවත ආරෝපණය කළ හැකි විදුලි පහන් - හදිසි විදුලි පහන් (LED) (ඒකක-10)	0.54
07	ගලවා ගැනීමේ කඹය මීටර් 100 (ඒකක-03)	4.30
08	ගිනි නිවන උපකරණ (ඒකක-160)	4.4
09	බීකන් බල්බය (ඒකක-06)	0.93
10	බැටරි (ඒකක-08)	0.26

වගුව - 04

(7) 2023 වර්ෂය තුළ වාණිජ ගුවන් ගමන හරහා උපයාගත් සහ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද ආදායම රුපියල් මිලියන 14.70කි.





ඇ. <u>ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂක</u>

(1) 2023 වසර සඳහා ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව සත්‍ය කාර්ය සාධනය.

යෝජිත ක්‍රියාකාරකම්	අයවැය ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය කාර්ය සාධනය (රුපියල් මිලියන)	නිම කරන ලද භෞතික මට්ටම
වසම තුළ ක්‍රියා කළ හැකි කුඩා බහුකාර්ය කණ්ඩායම් නිර්මාණය කිරීම	21.40	12.38	57.85%
නවීන කවුන්ටර CBRNE උපකරණ ලබා ගැනීම	9.30	1.91	20.53%
සටන් උපකරණ ලබා ගැනීම හරහා හැකියාවන් ගොඩනැගීම	30.00	2.78	9.27%

වගුව - 05

(2) ආපදා කළමනාකරණය සඳහා සහය වීම.

(අ) 2023 ඔක්තෝබර් 24 වන දින, කොළඹ ලිබර්ටි ප්ලාසා අසල ධාවනය වෙමින් තිබූ බස් රථයකට ගසක් කඩා වැටීමෙන් තුවාල ලැබූ පුද්ගලයින් ඉවත් කිරීම සඳහා මානුෂීය ආධාර සහ ආපදා සහන (HADR) මෙහෙයුමක් ආරම්භ කරන ලදී.

(ආ) 2023 ඔක්තෝබර් 24 වන දින දියතලාව බොරලන්ද මාර්ගයේ සිදුවූ ස්වභාවික ව්‍යසනයට (නායයෑම) ප්‍රතිචාර දක්වන් ලදි.

(ඇ) 2023 ඔක්තෝබර් 27 වැනි දින කොළඹ දෙවැනි හරස් වීදියේදී ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුමක් දියත් කර විසිදෙදෙනකු බේරා ගන්නා ලදී.

(ඈ) 2023 නොවැම්බර් 09 වන දින අම්පාර - නවගම්පුර කර්මාන්තශාලාවේ ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුමක් සිදු කරන ලදී.

(ඉ) 2023 දෙසැම්බර් 26 වන දින කොළඹ ආමර් වීදියේ ගිනි හා ගලවා ගැනීමේ මෙහෙයුම සිදු කරන ලදී.

(ඊ) රට පුරා ඇති ආපදා තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සියලුම ගුවන් හමුදා ආයතනවල පැය 24/7 පදනමින් ආපදා සහය සහ ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් (DART) පවත්වාගෙන යයි. මීට අමතරව, ඕනෑම හදිසි අවස්ථාවකට සහය වීම සඳහා කොළඹ, හම්බන්තොට සහ පුත්තලම දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන තුනක් පැය 24/7ම සේවයේ යොදවා ඇත.

ඇ. ගුවන් යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම. 2023 වර්ෂය තුළ ගුවන් යානා සහ අමතර කොටස් ලබා ගැනීම සඳහා රුපියල් 1,663,775,649.33ක් වැය කර ඇත.

(2) අළුත්වැඩියා කිරීම සහ පූර්ණ අළුත්වැඩියා කිරීම.

2023 වර්ෂයේදී ගුවන් යානා අළුත්වැඩියා කිරීම සහ සේවා සැපයීම සඳහා රු. මිලියන 813.89ක් වැය කර ඇත. මෙය ප්‍රධාන සහ ගුවන් යානා පූර්ණ අළුත්වැඩියාව සඳහා රු. මිලියන 807.42ක් සහ මෙවලම් ක්‍රමාංකනය සහ අළුත්වැඩියා කිරීම සහ රේගු ගාස්තු සඳහා රු. මිලියන. 5.61ක් ලෙස වේ.

(3) අංක 01 පියාසර පුහුණු පක්ෂාංගය (FTW) ගුවන් යානා වැඩිදියුණු කිරීම සහ ගුවන් ගමන් වලට අදාළ ක්‍රියාකාරකම්. අංක 01 පියාසර පුහුණු පක්ෂාංගය සතුව PT-6 ගුවන් යානා 12ක්, Cessna-150 ගුවන් යානා 06ක්, K-8 ගුවන් යානා 07ක් ආදී ලෙස ගුවන් යානා 25ක් ඇති අතර මෙම පක්ෂාංගය මගින් 2023 වර්ෂය තුළ විවිධ ගුවන් යානා සේවා කිරීම් සිදු කර ඇත. මෙම පක්ෂාංගය විසින් PT-6 ගුවන් යානා වල පැය 25 සේවා කිරීම් 21ක්, පැය 100 සේවා කිරීම් 01ක්, සහ පැය 400 සේවා කිරීම් 01ක් සහ PT-6 ගුවන් යානාවල විඛාදන පරීක්ෂණ 253ක් සිදු කර ඇත. තවද, Cessna-150 ගුවන් යානාවල පැය 50 සේවා කිරීම් 02ක්, පැය 100 සේවා කිරීම් 02ක්, පැය 200 සේවා කිරීම් 01ක්ද විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 123ක් සහ අතිරේක වාතයට සුදුසු බව පිළිබඳ පරීක්ෂණ 06ක් සිදු කර ඇත. ඊට අමතරව, K-8 ගුවන් යානාවල පැය 50 සේවා කිරීම් 01ක්, පැය 125 සේවා කිරීම් 01ක්, සහ විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 59ක්, සහ 15 NFD සේවා කිරීම් 104ක් සිදු කර ඇත.

(අ) HUOSAI-6A එන්ජින් 07ක් අංක 1 පියාසර පුහුණු පක්ෂාංගය වෙත ලැබීම. PT -6 ගුවන් යානා 07ක් ක්‍රියාකාරී තත්ත්වයට පත් කරමින් අළුත්වැඩියාව සම්පූර්ණ කිරීමෙන් පසු බලඝණයට HUOSAI-6A එන්ජින් හයක් (06) ලැබුණි.



(ආ) අළුත්වැඩියා කරන ලද Cessna එන්ජින් 03ක් ASW හි අළුත්වැඩියා කිරීමෙන් පසු අංක 1 පියාසර පුහුණු පක්ෂාංගය (FTW) වෙත ලැබීම - ගුවන්යානා තුනක් (03) ක්‍රියාකාරී තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය කිරීමට හැකි වන පරිදි බලඝණයට Cessna තුනක් (03) ලැබුණි.

(ඇ) අංක 1 පියාසර පුහුණු පක්ෂාංගය වෙත K-8 ගුවන් යානා ඉජෙක්ෂන් ආසන කාට්රිජ් (ejection seat) ලැබීම - K-8 ගුවන් යානා දෙකක් සේවා කළ හැකි තත්ත්වයට ප්‍රතිසංස්කරණය කරමින් අංක පියාසර පුහුණු පක්ෂාංගය වෙත K-8 ගුවන් යානා ඉජෙක්ෂන් ආසන කාට්රිජ් ලැබුණි.

(4) අංක 2 බලඝණය ගුවන් යානා බල ඇණිය සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය

අංක 2 බලඝණය සතුව AN-32B යානා 04ක් සහ C-130 යානා 02ක් ඇතුළුව සමස්ත ගුවන් යානා 06ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. AN-32B ගුවන් යානය සඳහා පැය 300 සේවා කිරීම් 03ක් සහ සහ පැය 600 සේවා කිරීම් 03ක් සිදු කර ඇත.

(අ) AN-32B ගුවන් යානය සඳහා භාවිතා කළ යුතු එන්ජින් ඔයිල් මිශ්‍ර කරත්තය නිපදවීමේ ක්‍රියාවලියක් සම්පූර්ණ කිරීම.



(ආ) AN-32B ගුවන් යානා සඳහා ප්‍රධාන ගොඩබෑමේ ආම්පන්න අගුළු දැමීමේ ආරක්ෂිත උපාංගය නිෂ්පාදනය අවසන් කිරීම.



(5) <u>අංක 3 සමුද්‍රීය සේවා බළඝණය - ගුවන් යානා ඇණිය සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය</u>


අංක 3 බළඝණය සතුව බීච් (Beech) 200 යානා 01ක් සහ ඩොනියර් (Dornier) - 228 යානා 01ක් ඇතුළුව සමස්ත ගුවන්යානා 02ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. බලඝණය දින 07 සේවා කිරීම් 45ක්, විඛාදන පරීක්ෂණ සේවා 12ක් සමඟ කටයුතු කර ඇත. B-200 ගුවන් යානාවල අදියර I සහ II අදියර සේවා 01ක් සිදු කර ඇත. තවද, එය ඩෝනියර්-228 ගුවන් යානා සම්බන්ධයෙන් දින 07 සේවා කිරීම් 17ක්, දින 14 සේවා කිරීම් 09ක්, දින 30 සේවා කිරීම් 04ක්, මාස 02ක සේවා කිරීම් 02ක් සහ මාස 03ක සේවා කිරීම් 01ක් සිදු කර ඇත.

(අ) SMR-846 ඩොනියර් (Dornier) 228 ගුවන් යානය ගුවන් හමුදාවට ඇතුළත් කිරීම - 2023 අගෝස්තු 16 වන දින, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමුද්‍රීය නිරීක්ෂණ කටයුතු සඳහා කැප වූ නව ඩෝනියර්-228 ගුවන් යානයක් අත්පත් කර ගැනීමත් සමඟ සිය සමුද්‍රීය නිරීක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ කැපී පෙනෙන දියුණුවක් සනිටුහන් කරන ලදී.




(6) <u>අංක 04 විශේෂ/ප්‍රභූ පුද්ගල හෙලිකොප්ටර් බලඝණය ශ්‍රීලංගුහ රත්මලාන</u> අංක 4 බලඝණයට බෙල් (Bell) 412 යානා 04ක්, බෙල් (Bell) 412 EP යානා 04ක්, බෙල් (Bell) 212 යානා 01ක් සහ MI-17 යානා 01ක් ඇතුළුව සමස්ත ගුවන් යානා 10ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා සිදු කර ඇත. පැය 25ක සේවා කිරීම් 62ක්, පැය 50ක සේවා කිරීම් 17ක්, පැය 100 සේවා කිරීම් 08ක්, පැය 300 සේවා කිරීම් 06ක්, පැය 600 සේවා කිරීම් 06ක්, බෙල් (Bell) 412 EP හෙලිකොප්ටර් සඳහා විඛාදන පරීක්ෂණ සේවා 03ක්ද සිදු කර ඇත.

(අ) ප්‍රධාන අළුත්වැඩියාව අවසන් කිරීමෙන් පසු SMH 4428 MI 171E හෙලිකොප්ටරය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලැබීම - එහි ප්‍රථම ප්‍රධාන අළුත්වැඩියාව අවසන් වීමෙන් පසුව SMH 4428 MI 171E හෙලිකොප්ටරය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලැබුණි.



(ආ) SUH 523 Bell 412 හෙලිකොප්ටරයේ ART 2000/2100 කාලගුණ රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීම.



(7) <u>අංක 5 ප්‍රහාරක බලඝණ ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනයන්.</u>

අංක 5 ප්‍රහාරක බලඝණය සතුව F-7GS යානා 04ක් ඇතුළුව ගුවන් යානා 04ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. 7 NFD සේවා කිරීම් 28ක්, අංක 30 NFD සේවා කිරීම් 06ක් සහ FT-7BS ගුවන්යානාවල විඛාදන පරීක්ෂණ සේවා 12ක් 7 NFD සේවා කිරීම් 15ක් දින 30 සේවා කිරීම් 06ක් සහ F-7BS ගුවන්යානාවල 7 NFD සේවා කිරීම් 15ක් පැය 30 සේවා කිරීම් 06ක් විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 24ක් බලඝණය නිරත වී ඇත. තවද F-7GS ගුවන්යානා වල දින 10 සේවා කිරීම් 63ක්, මාස 06 සේවා කිරීම් 04ක්, පැය 25/50/100 සේවා කිරීම් 05ක් සහ විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 36ක් සිදු කර ඇත.

(8) <u>අංක 6 බලඝණය ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.</u> අංක 6 බලඝණය සතුව MI-171 ගුවන් යානා 02ක්, MI-171SH ගුවන් යානා 02ක් සහ MI-171E ගුවන් යානා 02ක් ඇතුළුව සමස්ත ගුවන්යානා 06ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. බලඝණය මගින් MI-17 හෙලිකොප්ටර්වල පැය 25 පරීක්ෂාවන් 02ක්, පැය 50 සේවා කිරීම් 04ක්, පැය 100 සේවා කිරීම් 03ක්, පැය 300 සේවා කිරීම් 01ක්, දින 30 ගබඩා සේවා කිරීම් 37ක්, මාස 03ක ගබඩා සේවා කිරීම් 09ක්, මාස 06 ගබඩා සේවා කිරීම් 06ක්, පැය 500 පිරිවැඩියා කාලය දිර්ඝ කිරීම සේවා කිරීම් 01ක් සහ පැය 25/ 50 ලිහිසි තෙල් සේවා කිරීම් 10ක් සිදු කර ඇත.

(අ) SMH-4420 සහ SMH 4424 MI 171E හෙලිකොප්ටර්වල අභ්‍යන්තර පිරිවැඩියා කාලය ව්‍යාප්ති වැඩසටහන් සම්පූර්ණ කිරීම. SMH-4420 සහ SMH-4424 MI 171E හෙලිකොප්ටර් දෙකෙහිම ඔවුන්ගේ තාක්ෂණික ප්‍රවීණතාවය මත පදනම්ව අභ්‍යන්තර පිරිවැඩියා කාලය ව්‍යාප්ති වැඩසටහන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉංජිනේරු නිලධාරීන් සහ කාර්මික ශිල්පීන් විසින් ඵලදායී ලෙස අවසන් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සෑම හෙලිකොප්ටරයකම පිරිඩිවැය කාලය පිළිවෙළින් පැය 500කින් සහ වසර දෙකකින් දීර්ඝ විය.



(ආ) SMH-4416, SMH-4415, SMH-599 සහ SMH-4426 හෙලිකොප්ටර් සඳහා විදේශීය ප්‍රතිසංස්කරණ පහසුකම්වලින් නියෝජිතයින් විසින් ලංසු තැබීමට පෙර පරීක්ෂණ අවසන් කිරීම.



(ඇ) SMH-582, SMH-4417, සහ SMH-4418 MI 17 හෙලිකොප්ටර් වල පිරිඩිවැය කාලය දිගු කිරීමේ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සලසමින් MINUSCA වෙත යැවීම සඳහා ප්‍රධාන කොටස් හෙලිකොප්ටර් වලින් ඉවත් කර ගුවන් යානා අමතර කොටස් ඩිපෝව (ASD) වෙත භාර දෙන ලදී.



(9) <u>අංක 7 බලඝණය ගුවන් යානා සහ ගුවන් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.</u> අංක 7 බලඝණය සතුව බෙල් 206 ගුවන්යානා 02ක් සහ බෙල් 212 ගුවන්යානා 04ක් ඇතුළුව මුළු ගුවන්යානා 06ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. බෙල් 206 හෙලිකොප්ටර්වවල පැය 100 සේවා කිරීම් 03ක්,පැය 300 සේවා කිරීම් 01ක් සහ මාස 03/පැය 100 විබාදන පරීක්ෂණ සේවා කිරීම් 04ක් සහ බෙල් 212 හෙලිකොප්ටර්වවල පැය 25 සේවා කිරීම් 30ක්, පැය 50 සේවා කිරීම් 19ක්, පැය 100 සේවා කිරීම් 07ක්, පැය 300 සේවා කිරීම් 01ක්, පැය 600 සේවා කිරීම් 02ක් සහ මාස 03ක පැය 100 විබාදන පරීක්ෂණ සේවා කිරීම් 10ක් සිදු කර ඇත.

(අ) SHT 557 බෙල් 206 හෙලිකොප්ටරයේ ගුවන් යානා පද්ධති නැවත ස්ථානගත කිරීමට පහසුකම් සැලසීම සඳහා නවීකරණය සිදු කිරීම - SHT 556 ගුවන් යානයේ පාලන පද්ධති තුනක ගුවන් විද්‍යා වින්‍යාසය උපාමාරු දැමීමේ පහසුව වැඩි කිරීමට සහ නියමුවන්ගේ තෙහෙට්ටුව අඩු කිරීමට සුදුසු අයුරින් වෙනස් වී ඇත.

i. KDF 806 ADF පද්ධති පාලන ඒකක **(**KFS 586 A) නැවත ස්ථානගත කිරීම.
ii. Com 1 සහ Com 2 පාලන ඒකකය නැවත ස්ථානගත කිරීම.
iii. Cougar කට්ටලය නැවත ස්ථානගත කිරීම.

(10) <u>අංක 8 බලඝණය - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්වල සංවර්ධනය.</u>


අංක 8 බලඝණයේ Y-12II ගුවන්යානා 03ක්, Y-12IV ගුවන්යානා 04ක්, B-200 ගුවන්යානා 01ක් ඇතුළුව සමස්ත ගුවන්යානා 08ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා සිදු කර ඇත. Y-12II සහ Y-12IV ගුවන් යානාවල දින 07 සේවා කිරීම් 148ක්, පැය 100 සේවා කිරීම් 02ක්, පැය 200 සේවා කිරීම් 01ක්, පැය 800 සේවා කිරීම් 01ක් සහ විබාදන පාලන සේවා කිරීම් 39ක් සිදු කර ඇති අතර B-200 Beech King ගුවන්යානාවල දින 07 සේවා කිරීම් 34ක්, පැය 600 (III අදියර) සහ පැය 800 (IV අදියර) සේවා කිරීම් 01ක් සිදු කර ඇත.


(අ) 2023 දෙසැම්බර් 05 වන දින නව Y-12 IV ගුවන්යානා 02ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඇතුළත් කිරීම, Harbin Y-12 IV ගුවන්යානා දෙකක් විධිමත්ව ඇතුළත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඉතිහාසයේ සුවිශේෂී පරිච්ඡේදයක් සනිටුහන් විය.






(ආ) SMR-2311 King Air B-200 (BB-1900) Beechcraft හි හානියට පත් වූ Starboard Wing Leading Edge Area සාර්ථක ලෙස අළුත්වැඩියා කර ප්‍රතිසංස්කරණය කර ඇති අතර, B-200 ගුවන් යානය ඵලදායී ලෙස ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ඇත.






(ඇ) SMR-2311 King Air B200 (BB1900) Beechcraft සඳහා Halo 250 STC වෙනස් කිරීම ක්‍රියාත්මක කිරීම. Halo 250 STC පරිවර්තනය මගින් ගුවන් යානයේ උපරිම ගුවන්ගත කිරීමේ බර රාත්තල් 12,500 සිට 13,420 දක්වා ඉහළ නංවයි, එහි ප්‍රතිඵලයක් ලෙස ගෙවීමේ ධාරිතාව රාත්තල් 920කින් වැඩි වේ. එය කිං එයාර් 200 මගී කාණ්ඩයකට ගෙන යන අතර, සීමා සහිත ප්‍රවර්ගය සමඟ ඇති සීමාවන් නොමැතිව මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමට ඉඩ සලසයි.



(11) <u>අංක 9 ප්‍රහාරක හෙලිකොප්ටර් බලඝණය ගුවන් හමුදා කඳවුර - හිඟුරක්ගොඩ.</u> අංක 9 බලඝණය සතුව MI-171V ගුවන් යානා 01ක්, MI-171 ගුවන් යානා 01ක්, MI-171E ගුවන් යානා 01ක් සහ MI-35 ගුවන් යානා 03ක් ඇතුළුව මුළු ගුවන් යානා 06ක් ඇත. මෙම බලඝණය මගින් 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා සිදු කර ඇත. MI-171/171V හෙලිකොප්ටර්වල ගබඩා සේවා කිරීම් 30ක් සහ MI-35 හෙලිකොප්ටර්වල දින 1 සේවා කිරීම් 192ක්, මාස 01 සේවා කිරීම් 64ක්, මාස 03ක සේවා කිරීම් 16ක් සහ මාස 06ට සේවා කිරීම 08ක්, වාර්ෂික සේවා 08ක් සිදු කර ඇත.

(12) <u>අංක 10 ප්‍රහාරක බලඝණය කටුනායක ගුවන් හමුදා කඳවුර.</u> අංක 10 බලඝණය සතුව Kfir TC2 ගුවන් යානා 02ක්, Kfir C2 ගුවන් යානා 03ක්, Kfir C7 ගුවන් යානා 01ක් ඇතුළු සමස්ත ගුවන් යානා 06ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. Kfir C2/C7 ගුවන් යානා 04ක් සහ Kfir TC2 ගුවන් යානා 01ක අළුත්වැඩියාව, පූර්ණ අළුත්වැඩියාව සහ වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින් සඳහා පුහුණුව ලබාදීම ඇතුළු අංක 10 ප්‍රහාරක බලඝණයේ උපාංග වැඩිදියුණු කිරීම සිදු කර ඇත.

අනු/ අංකය	ශ්‍රී ලංගුහ ලියාපදිංචි අංකය	කාර්යය/ ක්‍රියාකාරකම	අදාළ ක්‍රියාකාරකම්වල ඡායාරූප
01	SFT 710	(අ) මූලික පින්තාරු කිරීම අවසන් කර ඇත. (ආ) හානියට පත් සියලුම පුවරු අළුත්වැඩියා කර ඇත. (ඇ) පියාපත් බඳ ප්‍රතිස්ථාපනය කර ඇලවීම සම්පූර්ණ කර ඇත.	 
02	SFM 714	(අ) හානියට පත් සියලුම පුවරු අළුත්වැඩියා කර ඇත. (ආ) මූලික පින්තාරු කිරීම අවසන් කර ඇත. (ඇ) ගුවන් යානයේ ඉදිරිපස කේතු ආකාර කොටස සහ නියමු කුටිය අතර බිම් දැලක් ස්ථාපනය කර ඇත. (රාමු අංක 2) Nose landing gear bay, air intake (ඈ) අළුත්වැඩියාව සඳහා සංරචක යවන ලදි. (ඉ) අළුත්වැඩියාව සඳහා එන්ජිම යවන ලදි.	 

අනු/ අංකය	ශ්‍රී ලංගුහ ලියාපදිංචි අංකය	කාර්යය/ ක්‍රියාකාරකම	අදාළ ක්‍රියාකාරකම්වල ඡායාරූප
03	SFM 718	(අ) මූලික පින්තාරු කිරීම අවසන් කර ඇත. (ආ) පියාපත් බඳ ප්‍රතිස්ථාපනය කර ඇලවීම සම්පූර්ණ කර ඇත. (ඇ) හානියට පත් සියලුම පුවරු අළුත්වැඩියා කර ඇත. (ඈ) Grommet ස්ථාපනය සම්පූර්ණ කර ඇත.	 
04	SFM 725	(අ) මූලික පින්තාරු කිරීම අවසන් කර ඇත. (ආ) පියාපත් බඳ ඇලවීම සම්පූර්ණ කර ඇත. (ඇ) Grommet ස්ථාපනය සම්පූර්ණ කර ඇත.	 
05	SFM 717	(අ) මූලික පින්තාරු කිරීම අවසන් කර ඇත. (ආ) Grommet ස්ථාපනය සිදු කරමින් පවතී. (ඇ) අළුත්වැඩියාව සඳහා සංරචක යවනු ලැබේ.	 

වගුව - 06

(13) <u>අංක 111 UAV බලඝණය වවුනියාව ගුවන් හමුදා කඳවුර.</u> අංක 111 UAV බලඝණයට ලිහිණියා MK1 යානා 01ක්, ලිහිණියා MK1 E යානා 01ක් ඇතුළුව සමස්ත UAV යානා 02ක් ඇති අතර මෙම බලඝණය 2023 වර්ෂය තුළ විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. ලිහිණියා MK1 හි සති 06ක UAV සංරක්ෂණ සේවා 09ක් හා මාස 06ක එන්ජින් සංරක්ෂණ සේවා 02ක් සිදු කර ඇත.

(14) <u>අංක 61 පියාසැරිය - රත්මලාන - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනයන්.</u> අංක 61 ගුවන් බල ඇණියේ අංක MI-171E ගුවන් යානා 05ක්, MI-171 යානා 01ක්, MI-17V5 යානා 01ක් ඇතුළුව හෙලිකොප්ටර් යානා 07ක් ඇති අතර 2023 වර්ෂය තුළදී පියාසැරිය මගින් විවිධ ආකාරයේ සේවා කටයුතු සිදු කර ඇත. පැය 25 සේවා කිරීම් 15ක්, පැය 50 සේවා කිරීම් 06ක්, පැය 100 සේවා කිරීම් 03ක්, පැය 500 පිරිවැඩියා කාලය දිගු සේවා කිරීම් 01ක් සහ MI-17 හෙලිකොප්ටර්හි මාස 06 ගබඩා සේවා කිරීම් 06ක් සිදු කර ඇත.

(15) ගුවන් හමුදා MINUSCA ගුවන් සේවා සංචිතය. ගුවන් හමුදා MINUSCA කඳවුරේ MI-17 V5 යානා 01ක් MI-171SH යානා 02ක් ඇතුළුව ගුවන් යානා 03ක් ඇති අතර 2023 වර්ෂය තුළ ගුවන් යානාවල විවිධ වර්ගයේ සේවා කටයුතු සිදු කර ඇත. පැය 25 පරීක්ෂණ 05ක්, පැය 50 පරීක්ෂණ 15ක්, පැය 50 සේවා කිරීම් 04ක්, පැය 100 සේවා කිරීම් 07ක්, පැය 200 සේවා කිරීම් 02ක්, පැය 300 සේවා කිරීම් 05ක් පැය 1000 සේවා කිරීම් 02ක් සහ MI-17 හෙලිකොප්ටර්වල පැය 25 ලිහිසි කිරීම 24ක් සිදු කර ඇත.

(අ) SMH -582 MI 17 හෙලිකොප්ටරයේ පැය 500 පිරිවැඩියා කාලය දිගුව ශ්‍රීලංගුහ ගුවන් ඇණිය MINUSCA හි නිම කිරීම.



(16) හෙලිටුවස් (Helitours) ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන. හෙලිටුවස් ශ්‍රීලංගුහ රත්මලාන කඳවුර සතුව MA-60 ගුවන් යානා 02ක් ඇති අතර 2023 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මාස 03 සේවා කිරීම් 05ක්, මාස 03/පැය 400 සේවා කිරීම් 02ක් මාස 06 සේවා කිරීම් 03ක්, අනෙකුත් සේවා කිරීම් 05ක් සහ සේවා කිරීම සඳහා 02ක් ආපසු යවා ඇත.

(17) ගුවන් යානා ඉංජිනේරු පක්ෂාංගය (AEW) - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය

2023 වර්ෂය තුළ ගුවන් යානා ඉංජිනේරු පක්ෂාංගය මගින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.

(අ) විශේෂ ව්‍යාපෘතිය. බෙල් (Bell) 212 හෙලිකොප්ටර් වල පැය 1000/ අවුරුදු 5 සේවා කිරීම් පක්ෂාංගය විසින් සම්පූර්ණ කර ඇත.

(ආ) ස්ටැන්ඩර්ඩ් රූම්. පක්ෂාංගය විසින් සියලුම ගුවන් යානා සම්බන්ධයෙන් බල ක්‍රමාංකනය 344ක් මිනුම් ක්‍රමාංකන 212ක් ස්ටැන්ඩර්ඩ් torque wrench calibration 221ක් සහ fresher gauge calibration 615ක් සිදු කර ඇත.

(ඇ) විනාශකාරී නොවන පරීක්ෂණ විද්‍යාගාර. පක්ෂාංගය මගින් සියලුම ගුවන් යානා සම්බන්ධයෙන් එඩී ධාරා පරීක්ෂණ 96ක්, චුම්බක අංශු පරීක්ෂණය 27ක්, අල්ට්‍රා සොනික් පරීක්ෂණ 27ක්, ද්‍රව විනිවිද යාමේ පරීක්ෂණ 118ක්, සහ එක්ස් කිරණ පරීක්ෂණ 81ක් සිදු කර ඇත.

(ඈ) විද්‍යුත් අංගනය. පක්ෂාංගය මගින් සියලුම ගුවන් යානා වල විදුලි උපාංග වලට අදාළව ප්‍රහාරක සංවේදක 01ක්, පීඩන ස්විච් 01ක්, NI Cd බැටරි චාජර් 03ක්, HYD accessory ඒකාබද්ධ පරීක්ෂණ කට්ටල 01ක්, vent blower motor 01ක්, Integrated valve 01ක්, Wiper motor 01ක්, අළුත්වැඩියා කිරීම සිදු කරනු ලැබ ඇත.

(ඉ) ආරක්ෂක උපකරණ අංගනය. පක්ෂාංගය මගින් සියලුම ගුවන් යානා වල ආරක්ෂිත උපකරණ අංගනය මගින් ජීවිතාරක්ෂක කබා 60ක්, මගී ජීවිතාරක්ෂක කබා 30ක්, බහු ආසන ජීවිතාරක්ෂක යානා 30ක්, පැරෂුට 23ක්, කුඩා පැරෂුට 02ක්, පුද්ගල දිවි ගලවා ගැනීමේ ඇසුරුම් 06ක්, G Suit 22ක්, පාවීමේ උපකරණයක් අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(ඊ) ගුවන් යානා අලුත්වැඩියා සහ මුක්තාවශේෂ අංශය. පක්ෂාංගය මගින්බෙල් (Bell) - 212, බෙල් (Bell) - 412, AN-32B, Y-12, MI-17, C-130, Cessna-150, B 200, සහ PT-6 ගුවන් යානා වල ව්‍යුහාත්මක අළුත්වැඩියා කිරීම් 73ක් සිදු කරනු ලැබ ඇත.

(උ) <u>එන්ජින් අංගනය.</u> බෙල් (Bell) 212/412 ගුවන් යානා, Y-12 ගුවන් යානා, B/200 ගුවන් යානා, සඳහා එන්ජින් අංගනය මගින් සිදු කරන ලද එන්ජින් අළුත්වැඩියා සේවාවන් 44ක් පක්ෂාංගය මගින් සිදු කරනු ලැබ ඇත. මෙමගින් АИ-9B APU එන්ජින් ආශ්‍රිත කටයුතු 02ක් MI - **17** ගුවන් යානා වල Flow duct inspection 03ක් සිදු කරනු ලැබ ඇත.

(ඌ) <u>සංරචක, රෝද සහ තිරිංග අංගනය.</u> පක්ෂාංගය මගින් බෙල් (Bell) 412/212 ගුවන් යානා වල අළුත්වැඩියා කිරීම් 207ක් සහ F-7 ගුවන් යානා වල ප්‍රධාන රෝදයේ පිටත ආවරණයේ අළුත්වැඩියා කිරීම් 07ක් සිදු කරනු ලැබ ඇත.

(එ) <u>උපකරණ අංගනය.</u> පක්ෂාංගය මගින් සියලුම ගුවන් යානා වල අළුත්වැඩියා කිරීම් 2023 වර්ෂයේ දී සිදු කරනු ලැබ ඇත.

(ඒ) <u>සංයුක්ත අංගනය.</u> පක්ෂාංගය මගින් සියලුම ගුවන් යානා වල සංයුක්ත පැනල 08ක අළුත්වැඩියා කිරීම් සිදු කරනු ලැබ ඇත.

(18) <u>ගුවන් යානා ඉංජිනේරු ආධාරක පක්ෂාංගය (ASW) - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.</u>

2023 වර්ෂය තුළ දී ගුවන් යානා ඉංජිනේරු (ASW) පක්ෂාංගය මගින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.

(අ) <u>එන්ජින් අංගනය.</u> PT-6 සහ C-150 ගුවන් යානා 13ක අළුත්වැඩියා කටයුතු පක්ෂාංගය මගින් සිදු කර ඇත.

(ආ) <u>සංයුක්ත අංගනය.</u> Y-12II/IV, AN 32B , K-8, PT-6, MA-60, B-200 සහ C-150 ගුවන් යානා 131ක අළුත්වැඩියා කිරීම/පිටත ආවරණය මාරු කිරීම/සේවා කිරීම/පරීක්ෂා කරීම/පූර්ණ අලුත්වැඩියා කිරීම පක්ෂාංගය මගින් සිදු කර ඇත.

(ඇ) <u>විද්‍යුත් හා උපකරණ වැඩපල (Electrical & Instrument Shop).</u> PT 06, C-150, K-08, Y-12, B-200, Bell 412 සහ ගුවන් යානා පිරිවැඩියා පක්ෂාංගයහි ගුවන් යානා අලුත්වැඩියා කිරීම සහ පූර්ණ අලුත්වැඩියාවන් 83ක් පක්ෂාංගය මගින් සිදු කර ඇත.

(19) <u>ගුවන් යානා පිරිවැඩියා පක්ෂාංගය (AOW) - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.</u>

2023 වර්ෂය තුළ දී ගුවන් යානා පිරිවැඩියා පක්ෂාංගය (AOW) පක්ෂාංගය මගින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.



(අ) කටුනායක ගුවන් හමුදා කඳවුරේ ගුවන් යානා පිරිවැඩියා පක්ෂාංගය (AOW) හි SMR-858 Y-12 II ගුවන් යානා වල සේවා කාලය දීර්ඝ කරගැනීමේ වැඩසටහන අවසන් කිරීමෙන් පසු අත්පත් කර ගැනීම. කටුනායක ගුවන් හමුදා කඳවුරේ ගුවන් යානා ප්‍රතිසංස්කරණ පක්ෂාංගය (AOW) විසින් 2023 දෙසැම්බර් 4 වන දින රත්මලාන ගුවන් හමුදා කඳවුරේ අංක 08 සැහැල්ලු ප්‍රවාහන බලඝණය වෙත නවීකරණයකින් අනතුරුව ආයු කාලය දීර්ඝ කරන ලද Y-12 II ගුවන් යානය සාර්ථකව ලබා දෙන ලදී.

(ආ) ගුවන් යානා අලුත්වැඩියා පක්ෂාංගයේ ගුවන් යානා නැවත සකස් කිරීම.

අනු/ අංකය	ශ්‍රීලංගුහ ලියාපදිංචි අංකය	කාර්යය / ක්‍රියාකාරකම	අදාළ ක්‍රියාකාරකම්වල ඡායාරූප
01.	F-7BS සහ SFI-708 F-7 ගුවන් යානය	ගුවන් යානය එකලස් කිරීම තත්ත්වයේ පවතින බැවින් පවතින කොටස් භාවිතා කර සංරක්ෂණය සඳහා පින්තාරු කිරීම සිදු වෙමින් පවතී.	
02.	SJT-749 Of K-8 ගුවන් යානය	ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර පූර්ණ අළුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතී.	
03.	SCL - 858 Y 12 II	පූර්ණ අළුත්වැඩියා කටයුතු අවසන් කර රත්මලාන ගුවන් හමුදා කඳවුරේ අංක 8 බලසණය වෙත භාර දෙන ලදී.	

වගුව - 07

ඉ. <u>සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය</u>

(1) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් සාමාන්‍ය ඉංජිනේරු කටයුතු සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු සඳහා 2023 වසර ආරම්භයේදී රුපියල් මිලියන 1,969.28ක මුදලක් ප්‍රක්ෂේපණය කර ඇත. මෙම ප්‍රතිපාදන අතරින් ඇති ද්‍රවශීලතාව අනුව අධ්‍යක්ෂකය විසින් 2023 වර්ෂය තුළ එහි අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කර ඇත.

(2) 2023 වසරේ සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා වූ වියදම්.

2023 වර්ෂය තුළ සාමාන්‍ය ඉංජිනේරු කටයුතු සඳහා වූ මුළු වියදම රුපියල් මිලියනය. 1,417.26කි. මෙයට ඇතුළත් වන්නේ,

(අ) වාහන අළුත්වැඩියාව සහ සේවා පිරිවැය රුපියල් මිලියන. 178.39කි.

(ආ) පතොරම් මිලදී ගැනීම සහ යුධෝපකරණ වියදම් සඳහා රුපියල් මිලියන 318.19කි.

(ඇ) යාන්ත්‍රික ප්‍රවාහනය සඳහා රුපියල් මිලියන 920.68කි.

(3) ගුවන් යානා පින්තාරු කිරීම.

(අ) ගුවන් යානා අංක SMH 589 හි අළුත්වැඩියාව සහ සම්පූර්ණ පින්තාරුව සිදු කර ඇත (අංක 6 බළසණය).



(ආ) SHT 556 බෙල් (Bell) 206 Jet Ranger හෙලිකොප්ටරයේ පූර්ණ පින්තාරු කිරීම සිදු කර ඇත (අංක 7 බළඇණය).



(ඇ) SMR-858/SCL-859 ගුවන් යානා ප්‍රයිමර් තීන්ත කිරීම සහ සම්පූර්ණ පින්තාරුව සිදු කර ඇත.



(4) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය හා සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති.

(අ) විශාල බහාලුම් නිෂ්පාදනය කිරීම.



(ආ) කූඩාරම් නිෂ්පාදනය කිරීම.



(ඇ) Combat Harness නිෂ්පාදනය කිරීම.



(5) ආයුධ මිලදී ගැනීම.

(අ) මි.මී.7.62 Emtan MZ 47 රයිෆල් 40ක් මිලදී ගැනීම.



(ආ) මිලිමීටර් 9 බෝල පතොරම් 250,000ක් මිලදී ගැනීම.



(ඇ) මිලිමීටර් 9 CZ P10 M පිස්තෝල 75ක් මිලදී ගැනීම.



(6) ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම.

F-7 GS සහ K-8 ගුවන් යානා බලඇණිය සඳහා Ejection Seat Cartridges 03ක් මිලදී ගැනීම (F7/GS සහ 04 K-8 ගුවන් යානා සඳහා).



ඊ. <u>විද්‍යුත් හා පරිගණක ඉංජිනේරු අධ්‍යක්ෂකය</u>

(1) 2023 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන ඇගයීම අනුව ලං.රු.මි 319.63ක විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර ඇත.

(2) විද්‍යුත් හා විදුලි සංදේශ කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් වල සංවර්ධනය 2023 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති.

(අ) කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුරේ AR&DW සඳහා 9XTEND ප්‍රතිස්ථාපන කුඩා දත්ත සම්බන්ධක පද්ධති මිලදී ගැනීම.



(ආ) ගුවන් හමුදා ගුවන් යානා ඇණිය සඳහා 'TDR 94' ට්‍රාන්ස්පොන්ඩර 02ක් මිලදී ගැනීම.



(ඇ) ගුවන් හමුදා ගුවන් යානා ඇණිය සඳහා 'CTL-22D' 01ක් මිලදී ගැනීම.



(ඈ) ශ්‍රීලංගුහ සන්නිවේදන ජාලය සඳහා '08 port POE+' ජාල ස්විචයක් මිලදී ගැනීම.



(ඉ) ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන සහ ශ්‍රීලංගුහ කඳවුර පිදුරුතලාගල සඳහා PCM සම්බන්ධක උපකරණ මිලදී ගැනීම.



(ඊ) ගුවන් හමුදාව සඳහා CCTV උපකරණ මිලදී ගැනීම.



(උ) බහුමාධ්‍ය ප්‍රොජෙක්ටර් 15ක් පිහිටුවීම සඳහා මිලදී ගැනීම.



ඌ. <u>සැපයුම් අධ්‍යක්ෂකය</u>

2023 වර්ෂය තුළ සැපයුම් අධ්‍යක්ෂකය විසින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම.

අනු/අංකය	විස්තරය	මුදල (ලං.රු.මි.)
01	බැරක්ක උපකරණ මිලදී ගැනීම	20.53
02	ආහාර සැපයුම් උපකරණ මිලදී ගැනීම	10.93
03	වෙනත් භාණ්ඩ මිලදී ගැනීම	21.05

වගුව - 08

ඌ. <u>පරිපාලන අධ්‍යක්ෂකය</u>

2023 දී ශ්‍රීලංගුහ පරිපාලන අධ්‍යක්ෂකයේ තත්‍ය කාර්ය සාධනය පහත පරිදිය, සාමාන්‍ය පරිපාලනය සඳහා වෙන් කරන ලද මුළු මුදල ල.ං.රු.මි.33,746.76

අනු/අංකය	ක්‍රියාකාරකම	වෙන් කල මුදල (ලං.රු.මි)
01	වැටුප් හා චේතන	14,442.66
02	වෙනත් දීමනා	16,585.89
03	දේශීය ගමන් වියදම්	25.35
04	තැපැල් ගාස්තු	2.26
05	විදුලිය හා ජලය	1,422.23
06	කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	0.4
07	දේපල ණය පොළී	34.28
08	වන්දි/රක්ෂණ	29.22
09	අවමංගල්‍ය සේවා/ නීති සේවා ගෙවීම්	3.14
10	කාර්යාල උපකරණ අළුත්වැඩියාව	0.42
11	සාමාන්‍ය කාර්යාල උපකරණ	2.88
12	ලිපි ද්‍රව්‍ය	18.97
13	වෙනත් සැපයුම්	0.61
14	දේශීය අධිකාරී සඳහා කුලී/ගාස්තු/කතෘභාග/බදු	4.3
එකතුව		**32,572.31**

වගුව - 09

එ. <u>ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකය</u>

(1) 2023 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මට සාපේක්ෂව <u>ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකයේ</u> තත්‍ය කාර්ය සාධන පහත පරිදි වේ.

(අ) පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙන් කිරීමට එරෙහිව සැබෑ වියදම්.

විස්තරය	ප්‍රතිපාදනය (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)
පුනරාවර්තන වියදම්	159.64	145.45
ප්‍රාග්ධන වියදම්	924.34	467.39
එකතුව	**1,083.98**	**612.84**

වගුව - 10

(2) වර්ෂය තුළ, ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් පහත සඳහන් ව්‍යාපෘති/කාර්යයන් සිදු කරන ලදී.

(අ) රුපියල් මිලියන 105.50ක වියදමින් කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරේ මහල් 05කින් යුත් (රථ ගාල් සහිත නිවාස ඒකක 8ක්) විවාහක නිලධාරීන්ගේ නිලනිවාස ඉදිකිරීම අවසන් කිරීම.



(ආ) රුපියල් මිලියන 102ක වියදමින් රත්මලාන ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුරේ මහල් 05කින් යුත් (රථ ගාල් සහිත නිවාස ඒකක 8ක්) විවාහක නිලධාරීන්ගේ නිලනිවාස ඉදිකිරීම අවසන් කිරීම.



(ඇ) රුපියල් මිලියන 17.80ක වියදමින් ගුවන්පුර ගුවන් හමුදා කඳවුරේ වැඩ සේවා අංශය, විනය කාර්යාලය, සිවිල් සේවක නිවස්නය සහ විවේක කාමරය සඳහා මහල් 02ක ගොඩනැගිල්ලක් (මීටර් 16 x 9.8) ඉදිකිරීම අවසන් කිරීම.



(ඈ) රුපියල් මිලියන 88.60ක මුළු පිරිවැයක් දරා ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුනායක කඳවුරේ විදුලිබල බෙදාහැරීමේ පද්ධතිය ප්‍රමිතිගත කිරීම.



(ඉ) රුපියල් මිලියන 42ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයක් සඳහා හිඟුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරේ ගුවන් යානා පිවිසුම් පතයෙහි මතුපිට ප්‍රතිසංස්කරණය කිරීම (ප්‍රගතිය - 75% අවසන්).



(ඊ) රුපියල් මිලියන 10.30ක වියදමින් ගුවන්පුර ඉලෙක්ට්‍රොනික අංශය සඳහා මහල් 02ක ගොඩනැගිල්ලක් (මීටර් 6.2 x 7.0) නිම කිරීම.



(උ) රුපියල් මිලියන 85.10ක වියදමින් රත්මලාන ගුවන් හමුදා කඳවුරෙහි මහල් 02ක පරිපාලන කුටියක් අංක 61 පියසැරිය සඳහා (මීටර් 62 x 62) ඉදිකිරීම (තාවකාලික අත්හිටුවා ඇත).



(ඌ) රුපියල් මිලියන 17.09ක වියදමින් කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරේ බලාගාරය (250 KVA විදුලි ජනකය ඇතුළුව) ඉදිකිරීම (ඉදිකිරීම් 100% අවසන්, දැනට ජනක යන්ත්‍ර මිලදී ගැනීමට ඇත).



(එ) රුපියල් මිලියන 4.12ක වියදමින් සීගිරිය ගුවන් හමුදා කඳවුරේ මීටර් 7.5 x 7.8 බලාගාරයක් ඉදිකිරීම (ඉදිකිරීම් 100% අවසන්, විදුලිය සැපයීම සිදුකරමින් පවතී).



(ඒ) රුපියල් මිලියන 2.79ක වියදමින් දියතලාව ගුවන් හමුදා සටන් පුහුණු පාසලේ ජල ටැංකිය (ලීටර් 80,000) ඉදිකිරීම (ඉදිකිරීම් 100% අවසන්, ජල පොම්පය මිලදී ගැනීම සම්බන්ධ කටයුතු දැනට සිදුකරමින් පවතී).



(ඔ) රුපියල් මිලියන 3.59ක වියදමින් කොග්ගල ගුවන් හමුදා කඳවුරේ ජල ටැංකිය (ලීටර් 80,000) ඉදිකිරීම (ඉදිකිරීම් 100% අවසන්, ජල පොම්පය මිලදී ගැනීම සම්බන්ධ කටයුතු දැනට සිදුකරමින් පවතී).



(ඕ) රුපියල් මිලියන 2.38ක වියදමින් වීරවිල ගුවන් හමුදා කඳවුරේ ජල ටැංකිය (ලීටර් 50,000) ඉදිකිරීම (ඉදිකිරීම් 100% අවසන්, ජල පොම්පය මිලදී ගැනීම සම්බන්ධ කටයුතු දැනට සිදුකරමින් පවතී).



(3) 2023 වර්ෂය තුළදී ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති/කාර්යයන් යටතේ ඉදිකිරීම් ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් සිදු කරන ලද කාර්යයන්.

අනු/අංකය	ස්ථානය	ව්‍යාපෘතියේ නම
01	ශ්‍රීලංගුහ කඳවුර අම්පාර	ලාහුගල නීලගිරි සෑය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම්.
02		දීඝවාපිය රජ මහාවිහාරයෙහි දාතු මන්දිරය ඉදිකිරීම.
03	ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුර	සඳහිරු සෑය ඉදිකිරීම.
04		සඳහිරු සෑය කෞතුකාගාරය ඉදිකිරීම.
05	ශ්‍රීලංගුහ කඳවුර සීගිරිය	මැල්සිරිපුර උමංදාව ආරණ්‍ය සේනාසනය ඉදිකිරීම.
06		දඹුල්ල ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු.
07	ශ්‍රීලංගුහ කඳවුර වීරවිල	කතරගම දේවාලයේ නව අඩි පාරේ ඉදිකිරීම් කටයුතු.
08	ශ්‍රීලංගුහ කඳවුර කොළඹ	මහරගම අපේක්ෂා රෝහලේ මහල් 05ක ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු.
09		කොළඹ 05 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු.
10		කොළඹ ආනන්ද විද්‍යාලීය රග්බි පිටියේ ඉදිකිරීම්.
11		කොළඹ ආනන්ද විද්‍යාලීය කුලරත්න ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු.
12		ආනන්ද විද්‍යාලයේ පස්මහල් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු.
13		නවගමුව පත්තිනි දේවාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු.
14	ශ්‍රීලංගුහ කඳවුර සීගිරිය	මහනුවර ධර්මරාජ විද්‍යාලීය නව Lake view මණ්ඩපයේ ඉදිකිරීම් කටයුතු.
15	ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන	බෙල්ලන්විල රජමහා විහාරයේ තීන්ත ආලේප කිරීමේ කටයුතු.
16	ශ්‍රීලංගුහ කඳවුර කොග්ගල	කොටපොල ගැටබරු රජමහා විහාරයේ විදුලිය සම්බන්ධ කටයුතු.
17	ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුර	උමංදාව ධර්මශාලාව (සන්නිපාත සාලාව) ඉදිකිරීම් කටයුතු.

වගුව - 11

ඒ. <u>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය</u>

(1) 2023 වර්ෂය තුළ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය මගින් අදාළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මට අනුව පහත ක්‍රියාකාරකම් සාර්ථකව නිම කර ඇත.

අනු/අංකය	ක්‍රියාකාරකම	වියදම (ලං.රු.මි)
01	ඖෂධ / සැරහුම් / රසායනාගාර අයිතම	243.26
02	ප්‍රාදේශීය මිලදී ගැනීම්/සුළු මිලදී ගැනීම්(RPC/ SVP) (ඖෂධ / සැරහුම් / රසායනාගාර අයිතම)	14.22
03	ප්‍රාදේශීය මිලදී ගැනීම් (RPC) (ජෛව වෛද්‍ය ඒකකය සඳහා පරිභෝජන ද්‍රව්‍ය)	0.91
04	සිවිල් වෛද්‍යවරුන්ගේ ගෙවීම්	4.3
05	වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම	11.32
06	වෛද්‍ය උපකරණ	10.22
එකතුව		**284.23**

වගුව - 12

(2) අන්තරායකර මත්ද්‍රව්‍ය වලින් තොර රටක ඇති කිරීමේ උපාය මාර්ග.

(අ) කිසියම් අන්තරායකර ඖෂධයක් පරිභෝජනය කර ඇත් ද යන්න හඳුනා ගැනීම සඳහා සේවා පුද්ගලයින් ඉලක්ක කරගනිමින් අහඹු මුත්‍රා පරීක්ෂණ පැවැත්වීම. 2023 වසර තුළදී පරීක්ෂණ කට්ටල 1000ක් මිලදී ගන්නා ලදී.

(ආ) බඳවා ගැනීමේ වෛද්‍ය පරීක්ෂණ වලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අපේක්ෂකයින් සඳහා එලෙසම බහු ඖෂධ පරීක්ෂණයක් පැවැත්වීම.


(ඇ) මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සම්බන්ධයෙන් සේවා පුද්ගලයින් මෙන්ම සිවිල් පුද්ගලයින් (සාමාන්‍ය ජනතාව) ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම.

ඔ. <u>පුහුණු අධ්‍යක්ෂකය</u>

(1) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2023 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය සහ සේවා පුද්ගලයින්ගේ ධාරිතා වර්ධනය ඉහළ නැංවීම සඳහා විදේශීය හා දේශීය පුහුණුව සඳහා පහත සඳහන් මුදල වැය කර ඇත.

අනු/අංකය	පුහුණු කාණ්ඩය	සත්‍ය පිරිවැය (ලං.රු.මි)
01	විදේශීය පුහුණු	133.59
02	දේශීය පුහුණු	17.89
එකතුව		**151.48**

වගුව - 13



රූපසටහන - 4

ඕ. <u>සුබසාධන අධ්‍යක්ෂකය</u>

(1) 2023 වර්ෂය සඳහා සුභසාධන අධ්‍යක්ෂකයේ වාර්ෂික කාර්ය සාධනය පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතන සඳහා සුබසාධන ආධාර සැපයීම.

i. සියලුම ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩල පුද්ගලයින්ගේ පාසල් සිසුන් වන දරුවන් සඳහා අභ්‍යාස පොත් 161,564 ක් නොමිලේ ලබා දෙන ලදී.

ii. ගුවන් හමුදා දිනපොත් සහ දින දර්ශන සියලුම සේවා පුද්ගලයින්, සිවිල් කාර්ය මණ්ඩලය, ක්‍රියාන්විතයේ දී මියගිය සහ ආබාධිත තත්ත්වයට පත්වූ සාමාජිකයින්ගේ සමීප ඥාතීන් අතර නොමිලේ බෙදා දෙන ලදී.

iii. ගුවන් හමුදා වාර්ෂික අවුරුදු පොළ 2023 අප්‍රේල් මාසය තුළ සංවිධානය කර පවත්වන ලදී.

iv. කටුනායක ගුවන් හමුදා කඳවුරු පාසලේ පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ 1 වන සහ 2 අදියර මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කර ඇත.

v. විශ්‍රාමික ගුවන් හමුදා සාමාජිකයින් සඳහා රැකියා බැංකුවක් පවත්වාගෙන යනු ලබයි.

vi. ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත්වූ නිලධාරීන් සඳහා පහත වෛද්‍ය ආධාර පරිත්‍යාග කරන ලදී.

විස්තර	ප්‍රමාණය
කෘතිම ඇස්	01
කෘතිම අත් පා	02
රෝද පුටු	04
කිහිලිකරු	02

වගුව - 14

vii. සේවා පුද්ගලයින්ගේ සමීප ඥාතීන් සඳහා රැකියා ස්ථාන මාරු ලබා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

viii. කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයට ළමුන් 81ක් දෙනෙකු ඇතුළත් කිරීම ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් සිදු කරන ලදී.

ix. සුභසාධන පහසුකම් නංවාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතන වෙත ආධාර ලබා දෙන ලදී.

x. බාහිර රැකියා අවස්ථා සඳහා අයදුම් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද සේවා පුද්ගලයින්ට සේවා සහතික නිකුත් කරන ලදී.

xi. ශ්‍රී ලංකා ගුවන් හමුදා පුද්ගලයින් 28 දෙනෙකුට ඔවුන්ගේම නිවාස ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉදිකිරීම සඳහා ශ්‍රම ආධාර ලබා දෙන ලදී.

xii. රණවිරු සේවා අධිකාරිය හා සම්බන්ධ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ බලලත් නිලධාරීන් අතර විරුසර වරප්‍රසාද කාඩ්පත් 485ක් බෙදා දෙන ලදී.

xiii. ගුවන් හමුදා පෙරපාසල් ගුරුවරියන් 59 දෙනෙකු සඳහා අවශ්‍ය සාරි නොමිලේ බෙදා දෙන ලදී.

(ආ) සාමාන්‍ය ජනතාවට සුබසාධන ආධාර සැපයීම.

i. ගංගාරාම විහාරස්ථානයේ මහා පෙරහර සහ බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ මහා පෙරහර පැවැත්වීම සඳහා සහය ලබා දෙන ලදී.

(ඇ) දිළිඳුකම තුරන් කිරීම සඳහා සුභසාධන ආධාර සැපයීම.

i. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී.

ඔ෭. <u>විනයාරක්ෂක අංශය</u>

(1) 2023 වර්ෂය තුළ කාර්ය සාධනය පහත පරිදි වේ.

(අ) ගුවන් හමුදා පොලිස් අංශවල භාවිතා කිරීම සඳහා මෝටර් පන්දම් 100ක්, මෝටර් ජැකට් 100ක්, ඩෙස්ක්ටොප් පරිගණක 15ක්, මාර්ග කෝන් 100ක්, හදිසි විදුලි පහන් 50ක් සහ උකුල් පරිගණක 01ක් මිලදී ගෙන ඇත.

(ආ) 24x36 80gsm හිස් කඩදාසි 500 පැකට් 178ක්, අළුපැහැති 31x43 gsm box board පුවරු 100 පැකට් 01ක් සහ සුදු පැහැති A4 කඩදාසි පැකට් 25ක් මිලදී ගෙන ඇත.

(2) 2023 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය.

විස්තරය	විමර්ශන වර්ගය							එකතුව
	නියාරක්ෂිත අංශය ආරම්භ කරන ලද විමර්ශන	පෞත්සම් පදනම් කරගත් විමර්ශන	නදියි සෙවීයි ඝාතන	වාහන සෙවීයි ඝාතන	ඩිට්ටිපත් කළ F.252 පෝරම	කැඩෙට් නිලධාරී නිර්ණායනය	නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකළ නිලධාරීන්	
නඩු ගණන	77	69	07	241	158	310	-	862

වගුව - 15

ක. <u>ගුවන් බුද්ධි අංශය</u>

(1) ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සුදුසුකම් ලත් දේශන මගින් ගුවන් බුද්ධි අංශය සඳහා අලුතින් බඳවා ගත් නිලධාරීන් 04 දෙනෙකු සහ ගුවන් භටයින් 49 දෙනෙකු අන්තරායකර මත්ද්‍රව්‍ය පිළිබඳව මනාව දැනුවත් කරන ලදී. තවද, ඔවුන් මූලික බුද්ධි පාඨමාලා හැදෑරීමේදී සුදුසුකම් ලත් විශේෂ කාර්ය බළකායේ උපදේශකවරුන් විසින් මත්ද්‍රව්‍ය/මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් අත්අඩංගුවට ගැනීම සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ද දැනුවත් කරන ලදී.

(2) බුද්ධි අංශ ශක්තිමත් කිරීම.

(අ) සියලුම ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතනවල බුද්ධි අංශවල මෙහෙයුම් සාර්ථක කර ගැනීම සඳහා තොරතුරු සපයන්නන් සඳහා ලබා දුන් බුද්ධි දීමනාව පෙර වසරට සාපේක්ෂව වැඩි කරන ලදී.

(ආ) නිලධාරීන් 02 දෙනෙකු සහ ගුවන් භටයින් 10 දෙනෙකු සඳහා ඩ්‍රෝන පුහුණුවක් ලබාදීම.

(ඇ) නිලධාරීන් 04 දෙනෙකු සහ ගුවන් භටයින් 49 දෙනෙකු සඳහා මූලික බුද්ධි පුහුණු පාඨමාලා 2ක් ලබාදීම.

(ඈ) විවිධ වෘත්තීන්හි නියුතු 01 නිලධාරියෙකු සහ ගුවන් භටයින් 13 දෙනෙකු සඳහා මූලික බුද්ධි පුහුණුවක් ලබා දීම.

(ඉ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බුද්ධි මෙහෙයුම් 20ක් සඳහා යාවත්කාලීන කිරීමේ කෙටි කාලීන පුහුණු පාඨමාලා 01ක් පැවැත්වීමට හැකි විය.

(ඊ) බුද්ධි රාජකාරිවල යෙදෙන ගුවන් භටයින් 55 දෙනෙකු සඳහා යාවත්කාලීන කිරීමේ කෙටි කාලීන දෙමළ භාෂා පුහුණු පාඨමාලා 3ක් පැවැත්වීමට හැකි විය.

ඛ. <u>තොරතුරු තාක්ෂණ අංශය</u>

(1) සමාලෝචනය කරන ලද කාල සීමාව තුළ, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රක්ෂේපණය අනුව තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු කිරීම සහ තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් පහත සඳහන් ප්‍රධාන වියදම් දරනු ලැබීය.

විස්තර	මුදල (ලං.රු.මි.)
ප්‍රාග්ධන වියදම්	83.65
පුනරාවර්තන වියදම්	68.68
එකතුව	**152.33**

වගුව-16

(2) 2023 වසරේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකයේ ව්‍යාපෘති විස්තර.

(අ) මෘදුකාංග යෙදවුම් වැඩි දියුණු කිරීම.

i. ක්‍රීඩා සංචිත කළමනාකරණ පද්ධතිය.
ii. F540 පද්ධතිය.
iii. බලශක්ති පරිභෝජන පද්ධතිය.
iv. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය.
v. සේවා මුක්ත භට සංගමයේ වෙබ්.
vi. වාහන විමෝචන පරීක්ෂණ භාර අරමුදල (VET.lk).
vii. ගුවන් සම්මන්ත්‍රණය A & A පද්ධතිය.
viii. විවෘත ස්කොෂ් වෙබ්.
ix. Eagles Leisure Portal.
x. Return Management System.
xi. මුඛ සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය.
xii. රේඩාර් නියාමන කළමනාකරණ පද්ධතිය.
xiii. ගුවන් යානා අලුත්වැඩියා කළමනාකරණ පද්ධතිය.
xiv. පැමිණීමේ නිෂ්කාශන කළමනාකරණ පද්ධතිය.
xv. පියාසර පැය කළමනාකරණ පද්ධතිය.
xvi. විදේශ ගෙවීම් කළමනාකරණ පද්ධතිය.
xvii. ඉපයීම් අඩුකිරීම් කළමනාකරණ පද්ධතිය.
xviii. ජාතික රසායනික අවි සම්මුතිය (NACWC).

(ආ) ගුවන් හමුදා සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

i. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම වෙබ් අඩවි අතථ්‍ය ක්ලවුඩ් වේදිකාවකට සංක්‍රමණය කරන ලදී.

ii. කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව ක්ලවුඩ් ෆ්ලෙයාර් ෆයර්වෝලය ප්‍රශස්ත කර සියුම් ලෙස සකස් කර සයිබර් තර්ජන අවම කිරීම වැඩි දියුණු කරයි.

iii. ඉලක්කගත සයිබර් ප්‍රහාර සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ විවිධ රාජ්‍ය ආයතන වෙත පූර්ව අනතුරු ඇඟවීම් ලබා දී ඉන්දුනීසියානු හැකර්වරුන්ගේ ප්‍රහාරයක් සාර්ථකව අවහිර කිරීම.

iv. ජනාධිපති නිල වෙබ් අඩවිය සහ ජනාධිපති ලේකම් කාර්යාල වෙබ් අඩවි සඳහා අවදානම් තක්සේරු කිරීම් සිදු කරන ලදී.

v. ජනාධිපතිවරයාගේ වෙබ් අඩවිය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ඇතුළුව තීරණාත්මක රාජ්‍ය ආයතන වෙබ් අඩවි 24x7x365 අධීක්ෂණය සපයා ඇත.

vi. ශ්‍රී ජයවර්ධනපුර ගුවන් හමුදා මූලස්ථානයෙහි සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයේ රූපවාහිනී අධීක්ෂණ පුවරුව සාර්ථකව නිම කරන ලදී.

vii. සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (CSOC) කාර්ය මණ්ඩලය තුළ අනවසරයෙන් ඇතුළුවීමේ අභියෝගයක් කාර්යක්ෂමව සම්බන්ධීකරණය කරන ලදී.



viii. ශ්‍රී ලංකාවේ රසායනික අවි සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන ජාතික අධිකාරිය සඳහා SLT Cloud වේදිකාවේ නව වෙබ් සේවාදායකයක් ස්ථාපිත කරන ලදී.

ග. <u>ප්‍රසාංගික කලා අංශය</u>

සමාලෝචනය කරන ලද කාල සීමාව තුළ, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කරන ලද ප්‍රක්ෂේපණය අනුව ප්‍රසාංගික කලා අධ්‍යක්ෂකය විසින් පහත සඳහන් ප්‍රධාන වියදම් දරා ඇත.

විස්තර	මුදල (ලං.රු.මි)
ප්‍රාග්ධන වියදම්	
ගුවන් හමුදා තූර්ය වාදක කණ්ඩායම සඳහා සංගීත භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම	5.70
සුළු මිලදී ගැනීම් (SVP) ප්‍රතිපාදන (අලුත්වැඩියා)	0.17
එකතුව	**5.87**

වගුව-17

ඝ. <u>මාධ්‍ය අංශය</u>

2023 වර්ෂයේ මාධ්‍ය අංශයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

(1) 2023 වර්ෂය තුළ මුළු මාධ්‍ය ආවරණ ක්‍රියාකාරකම් සංඛ්‍යාව පහත පරිදි වේ.

		ගණන
(අ)	පුවත්පත් ලිපි	- 1,740
(ආ)	වෙබ් පුවත්	- 797
(ඇ)	රූපවාහිනී පුවත්	- 1,376
(ඈ)	විශේෂ උත්සව සඳහා මාධ්‍ය ආරාධනා	- 26
(ඉ)	ඡායාරූප සහ වීඩියෝ ආවරණයන්	- 560
(ඊ)	නිවේදනය කිරීමේ අවස්ථා	- 46
(උ)	වීඩියෝ වාර්තා චිත්‍රපට	- 264
(ඌ)	පුවත් ක්ලිප්	- 828

(2) මාධ්‍ය අංශය පුළුල් කිරීම.

මෙම අංශය මගින් නවීන තාක්ෂණයෙන් යුත් නව කැමරා උපකරණ මිලදී ගෙන 2023 වර්ෂය තුළ මහජන මාධ්‍ය වේදිකාවල ගුවන් හමුදාවේ ප්‍රතිරූපය නංවාලීම සඳහා උසස් තත්ත්වයේ නිෂ්පාදනයක් භාවිත කරන ලදී.

(3) සියලු තොරතුරු කළමනාකරණය සහ මුද්‍රා හැරීම.

2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදා වෙබ් අඩවිය ඇතුළුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර/බාහිර ක්‍රියාකාරකම්වලට අදාළව ප්‍රවෘත්ති ලිපි 4,513 ක් ජන මාධ්‍ය තුළ ප්‍රකාශයට පත් කර ඇත. මාධ්‍ය අංශය විසින් 2023 වර්ෂය තුළදී ආසන්න වශයෙන් ප්‍රවෘත්ති ලිපි 1,740ක් පමණ බාහිර මාධ්‍ය ආයතන වෙත යවා ඇති අතර සියලුම ප්‍රාදේශීය පුවත්පත් ආයතන ඔවුන්ගේ ප්‍රකාශනවල ඒවා ප්‍රකාශයට පත් කර ඇත.

(4) ගුවන් හමුදාවේ ප්‍රතිරූපය ගොඩනැගීමේ ක්‍රියාකාරකම්.

ප්‍රචාරණය හැර අනෙකුත් සාමාන්‍ය මාධ්‍ය හරහා ගුවන් හමුදාවේ ප්‍රතිරූපය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

(අ) විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා මාධ්‍ය ප්‍රචාරණය ලබා ගැනීම සඳහා ගුවන් හමුදා ආයතන තුළ පවත්වන ලද සමස්ත සිදුවීම් 26ක් සඳහා මාධ්‍ය අංශය සිවිල් මාධ්‍යවේදීන්ට ආරාධනා කරන ලදී.

(ආ) සියලුම මාධ්‍යවේදීන් නිසි ලෙස පිළිගනු ලැබූ අතර නිසි සැලකිල්ලෙන් සලකනු ලැබීය.

(5) ගුවන් හමුදා වෙබ් අඩවිය කළමනාකරණය.

ගුවන් හමුදාපතිතුමාගේ සෘජු උපදෙස් ඇතිව මාධ්‍ය අංශය විසින් වසර තුළ ගුවන් හමුදා වෙබ් අඩවියේ ගුවන් හමුදා ප්‍රවෘත්ති ලිපි 797ක් ප්‍රකාශයට පත් කරන ලදී.

(6) තොරතුරු බෙදා හැරීම

විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් වැදගත් ශ්‍රීලංගුහ/ජාතික සිදුවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තරව තොරතුරු බෙදා හැරීම පහත පරිදි සිදු කරන ලදී.

(අ) මාධ්‍ය අංශය විසින් www.airforce.lk හි පළ කරන ලද සියලුම වෙබ් පුවත් අන්තර් වෙබ් (intraweb.slaf.int) හි එකවර ප්‍රකාශයට පත් කරන ලදී.

(7) සුහද සබඳතා පවත්වා ගැනීම.

මාධ්‍ය අංශය විසින් ගුවන් හමුදාව තුළ නිවේදන සංචිතය සම්බන්ධීකරණය කිරීම සහ සියලුම ගුවන් හමුදා ආයතන තුළ ගුවන් හමුදා ඉසව් 43ක් සඳහා සවිස්තරාත්මක නිවේදන සම්බන්ධීකරණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

(8) ජාත්‍යන්තර/දේශීය මාධ්‍ය නියාමනය. මාධ්‍ය අංශය වෙබ් අඩවි ඇතුළුව ගුවන් හමුදාව පිළිබඳ ජාත්‍යන්තර/දේශීය මාධ්‍ය මතය අධීක්ෂණය කරයි.

(අ) මාධ්‍ය අංශය විසින් සියලුම දේශීය පුවත්පත්, සියලුම රූපවාහිනී නාලිකා සහ ජාත්‍යන්තර වෙබ් අඩවි දිනපතා අධීක්ෂණය කරන අතර මාධ්‍ය ප්‍රතිචාර සහ ප්‍රවණතා ගුවන් හමුදාපතිවරයා වෙත දැනුම් දෙයි.

(ආ) මෙම අංශය විසින් ගුවන් හමුදාවට අදාළව ප්‍රකාශයට පත් කරන ලද සියලුම ලිපි විශ්ලේෂණය, එහි ක්‍රියාකාරකම් සහ සුදුසු ප්‍රතිචාර ගුවන් හමුදාපතිවරයාගේ නියෝග සමඟ සම්බන්ධීකරණය කරයි.

(ඇ) මාධ්‍ය අංශය මගින් දෛනික පුවත් ලිපි පහසුවෙන් උඩුගත කිරීමට සහ ප්‍රවෘත්ති පහසුවෙන් සමාලෝචනය කිරීමට හැකි වන පරිදි දත්ත ගබඩාවක් පවත්වාගෙන යයි.

(9) වැඩසටහන් නිවේදනය සම්බන්ධීකරණය

මාධ්‍ය අංශය විසින් ගුවන් හමුදාව තුළ නිවේදන සංචිතය සම්බන්ධීකරණය කිරීම සහ සියලුම ගුවන් හමුදා ආයතන තුළ ගුවන් හමුදා ඉසව් 43ක් සඳහා සවිස්තරාත්මක නිවේදන සම්බන්ධීකරණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

(10) වීඩියෝ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අවශ්‍ය පරිදි වීඩියෝ වාර්තා චිත්‍රපට, රූපවාහිනී වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම. ඉතිහාස වාර්තා චිත්‍රපට, ගුවන් හමුදා සංවත්සරය, තේමා ගීතය,පදක්කම් පැළඳවීමේ උත්සවය සහ ක්‍රීඩා ආශ්‍රිත වාර්තා චිත්‍රපට ඇතුළුව වාර්තා චිත්‍රපට 265ක් 2023 දී නිෂ්පාදනය කරන ලදී.

(11) වීඩියෝ සහ ඡායාරූප ආවරණ සහාය.

ගුවන් හමුදාව තුළ සහ පිටත ගුවන් හමුදා විශේෂ සිදුවීම් 560ක වීඩියෝ සහ ඡායාරූපකරණය සඳහා ආවරණ සහාය ලබා දෙන ලදී.

(12) පෙළපාලි වල මාධ්‍ය ආවරණය හැසිරවීම.

සහිත ප්‍රධාන පෙළපාළි තුනක වීඩියෝ සහ ඡායාරූප ආවරණය මාධ්‍ය අංශය විසින් මෙහෙයවීය.

ණ. <u>ක්‍රීඩා අංශය</u>

(1) අරමුදල් සහ සම්පත් කළමනාකරණය.

(අ) අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය උපාංග සහිත ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන අරමුදල් ඵලදායී ලෙස පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ ඒවා නිසි නඩත්තුව සහ ගිණුම්කරණය සහතික කරමින් සුදුසු විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර වෙත බෙදා හැරීම.

(ආ) මිලදී ගැනීමේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පෙර සුදුසු ශීර්ෂය යටතේ ප්‍රමාණවත් අරමුදල් ඇති බව සහතික කර ගැනීම

(ඇ) අරමුදල් තත්වය නිතිපතා අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය විටෙක පරිපූරක/ඡන්ද මාරු කිරීම් සඳහා ඉල්ලීම් කල්තියා ආරම්භ කිරීම.

(2) 2023 වර්ෂය තුළ දී පහත ක්‍රීඩා අයිතම අත්පත් කරගන්නා ලදි.

විස්තර	මුදල (ලං.රු.මි.)
ක්‍රීඩා අයිතම	5.10
ක්‍රීඩා සේවා	13.10
ක්‍රීඩා උපකරණ	2.10
එකතුව	**20.30**

වගුව-18

ත. <u>දන්ත වෛද්‍ය සේවා අංශය</u>

(1) 2023 වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ පුනරාවර්තන වියදම් පහත පරිදි වේ.

අනු/අංකය	අයිතමය	මුදල (ලං.රු.මි.)
01	දන්ත වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	7.90
02	දන්ත උපකරණ අළුත්වැඩියා කිරීම	2.50
03	දන්ත වෛද්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම	15.62
එකතුව		**26.02**

වගුව-19

(2) 2023 වර්ෂය තුළ ප්‍රතිකාර සාරාංශය.

රෝගීන්ගේ වර්ගය	සිදු කරන ලද ප්‍රතිකාර සංඛ්‍යාව	රෝගීන් සංඛ්‍යාව
සේවා පුද්ගලයින්, සේවා පුද්ගල පවුල් සහ සිවිල් පුද්ගලයින්	37,949	23,599

වගුව-20

(3) 2023 වසරේ ජංගම දන්ත සායන.

2023 වර්ෂයේදී ගුවන් හමුදා දන්ත වෛද්‍ය අංශය පහත සඳහන් ස්ථානවල ජංගම දන්ත සායන සහ මුඛ රෝග නිවාරණ වැඩසටහන් පවත්වමින් ග්‍රාමීය ජනතාවගේ දන්ත සෞඛ්‍ය සංවර්ධනයට දායක විය.

ස්ථානය	දිනය	රෝගීන් සංඛ්‍යාව	සිදු කරන ලද ප්‍රතිකාර සංඛ්‍යාව
"සතුට ළමා නිවාසය" සාලියපුර, අනුරාධපුර	2023.11.07	23	26
සේරුවාවිල විහාරස්ථානය	2023.10.08	50	48

වගුව-21

(4) මුඛ නිවාරණ සෞඛ්‍ය වැඩසටහන්.

මුඛ රෝග බොහෝ විට සැඟවී ඇති අතර නොපෙනී යයි, නැතහොත් ඒවා ජීවිතයේ හා වයසට යාමේ නොවැළැක්විය හැකි ප්‍රතිවිපාකයක් ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත්, මුඛ රෝග නොවැළැක්විය බවට පැහැදිලි සාක්ෂි ඇත, නමුත් තනි පුද්ගල හා ජනගහන මට්ටමින් පාඨමාලාවේ සෑම අදියරකදීම සරල හා ඵලදායී පියවරයන් මගින් අඩු කිරීම හෝ වළක්වා ගත හැකිය. එබැවින් පහත වැඩසටහන් සකස් කර ඇත.

(අ) වාර්ෂික දන්ත පරීක්ෂාව.

(ආ) නිවාරණ සත්කාර වැඩසටහන.

(ඇ) විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.

(ඈ) පුහුණුව.

(ඉ) මුඛ පිළිකා සහිත/ OPMD/ ඉහළ දිරාපත් වීමේ අවදානමක් ඇති පුද්ගලයින් සඳහා විශේෂ ලේඛනය.

(ඊ) වාර්ෂික දන්ත පරීක්ෂාව, ගුවන් කාර්ය මණ්ඩල දන්ත පරීක්ෂාව සහ පූර්ව මරණ පිළිබඳ දත්ත පද්ධති.

ද. <u>ප්‍රධාන බඳවා ගැනීමේ කාර්යාලය</u>

2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට පුද්ගලයන් 1,310ක් බඳවාගෙන ඇති අතර ඉන් 18 දෙනෙකු සෘජු ප්‍රවේශ වෘත්තීය නිලධාරීන් වන අතර 117ක් නිලධාරි ශිෂ්‍යභට සහ කාන්තා නිලධාරිනියන් වන අතර 1,175ක් සෙසු නිලයින් වේ.

බඳවා ගැනීමේ ස්වභාවය	බඳවාගත් සංඛ්‍යාව
සෘජු ප්‍රවේශ වෘත්තීය නිලධාරීන්	18
කැඩෙට් නිලධාරි සහ කාන්තා කැඩෙට් නිලධාරි	117
ගුවන්භට	778
ගුවන් කාන්තා	397
එකතුව	**1,310**

වගුව-22

න. <u>නීති අංශය</u>

2023 වසර තුළ නීති අංශයේ කාර්ය සාධනය.

(අ) සාමාන්‍ය නෛතික කටයුතුවලට අමතරව, ගැටුම් සහ සාම කාලවලදී ත්‍රිවිධ හමුදාවට සම්බන්ධ වීමේ නීති රීති සකස් කිරීමේදී නීති අංශය මගින් ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරන ලදි.

(ආ) ආරක්ෂක විද්‍යාල පනත් කෙටුම්පත, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යනාදී පවතින නීති සංශෝධනය කිරීම සඳහා ද නිරීක්ෂණ සැපයීම ද නීති අංශය විසින් සිදු කරන ලදි.

ප. <u>අභ්‍යන්තර විගණන අංශය</u>

(1) වර්ෂය තුළ අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක (සේවා) ගේ කාර්ය සාධනය

(අ) හදිසි විගණනය.

i. 2023 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් විශේෂයෙන් පහත සඳහන් ක්ෂේත්‍රවල රාජ්‍ය මූල්‍ය විගණනය ආවරණය වන පරිදි විගණන කටයුතු සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය, කඳවුරු සහ ස්ථානවල හදිසි විගණන චාරිකා සිදු කර ඇත.

(i) රාජ්‍ය පරිපාලනය.

(ii) මහජන අග්‍රිමය හැසිරවීම.

(iii) සැපයුම්.

(iv) යාන්ත්‍රික ප්‍රවාහනය.

(v) මූල්‍ය පද්ධති සංවර්ධනයේ වැඩිදියුණු කිරීම්.

ii. 2023 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද හදිසි විගණන චාරිකා පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංකය	විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර	විගණන සංචාරයේ දිනය	වාර්තාව යැවූ දිනය
1	ශ්‍රීලංගුහ ඇකඩමිය චීනවරාය	2023 ජනවාරි 16 සිට 2023 ජනවාරි 27 දක්වා	2023 පෙබරවාරි 10
2	ශ්‍රීලංගුහ කඳවුර මොරවැව	2023 ජනවාරි 30 සිට 2023 පෙබරවාරි 03 දක්වා	2023 පෙබරවාරි 24
3	ශ්‍රීලංගුහ වෘත්තිය පුහුණු පාසල ඒකල	2023 පෙබරවාරි 06 සිට 2023 පෙබරවාරි 10 දක්වා	2023 පෙබරවාරි 28
4	ශ්‍රීලංගුහ කඳවුර මීරිගම	2023 පෙබරවාරි 13 සිට 2023 පෙබරවාරි 17 දක්වා	2023 මාර්තු 05

5	ශ්‍රීලංගුහ කඳවුර බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	2023 පෙබරවාරි 20 සිට 2023 පෙබරවාරි 24 දක්වා	2023 මාර්තු 23
6	ශ්‍රීලංගුහ කඳවුර අම්පාර	2023 මාර්තු 13 සිට 2023 මාර්තු 17 දක්වා	2023 අප්‍රේල් 10
7	ශ්‍රීලංගුහ කඳවුර මඩකලපුව	2023 මාර්තු 27 සිට 2023 මාර්තු 31 දක්වා	2023 අප්‍රේල් 12
8	ශ්‍රීලංගුහ මූලික කඳවුර අනුරාධපුර	2023 මාර්තු 22 සිට 2023 මාර්තු 31 දක්වා	2023 අප්‍රේල් 21
9	ශ්‍රීලංගුහ දියතලාව සටන් පුහුණු පාසල	2023 මැයි 08 සිට 2023 මැයි 12 දක්වා	2023 ජුනි 22
10	ශ්‍රීලංගුහ කඳවුර පිදුරුතලාගල	2023 මැයි 15 සිට 2023 මැයි 18 දක්වා	2023 ජුනි 22
11	ශ්‍රීලංගුහ කඳවුර සීගිරිය	2023 මැයි 29 සිට 2023 ජුනි 02 දක්වා	2023 ජූලි 04
12	ශ්‍රීලංගුහ කඳවුර පලාලි	2023 ජුනි 05 සිට 2023 ජුනි 09 දක්වා	2023 ජූලි 07
13	ශ්‍රීලංගුහ කඳවුර පාලවි	2023 ජූනි 20 සිට 2023 ජූනි 23 දක්වා	2023 ජූලි 10
14	ශ්‍රීලංගුහ කඳවුර වීරවිල	2023 ජුනි 19 සිට 2023 ජුනි 23 දක්වා	2023 ජූලි 14
15	ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන	2023 ජුනි 26 සිට 2023 ජූලි 07 දක්වා	2023 අගෝස්තු 11
16	ශ්‍රීලංගුහ කඳවුර ඉරණමඩු	2023 අගෝස්තු 07 සිට 2023 අගෝස්තු 11 දක්වා	2023 සැප්තැම්බර් 05
17	ශ්‍රීලංගුහ කඳවුර මුලතිව්	2023 අගෝස්තු 13 සිට 2023 අගෝස්තු 17 දක්වා	2023 සැප්තැම්බර් 05
18	ශ්‍රීලංගුහ කඳවුර කොළඹ	2023 ජූලි 24 සිට 2023 අගෝස්තු 10 දක්වා	2023 සැප්තැම්බර් 11
19	ශ්‍රීලංගුහ මූලික කඳවුර වවුනියාව	2023 ඔක්තෝබර් 04 සිට 2023 ඔක්තෝබර් 13 දක්වා	2023 ඔක්තෝබර් 27
20	ගුවන් හමුදා රෙජිමේන්තු පුහුණු පාසල වන්නි	2023 ඔක්තෝබර් 23 සිට 2023 ඔක්තෝබර් 27 දක්වා	2023 නොවැම්බර් 16
21	ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක	2023 ඔක්තෝබර් 23 සිට 2023 නොවැම්බර් 03 දක්වා	2023 නොවැම්බර් 28
22	ශ්‍රීලංගුහ කඳවුර කොග්ගල	2023 නොවැම්බර් 06 සිට 2023 නොවැම්බර් 10 දක්වා	2023 දෙසැම්බර් 01
23	ශ්‍රීලංගුහ කඳවුර කටුකුරුන්ද	2023 නොවැම්බර් 20 සිට 2023 නොවැම්බර් 24 දක්වා	2023 දෙසැම්බර් 15

24	ශ්‍රීලංගුහ මූලික කඳවුර හිඟුරක්ගොඩ	2023 නොවැම්බර් 28 සිට 2023 දෙසැම්බර් 08 දක්වා	2023 දෙසැම්බර් 27

වගුව-23

(ආ) මූල්‍ය විගණනය

i. අභ්‍යන්තර විගණන අංශය(සේවා) විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/සියලු මූලික කඳවුරු සහ ස්ථානයන් (ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආයතන 24) හි සියලුම අග්‍රිම ගිණුම් පිළිබඳ විගණනය මාසිකව සිදු කරන ලද අතර එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා (එජාස) උප අග්‍රිම ඇතුළුව (සියලු ගෙවීම්, රිසිට්පත් සහ බැංකු සැසඳුම්) මහජන මුදල් හැසිරවීමේදී රාජ්‍ය මූල්‍ය ආවරණය කරමින් මූල්‍ය රෙගුලාසි (FR), රජයේ චක්‍රලේඛ සහ ගුවන් හමුදා නියෝග (AFOs) මත පදනම් වූ නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, රාජ්‍ය මුල්‍ය කළමනාකරණයේ සඵලතාව වැඩිදියුණු කිරීම සහ පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් පරිපාලන (DGA) වෙත යොමු කරනු ලැබ ඇත.

ii. ගෙවීම් වවුචර් සහ බැංකු සැසඳුම් ප්‍රකාශ (ශ්‍රීලංගුහ ප්‍රධාන ගිණුම) පිළිබඳ විගණනය.

(i) ශ්‍රීලංගුහ ගෙවීම් වවුචර් (ශ්‍රීලංගුහ ප්‍රධාන ගිණුම) පිළිබඳ විගණනය.

කාල සීමාව	වාර්තාව යැවූ දිනය
2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර්	2023 පෙබරවාරි 24
2023 ජනවාරි	2023 මාර්තු 21
2023 පෙබරවාරි	2023 ජුනි 28

වගුව -24

(ii) බැංකු සැසඳුම් ප්‍රකාශ (ශ්‍රීලංගුහ ප්‍රධාන ගිණුම).

කාල සීමාව	වාර්තාව යැවූ දිනය
2023 ජනවාරි	2023 මාර්තු 21
2023 මාර්තු	2023 ජුනි 07

වගුව -25

iii. 2023 වර්ෂය තුළ රාජ්‍ය ප්‍රසම්පාදන විගණනය පිළිබඳ විගණනය.

කාල සීමාව	විස්තරය	වාර්තාවේ දිනය
වසර 2022 සිව්වන වැනි කාර්තුව	දේශීය ප්‍රසම්පාදන	2023 මාර්තු 23
වසර 2022 සිව්වන වැනි කාර්තුව	දේශීය ප්‍රසම්පාදන	2023 අප්‍රේල් 21
වසර 2023 පළමු කාර්තුව	දේශීය ප්‍රසම්පාදන	2023 ජූලි 14
වසර 2023 දෙවන සහ තෙවන කාර්තු	දේශීය ප්‍රසම්පාදන	2023 දෙසැම්බර් 15

වගුව -26

iv. 2023 වසර තුළ ගබඩා සත්‍යාපන විගණනය.

අනු අංකය	විද්‍යාපීඨය/ මූලික කඳවුර/ කඳවුර	විගණනය සඳහා පැමිණෙන දිනය	වාර්තාව යැවූ දිනය
01	ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක - සැපයුම් සහ නඩත්තු ඩිපෝව	2023 පෙබරවාරි 13 සිට 2023 මාර්තු 03 දක්වා	2023 අප්‍රේල් 06
02	ශ්‍රීලංගුහ කටුනායක මූලික කඳවුර - සැපයුම් සහ නඩත්තු ඩිපෝව	2023 ජූනි 05 සිට 2023 ජූනි 15 දක්වා	2023 ජූලි 07
03	ශ්‍රීලංගුහ මූලික කඳවුර හිඟුරක්ගොඩ - සැපයුම් සහ නඩත්තු ඩිපෝව	2023 සැප්තැම්බර් 18 සිට 2023 සැප්තැම්බර් 22 දක්වා	2023 ඔක්තෝබර් 16
04	ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක - සැපයුම් සහ නඩත්තු ඩිපෝව	2023 ඔක්තෝබර් 02 සිට 2023 ඔක්තෝබර් 20 දක්වා	2023 නොවැම්බර් 17

වගුව -27

v. 2023 වර්ෂය තුළ වැටුප් සම්බන්ධ විගණනය.

විස්තරය	වාර්තාව යැවූ දිනය
වැටුප් ගෙවීම සන්සන්දනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 මාර්තු 23
වැටුප් ගෙවීම සන්සන්දනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 ජූලි 14
තත්‍ය කාර්ය මණ්ඩලය සහ ගෙවන ලද පිරිස් සංඛ්‍යාව පිළිබඳ සැසඳීමේ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 සැප්තැම්බර් 12

වගුව -28

vi. විගණනය කරන ලද ගුවන් හමුදා අත්තිකාරම් "බී" ගිණුම.

විගණනය කළ කාල සීමාව	වාර්තාව යැවූ දිනය
2023 අප්‍රේල් 17 සිට 2023 අප්‍රේල් 28 දක්වා	2023 ජූනි 07
2023 දෙසැම්බර් 12 සිට 2023 දෙසැම්බර් 27 දක්වා	2024 ජනවාරි 08

වගුව -29

vii. මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණනය.

විස්තර	වාර්තාව යැවූ දිනය
පරිගණකගත තොරතුරු පද්ධති (CIS) පරිසරයක විගණනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 අප්‍රේල් 21
2022 මූල්‍ය ප්‍රකාශය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාව	2023 මැයි 17
2023 ලංකා බැංකුවේ විදේශ මුදල් බැංකු ඒකකයේ ගිණුම් අංක 3947119 හි වියදම් විගණනය කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - 2021 සැප්තැම්බර් සිට 2023 ජූනි දක්වා කාලය	2023 අගෝස්තු 28
ආදායම් ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (ආදායම් කේතය 20.03.02.16) 2022 අප්‍රේල් සිට 2023 සැප්තැම්බර් දක්වා වාණිජ ගුවන් ගමන් ආදායම	2023 නොවැම්බර් 02

වගුව -30

(ඇ) අනුකූලතා විගණනය.

i. අභ්‍යන්තර විගණන අංශය (සේවා), විසින් 2024 වර්ෂය සඳහා "වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම" සකස් කර විගණන හා කළමනාකරණ කමිටුවේ (AMC) අනුමැතිය ලබාගෙන එය, අංක DMA/AMC/2017/5/5 හා 21 ජූනි 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව විගණකාධිපතිට ද පිටපතක් සහිතව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත වෙත ඉදිරිපත් කර ඇත.

ii. අභ්‍යන්තර විගණන අංශය (සේවා), විසින් 2023 වර්ෂය සඳහා කළමනාකරණ විගණන චක්‍රලේඛය DMA/ 01-2019 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (AAP) සහ ප්‍රසම්පාදන සැලැස්මට අනුව සත්‍ය කාර්ය සාධනය පිළිබඳ කාර්තුමය පදනම මත ප්‍රගති සමාලෝචනය සිදු කරන ලදී.

iii. 2023 වර්ෂයේදී, අභ්‍යන්තර විගණන අංශය (සේවා), විසින් මාසික විගණන වාර්තා සැකසීමේ නිරත වී ඇති අතර භාණ්ඩාගාර චක්‍රලේඛ සහ මූල්‍ය රෙගුලාසි (FR) අනුව පහත සඳහන් ආයතන වෙත යොමු කර ඇත.

(i) විගණකාධිපති
(ii) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

iv. 2023 වර්ෂයේදී, අභ්‍යන්තර විගණන අංශය (සේවා) විසින් කාර්තුමය විගණන වාර්තා සැකසීමේ නිරත වී ඇති අතර 21 මාර්තු 19 දිනැති හා අංක DMA/RIAR/AQ/L/2021/01 දරන ලිපියට අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

v. අභ්‍යන්තර විගණන අංශය (සේවා) ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණකගේ කාර්තුමය තක්සේරු වාර්තාව සැකසීමේ නිරත වී ඇති අතර කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව පහත ආයතන වෙත යොමු කර ඇත.

(i) භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
(ii) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

(ඇ) කාර්ය සාධන විගණනය

i. මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචනය.

ii. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගති සමාලෝචනය.

(ඉ) ආරක්ෂක අමාත්‍යාංශයට ලබා දී ඇති විශේෂ අභ්‍යන්තර විගණන වාර්තා.

විස්තර	වාර්තාව යැවූ දිනය
සඳහිරු සෑය පුණ්‍ය ගිණුම පිළිබඳ 2023 පළමු කාර්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 මැයි 29
සඳහිරු සෑය පුණ්‍ය ගිණුම පිළිබඳ 2023 දෙවන කාර්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 අගෝස්තු 18
දීඝවාපිය අරුණ ගිණුම පිළිබඳ 2023 තෙවන කාර්තුවේ අභ්‍යන්තර විගණන වාර්තාව	2023 දෙසැම්බර් 08

වගුව -31

(ඒ) කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම.

i. 2023 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය (සේවා) විසින් ශ්‍රී ලංකා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ DMA/01/2019 චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි 2023 වසර සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්තුමය විගණන සහ කළමනාකරණ කමිටු (AMC) රැස්වීම පහත පරිදි පවත්වන ලදී.

කාර්තුව	විගණන කළමනාකරණ රැස්වීම පැවැත්වූ දිනය
පළමු කාර්තුව2023	2023 ජුනි 26
2 වන කාර්තුව 2023	2023 අගෝස්තු 31
3 වන කාර්තුව 2023	2023 දෙසැම්බර් 04
4 වන කාර්තුව 2023	2024 පෙබරවාරි 13

වගුව -32

ii. අභ්‍යන්තර විගණන අංශය (සේවා) විසින් 2023 වර්ෂය තුළ පවත්වන ලද AMC හි ඉහත රැස්වීම සඳහා වාර්තාව සකස් කර අදාළ සියලුම කමිටු සාමාජිකයින් අතර බෙදා හැර පසුව, රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් කමිටුව විසින් කරන ලද නිර්දේශ සමාලෝචනය කරන ලදී.



iii. 2023 වර්ෂය තුළ, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පවත්වන ලද කාර්තුමය විගණන කළමනාකරණ රැස්වීම් සඳහා අධ්‍යක්ෂක අභ්‍යන්තර විගණන (සේවා) විසින් පහත සඳහන් පරිදි සහභාගී විය.

කාර්තුව	විගණක කළමනාකරණ රැස්වීම පැවැත්වූ දිනය
පළමු කාර්තුව 2023	2023 ජුනි 02
2 වන කාර්තුව 2023	2023 අගෝස්තු 17
3 වන කාර්තුව 2023	2023 නොවැම්බර් 02

වගුව -33

(ඓ) ගුවන් හමුදාවේ අභ්‍යන්තර පාලන සංවර්ධනයට සහාය වීම.

2023 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (AAP), 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව (APR) සැකසීමට අභ්‍යන්තර විගණන අංශය (සේවා) මගින් සැලකිය යුතු සහයක් සහ දායකත්වයක් ලබා දී ඇත.

(ඖ) විගණකාධිපති විගණන විමසුම්වල පිළිතුරු ලබාදීමේ ප්‍රගතිය.

විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම්වල සාරාංශය සහ 2023 වර්ෂයේ යවන ලද පිළිතුරු පහත පරිදි වේ.

විස්තර	විගණන විමසුම් ගණන
2023 වසර ආරම්භයේදී පිළිතුරු නොදුන් විගණන විමසුම්	03
2023 වර්ෂය තුළ ලැබුණු විගණන විමසුම්	36
2023 වර්ෂය තුළ පිළිතුරු සපයන ලදවිගණන විමසුම්	(37)
2023 වසර අවසානයේ සිදුවෙමින් පැවති විගණන විමසුම් පිළිතුරු	02

වගුව -34

(2) වර්ෂය තුළ අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක (සිවිල්) ගේ කාර්ය සාධනය.

(අ) 2023 වර්ෂය තුළ පහත සඳහන් විගණන පරීක්ෂාව/කාර්යයන් සිදු කර ඇත.

අනු/අංකය	විගණන කටයුතු/ පරීක්ෂණ සාරාංශය	වාර්තා නිකුත් කළ මාසය
01	සිවිල් පරිපාලන කටයුතු පරීක්ෂා කර අදාළ අභ්‍යන්තර පාලනයන් ඇගයීමට ලක් කරන ලදී ක්‍රියා පටිපාටි - (කොටස - 1) (මුදල් අධ්‍යක්ෂක කාර්යාලයේ (කොළඹ) සහ සිවිල් පරිපාලන කාර්යාලය - රත්මලාන)	ජනවාරි
02	වැටුප් ගෙවීම් සහ එහි අභ්‍යන්තර පාලන (සිවිල් කාර්ය මණ්ඩලයේ) විගණනය	පෙබරවාරි
03	දේශීය ප්‍රසම්පාදන සහ අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය.	පෙබරවාරි
04	ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රධාන ගිණුමේ විදේශ ගිණුම සහ එක්සත් ජාතීන්ගේ ගිණුමේ බැංකු සැසඳුම සහ අදාළ ගිණුම් විගණනය කිරීම	මාර්තු
05	සුළු මුදල් අග්‍රිමය කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණනය	මාර්තු
06	ආදායම් ගිණුම් සහ අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය - 2023	මාර්තු
07	පාඩු සහ අත්හැරීම් පිළිබඳ විගණනය (කාර්ය සාධනය සමඟ)	මැයි
08	බැඳීම් සහ බැරකම් පිළිබඳ විගණනය (අවසන් ගිණුම් - 2023)	මැයි
09	<u>කඳවුරු සංචාරය - දියතලාව සටන් පුහුණු පාසල (2023.04.26 සිට 2023.04.29දක්වා)</u> සිවිල් පරිපාලන කාර්යාලය: I කොටස - පුද්ගලික ලිපිගොනු නඩත්තුව පිළිබඳ විගණනය II කොටස - අනෙකුත් සිවිල් පරිපාලන කටයුතු පිළිබඳ විගණනය III කොටස - ඉහත ක්‍රියාකාරකම්වල කාර්ය සාධන විගණනය	ජූනි
10	තැන්පතු ගිණුම් සහ අදාළ ක්‍රියාකාරකම් විගණනය - 2023	ජූනි
11	සිවිල් කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ නිවාඩු ගැනීම පිළිබඳ විගණනය (මුදල් අධ්‍යක්ෂකය)	ජූනි
12	සිවිල් කාර්ය මණ්ඩලයේ ණය ලිපිගොනු පිළිබඳ විශේෂ විගණනය (පරීක්ෂණය).	ජූනි
13	සිවිල් කාර්ය මණ්ඩලයේ අතිකාල ගෙවීම් පිළිබඳ විශේෂ විගණනය (පරීක්ෂණ) (මුදල් අධ්‍යක්ෂකය)	ජූලි
14	සිවිල් කාර්ය මණ්ඩලයේ අතිකාල ගෙවීම් පිළිබඳ විශේෂ විගණනය (පරීක්ෂණ) (මුදල් අධ්‍යක්ෂකය)	ජූලි
15	අත්තිකාරම් "බී" ගිණුම සහ ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය - 2023	ජූලි
16	අවසාන ගිණුම් විගණනය - (පොත් වලින් කපා හැරීමේ ප්‍රකාශය)	සැප්තැම්බර්
17	සුළු මුදල් ගෙවීම්, ප්‍රසම්පාදන සහ ගිණුම්කරණ කටයුතු පිළිබඳ විගණනය	සැප්තැම්බර්
18	ගුවන් හමුදා අවසන් ගිණුම විගණනය - 2023	සැප්තැම්බර්
19	කඳවුරු සංචාරය - චීන වරාය (2023.10.04 සිට 2023.10.08 දක්වා) I කොටස - ගබඩා සහ ගබඩා කළමනාකරණ ක්‍රියාකාරකම් විගණනය II කොටස - ව්‍යාපෘති සහ අදාළ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම	නොවැම්බර්

	III කොටස - මිනින්දෝරු බැඳුම්කර සහ බැහැර කිරීමේ කටයුතු පරීක්ෂා කරන ලදී	
20	බැංකු සැසඳුම් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා බැංකු ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය	දෙසැම්බර්
21	වාහන නඩත්තු හා අලුත්වැඩියා කටයුතු පිළිබඳ විගණනය - (ගුවන්පුර MT අංශය)	දෙසැම්බර්
22	පාඩු පිළිබඳ විගණනය - II කොටස - MT අනතුර	දෙසැම්බර්

වගුව -35

(ආ) අනුකූලතා විගණනය.

i. අභ්‍යන්තර විගණන අංශය (සිවිල්), විසින් 2024 වර්ෂය සඳහා "වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම" සකස් කර විගණන හා කළමනාකරණ කමිටුවේ (AMC) අනුමැතිය ලබාගෙන එය, අංක DMA/AMC/2017/5/5 හා 21 ජූනි 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව විගණකාධිපතිට ද පිටපතක් සහිතව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත වෙත ඉදිරිපත් කර ඇත.

ii. තව ද, අභ්‍යන්තර විගණන අංශය (සිවිල්) විසින්
(i) ශ්‍රීලංගුහහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (AAP) -2023 (කාර්තුමය සහ වාර්ෂිකව)
(ii) ශ්‍රීලංගුහහි වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම-2023 - (කාර්තුමය සහ වාර්ෂිකව)
(iii) ශ්‍රීලංගුහහි ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් 2023 (කාර්තුමය සහ වාර්ෂිකව) ප්‍රගති සමාලෝචනයන් සිදු කරන ලදී

ඛ. <u>විදේශ සබඳතා අංශය</u>

(1) 2023 වසරේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් (මධ්‍යම අප්‍රිකාව) සඳහා යොදවා ඇති ගුවන් හමුදා සාමාජිකයින්ගේ තොරතුරු.

පුද්ගලයින්	පුද්ගලයින් සංඛ්‍යාව
මාණඩලික නිළධාරීන්	03
නිළධාරීන්	21
සෙසු නිළයන්	89
එකතුව	**113**

වගුව -36

(2) මෙහෙයුම් මගින් උත්පාදනය කරන ලද ආදායම (මධ්‍යම අප්‍රිකාව) - 2023.

විස්තරය	ලැබුණු ආදායම (ඇ.ඩො)	ලැබීමට ඇති ආදායම (ඇ.ඩො)
පියාසර පැය	3,453,846.00	4,385,914.30
ප්‍රධාන උපකරණ/ ස්වයං පැවැත්ම සඳහා	656,950.26	80,906.10
එකතුව	**4,110,796.26**	**4,466,820.40**

වගුව -37

(3) එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා වූ මූලධන වියදම් පිළිබඳ විස්තර.

වියදම් වර්ගය	මුදල (රු.)
ප්‍රාග්ධන	162,221,519.20

වගුව -38

2.1.2 දීපව්‍යාප්තව පිහිටා ඇති ශ්‍රීලංගුහ ගුවන් හමුදා විද්‍යායතන/ මූලික කඳවුරු සහ කඳවුරු විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පහත සඳහන් පරිදි වේ.

අ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා චීන වරාය විද්‍යාපීඨය විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 ඔක්තෝම්බර් 15 වන දින චීන වරායේ රේවත ළමා නිවාසයේදී වාර්ෂික දානමය කටයුතතක් පවත්වන ලදී.




(2) 2023 අගෝස්තු 27 දින ශ්‍රමදාන ව්‍යාපාරය නාලන්දා විද්‍යාලයේදී සංවිධානය කරන ලදී.




(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 72 වන සංවත්සරය වෙනුවෙන් 2023 පෙබරවාරි 21 වන දින ත්‍රිකුණාමලය බස් නැවතුම්පල පිරිසිදු කිරීම හා එහි ජල ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම.




ආ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුනායක මූලික කඳවුර විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 පෙබරවාරි 24 වන දින කුරණ දුම්රිය ස්ථානයේදී ශ්‍රමදාන ව්‍යාපාරයක් සියලුම නිලයන් සහ සිවිල් වැසියන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

(2) ජංගම පුස්තකාලය සඳහා අභ්‍යන්තර විදුලි පද්ධතියක් සහිත නව වහලක් ඉදිකර කටුනායක මහා විද්‍යාලයේ සිසුන් වෙත 2023 මාර්ත 01 දින භාර දෙන ලදී.

(3) වත්තල යහපත් එඬේරා සහෝදරියන්ගේ කන්‍යාරාමයේ ශ්‍රී හෘදය දේවස්ථානයේ වාහන නැවැත්වීමේ අංගනයක් ඉදිකරන ලද අතර 2023 දෙසැම්බර් මාසයේදී පල්ලියේ ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කරන ලදී.

ඇ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා රත්මලාන මූලික කඳවුර විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ

(1) මොරටුව චන්ද්‍රසේකර විශේෂ පාසලේ ශ්‍රමදාන ව්‍යාපාරය.





(2) රත්මලාන හින්දු විද්‍යාලයේ ශ්‍රමදාන ව්‍යාපාරය.





ඈ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා අනුරාධපුර මූලික කඳවුර විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 නොවැම්බර් 07 වන දින අනුරාධපුර "සතුට" ළමා නිවාසයේ ළමා ක්‍රීඩා පිටියේ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සහ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

(2) 2023 නොවැම්බර් 07 වන දින අනුරාධපුර "සතුට" ළමා නිවාසයේ දන්ත සායනයක් පවත්වන ලදී.

(3) 2023 නොවැම්බර් 08 දින "සතුට" ළමා නිවාසයේ දානමය වැඩසටහන.

ඉ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා වවුනියා මූලික කඳවුර විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 මාර්තු 07 වන දින 72 වන ගුවන් හමුදා දිනය සමරමින් මඩුකන්ද දළදා විහාරයේ දාන ශාලාවට අමතර කොටසක් ඉදිකර සමාජ සත්කාර ව්‍යාපෘතියක් සිදු කරන ලදී.





(2) 45 වන මූලික කඳවුරු දිනය සමරමින් 2023 ඔක්තෝම්බර් 17 වැනි දින මූලික කඳවුරු රෝහලේදී ලේ දන්දීමේ ව්‍යාපාරයක් පවත්වන ලදී.





ඊ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා හිඟුරක්ගොඩ මූලික කඳවුර විසින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) හිඟුරක්ගොඩ දුම්රිය ස්ථානයේ පිරිසිදු කිරීමේ වැඩ සටහන.





(2) 2023 ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ යටිහල්පතන ප්‍රාථමික විද්‍යාලයේ පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.





උ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා කොළඹ කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත පරිදි වේ

(1) බම්බලපිටිය ශාන්ත මරියා දේවස්ථානයේ අළුත් වැඩියා කටයුතු සහ තීන්ත ආලේප කිරීම.
(2) ගංගාරාම විහාරස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු.
(3) ආනන්ද විද්‍යාලීය රග්බි ක්‍රීඩාංගනයේ වානේ ගොඩනැගිල්ල,වැසිකිළි පද්ධතිය සහ තාප්පය ඉදිකිරීම.
(4) ආනන්ද විද්‍යාලීය කුලරත්න ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු.
(5) මරදාන මහා බෝධි විහාරයේ පින්තාරු කිරීමේ කටයුතු.
(6) බොරැල්ල බෝසෙත ධම්ම නිකේතනයේ තාප්පය ඉදිකිරීම.

උඉ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා පලාලි කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

දිනය	ව්‍යාපෘති විස්තරය	දිනය
2023 ජනවාරි 04	42 වැනි කඳවුරු දින සැමරුම වෙනුවෙන් ලේ දන්දීමේ වැඩසටහනක් ගුවන් හමුදා පලාලි කඳවුරු පරිශ්‍රයේ දී සිදු කරන ලදී.	සිවිල් සමාජය
2023 ජනවාරි 05	පලාලි ගුවන් හමුදා කඳවුර මගින් අක්කරෙයි වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී	සිවිල් සමාජය
2023 පෙබරවාරි 25	චුන්නාකම් වාසුවුහම් නිවාසයේ දෘශ්‍යාබාධිත සිසුන්ට ලිපි ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදාදීම	පාසල් ළමුන්
2023 පෙබරවාරි 27	පුත්තූර්හි වැඩිහිටි සත්කාරක නිවාසයක් අලුත්වැඩියා කිරීම සහ තීන්ත ආලේප කිරීම.	සිවිල් සමාජය

වගුව - 39

එ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා අම්පාර කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) ගුවන් හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ ගෝනාගොල්ල මායාදුන්න විද්‍යාලයට පානීය ජල ව්‍යාපෘතියක් 2023 ජනවාරි 18 දින භාර දෙන ලදී.





(2) 2023 මාර්තු 07 වන දින ගුවන් හමුදා සංවත්සරය සැමරීම නිමිත්තෙන් අම්පාර සරණ වැඩිහිටි නිවාසයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී.





ඒ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා සීගිරිය කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023.02.07 දින නාගලවැව විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා සහාය වීම.

(2) 2023.02.19 දඹුල්ල මූලික රෝහලේදී පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

(3) 2023.02.21 දිගම්පතාන සිරිනාදි විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා සහාය වීම.

(4) 2023.04.04 දින රංගිරි දඹුලු වැඩිහිටි නිවාසයේ පිරිසිදු කිරීමේ වැඩසටහනක් සහ දානමය පුණ්‍යකර්මයක් පැවැත්වීම.

(5) 2023.04.30 දින උමන්දාව විහාරස්ථානයට කොස් ගස් පරිත්‍යාග කිරීම.

(6) 2023.06.05 දින සීගිරිය සිංහ පර්වතය ආශ්‍රිතව පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

(7) 2023.08.07 දින දිගම්පතන පාසල සඳහා වැසිකිළි පහසුකම් ඉදිකිරීම.

ඒ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා පාලවි කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) පල්ලවි එරුක්කලම්පිඩ්ඩි මුස්ලිම් මහා විද්‍යාලයේ පංති කාමර අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.





(2) W/M/M සෝභිත විද්‍යාලයේ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම.





ඔ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා ඉරණමඩු කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 මාර්තු 02 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 73 වන සංවත්සරය සැමරීම නිමිත්තෙන් වට්ටකච්චි සහ රාමනාතපුරම් බස් නැවතුම් දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම සහ තීන්ත ආලේප කිරීම.

(2) 2023 මාර්තු 02 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 73 වන සංවත්සරය සැමරීම සඳහා රාමනාතපුරම් හි ට්‍රයිස්ට් කන්යාරාමයේ සිසුන් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම.

(3) 2023 ජූලි 14 වැනි දින සිවිල් වැසියන් සඳහා වියළි සලාක අසුරන 35ක් පරිත්‍යාග කිරීම.

(4) 2023 ජූලි 14 වන දින කල්මඩුනගර් ප්‍රාථමික පාසලේ සිසුන් සඳහා පාසල් නිල ඇඳුම් 41ක් පරිත්‍යාග කිරීම.

(5) කල්මදුනගර් ප්‍රාථමික පාසලේ, රාමනාතපුරම් පාර පාසලේ සහ මයිනූර්හි ප්‍රාදේශීය මාතෘ සායනයේදී ජූලි 29 වන දින ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.

ඕ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලතිව් කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) මුල්ලිවයික්කාල් නැගෙනහිර රජයේ දෙමළ මිශ්‍ර පාසලේ වැසිකිළි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සහ ජල පද්ධතිය සවි කිරීම.





(2) අක්ෂි සායනය සහ සිවිල් නිලධාරීන්ට ලඟ පෙනීම සඳහා භාවිත කරන උපැස් ලබා දීම.





ඖ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මඩකලපුව කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

දිනය	ව්‍යාපෘති විස්තරය	දිනය
2023 ජනවාරි 19	ගුවන් මිතුදම් ව්‍යාපෘතියේ 50 වැනි අදියර සාර්ථකව නිම කර පානීය ජල ව්‍යාපෘතිය මඩකලපුව පාවට්කොඩිචේන සිරිපුර ගම්මානයේ දී පවරා දෙනු ලැබීය. මෙම උත්සවයේදී අඩු ආදායම්ලාභී පවුල් 35ක් සඳහා වියළි සලාක මල්ලක්ද, ගම්මානයේ පාසල් සිසුන් 31ක් සඳහා අභයාස පොත් බෙදාදීමක්ද සිදුවිය.	පොදු ජනතාව

වගුව - 41

ක. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා වීරවිල කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023.02.18 දින ශ්‍රී සුමේදාරාම බුදුරජ වෙහෙර නාගරවැව ශ්‍රමදාන ව්‍යාපාරය.

(2) 2023.02.24 දින රන්මිණිතැන්න කනිෂ්ඨ විද්‍යාලයේ භාවිතයට ගත නොහැකි පරිගණක අළුත්වැඩියා කිරීම.

(3) තිස්සමහාරාම මූලික රෝහලේ ජල කළමනාකරණ පද්ධතිය 2023.02.24 දින ප්‍රතිසංස්කරණය කිරීම.

ඛ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා කොග්ගල කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

කොග්ගල ගුවන් හමුදා කඳවුර මගින් වතවාන ප්‍රාථමික විද්‍යාලයට පානීය ජල ව්‍යාපෘතියක් සඳා නිම කර භාර දෙන ලදී.





ග. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුකුරුන්ද කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 පෙබරවාරි 14 වන දින කළුතර නාගොඩ රෝහලේ නේවාසික වාට්ටුවක් ප්‍රතිසංස්කරණය කර භාරදීම.





(2) 2023 පෙබරවාරි 02 වන දින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ නාවික හමුදාව එක්ව කළුතර දුම්රිය ස්ථානයේ සිට අවානි හෝටලය දක්වා වෙරළ තීරය පිරිසිදු කරන ලදී.





ඝ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මොරවැව කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 72 වන ගුවන් හමුදා දිනයට අදාළව ගෝමරන්කඩවල රෝහලේ RO පද්ධතිය අලුත්වැඩියා කිරීම.

(2) මොරවැව පිපෙන කැකුළු පෙර පාසලේ වේදිකාව ප්‍රතිසංස්කරණය කිරීම.

(3) මොරවැව ප්‍රදේශයේ පාසල් තුනක ප්‍රතිසංස්කරණ හා පිරිසිදු කිරීමේ වැඩසටහන.

(4) වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන නිලාවේලි වෙරළ තීරයේදී පවත්වන ලදී.

ණ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මීරිගම කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.


(1) බෝතලේ "අපේ ළමයි" විශේෂ අවශ්‍යතා සහිත ළමා ළමා නිවාසයේ මේස සහ පුටු අළුත්වැඩියාව සහ පින්තාරු කිරීමේ කටයුතු සිදු කරන ලදී.




(2) මිනුවන්ගොඩ ඝානාවාස පාසැලේ සේදුම් පරිශ්‍රය ජල සම්පාදනය කර ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී.




(3) මීරිගම දුම්රිය ස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.




ත. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 මාර්තු 02 දින ඇවරිවත්ත මහජන පුස්තකාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු.




(2) 2023 මැයි 26 දින මහරගම අපේක්ෂා රෝහලට ඖෂධ පරිත්‍යාග කිරීම.





ද. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා පිදුරුතලාගල කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 නොවැම්බර් 16 වන දින නුවර එළිය නගරයේ ශ්‍රමදාන ව්‍යාපාරය.





(2) ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කර 2023 අගෝස්තු 29 දින බාරදුන් පදියපැලැල්ල මහා විද්‍යාලයේ අරලිය ශාලාව.





න. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා දියතලාව කඳවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 මාර්තු 06 වැනි දින හෝටන් තැන්නේ ශ්‍රමදාන වැඩසටහන.





(2) 2023 මාර්තු 08 දියතලාව දුම්රිය ස්ථානයේ ශ්‍රමදාන වැඩසටහන.




(3) 2023 මාර්තු 10 වන දින දියතලාව නගරයේ ළමා උද්‍යානය ස්ථාපිත කරන ලදී.





(4) 2023 මාර්තු 31 වන දින බදුල්ල කහටරුප්ප විද්‍යාලය ප්‍රතිසංස්කරණය කිරීම.




ප. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල ඒකල කදවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 පෙබරවාරි 21 සහ 22 යන දෙදින තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 72 වන සංවත්සරය නිමිත්තෙන් කොටුගොඩ ශාන්ත මාටින් වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සහ තීන්ත ආලේප කිරීම සිදු කරන ලදී.

(2) 2023 පෙබරවාරි 27 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 72 වන සංවත්සරය නිමිත්තෙන් කොටුගොඩ රෝමානු කතෝලික පාසලේ ළමා ක්‍රීඩා පරිශ්‍රය නවීකරණය කිරීම සහ පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.





ඛ. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තු පුහුණු පාසල වන්නි කදවුර මගින් සිදු කරන ලද ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1) 2023 පෙබරවාරි 14 වැනි දින සෙංකප්පඩෙයි තිරු කුමාරන් ප්‍රාථමික විද්‍යාලය සඳහා පාසල් පොත් ප්‍රදානය කිරීම.





(2) 2023 පෙබරවාරි 16 වැනි දින පාලයුරුව ප්‍රාථමික විද්‍යාලය සඳහා පාසල් පොත් ප්‍රදානය කිරීම.





(3) ශ්‍රී ලංකා ගුවන් හමුදා වන්නි රෙජිමේන්තු පුහුණු පාසලේ 10 සංවත්සරය සමරමින් ඔක්තෝබර් 27 වන දින මඩු දේවස්ථානය ප්‍රදේශයේ ශ්‍රමදාන ව්‍යාපාරයක් සිදු කරන ලදී.





2.2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2024 - 2030 කාල පරාසය සඳහා වන උපාය මාර්ගික සැලැස්මෙහි අන්තර්ගත ඉලක්ක හා අරමුණු වෙත ලඟා වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව පහත කාර්යයන් ආරම්භ කර ඇත.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ඉලක්කය 01 ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවයන් ඉහල නැංවීම හා ශක්තිමත් කිරීම.	**අරමුණු 1.1** සිවිල් අධිකාරී මෙහෙයුම් සඳහා යුධ ආධාර දීම (MACA) මෙන්ම මිත්‍ර හමුදාවන් සඳහා දිවා/රාත්‍රී හා ඕනෑම කාලගුණික තත්වයක් යටතේ මූලෝපායික, මෙහෙයුම්ගත හා උපායමාර්ගික ගුවන් ප්‍රවාහන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාවයන් වැඩිදියුණු කිරීම.
	අරමුණු 1.2 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර පුහුණුව වැඩිදියුණු කිරීම.
	අරමුණු 1.3 බිම් සංචලනය අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීම.
	අරමුණු 1.4 ගුවන් හමුදාවේ ප්‍රහාරක පාලකවරුන්ගේ (FCs) සහ ගුවන් ගමනාගමන පාලන නිලධාරීන්ගේ (ATCOs) පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම.
	අරමුණු 1.5 ගුවන් යානයේ සේවා හැකියාව පවත්වා ගැනීමට අවශ්‍ය ගොඩබිම් ආධාරක සේවාවන් නිරන්තරයෙන් පවතින බවට සහතික වීම.
	අරමුණු 1.6 උසස් තත්වයේ ගුවන් යානා මගින් ගුවන් හමුදා ගුවන් ආරක්ෂක හැකියාව ශක්තිමත් කිරීම
	අරමුණු 1.7 විශේෂ පුද්ගල/ප්‍රභූ පුද්ගල ප්‍රවාහන හැකියාවන් වැඩි දියුණු කිරීම
	අරමුණු 1.8 ගුවන් හමුදාවේ ගුවන් යානා ඉංජිනේරු හැකියාව වැඩි දියුණු කිරීම.
	අරමුණු 1.9 මෙහෙයුම් විශිෂ්ටත්වය තුළින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සටන් සූදානම සහ මෙහෙවර සඵලතාවය වැඩිදියුණු කිරීම.
ඉලක්කය 02 අනන්‍ය ආර්ථික කලාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුල උපායමාර්ගික හා උපායශීලි ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් සහ ප්‍රදේශ වර්ධනය කිරීම.	**අරමුණු 2.1** මෙහෙයුම් ඔත්තු ආවේක්ෂණ සහ නිරීක්ෂණ භූමිකාවට අතිරේකව නියමුවන් රහිත ගුවන් යානා (UAVs) අත්පත් කර ගැනීම / දේශීය සංවර්ධන විශිෂ්ටත්වය තුළින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සටන් සූදානම සහ මෙහෙවර සඵලතාවය වැඩිදියුණු කිරීම.
	අරමුණු 2.2 සමුද්‍රීය ගුවන් මෙහෙයුම සඳහා සහය දැක්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් යානාවල නිරීක්ෂණ සහ ඔත්තු බැලීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම.
	අරමුණු 2.3 ඔත්තු බැලීමේ සහ නිරීක්ෂණ භූමිකාවට අතිරේකව නියමුවන් රහිත ගුවන් යානා (UAVs) අත්පත් කර ගැනීම
	අරමුණු 2.4 තෝරාගත් ගුවන් අවකාශය තුළ රේඩාර් පාලනය භාවිතා කරමින් ආරක්ෂිත සහ කාර්යක්ෂම ගුවන් ගමනාගමන කළමනාකරණය සහතික කිරීම.
	අරමුණු 2.5 ප්‍රදේශයන්හි රැඳී සිටීම වැඩි කිරීම මගින් රට කෙරෙහි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බලපෑම සහ EEZ/FIR වැඩි දියුණු කිරීම.
ඉලක්කය 03 බාධාවකින් තොරව ගුවන් මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් බල ආරක්ෂාවක් සැපයීම	**අරමුණු 3.1** ගතික ආරක්ෂක අභියෝගවලට මුහුණ දෙන ගොඩබිම් ආරක්ෂක හැකියාවන්හි සමස්ත ඵලදායීතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් පුළුල් ක්‍රියාමාර්ග හරහා ගොඩබිම් ආරක්ෂක යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.
	අරමුණු 3.2 බල ආරක්ෂාව පිළිබඳ විශේෂිත පුහුණුව ඒකාබද්ධ කිරීම මගින් හටයින්ගේ වෘත්තීයභාවය සාක්ෂාත් කර ගැනීම.
	අරමුණු 3.3 විකාශනය වන අභියෝග සහ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ ප්‍රවීණත්වය, කඩිසර බව සහ සූදානම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ඉලක්කගත සහ ආරම්භයන් හරහා විශේෂ බලකායන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ ඉහළ නැංවීම.
ඉලක්කය 04 ජාතික අවශ්‍යතා සඳහා සහය දැක්වීම සඳහා ගුවන්	**අරමුණ 4.1** රජය විසින් ඉල්ලා සිටින විට සහ ජාතිය ගොඩනැගීමේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය.
	අරමුණ 4.2 ගුවන් හමුදාවේ එක්සත් ජාතීන්ගේ සාම සාධක භූමිකාව වැඩිදියුණු කිරීම.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
හමුදා සම්පත් ප්‍රශස්ත කිරීම.	**අරමුණ 4.3** පුද්ගලික ක්‍රියාකරුවන් දිරිමත් කිරීමේ උත්ප්‍රාසයක් ලෙස වාණිජ මගී ප්‍රවාහන මෙහෙයුම්වල අඛණ්ඩව නිරත වීම.
	අරමුණ 4.4 ස්වාභාවික විපත් අවම කිරීම සඳහා සහ සිවිල් බලය සඳහා ආධාර කිරීම සඳහා භූමි සංචලනය වැඩි දියුණු කිරීම.
	අරමුණ 4.5 රජය විසින් ඉල්ලා සිටින විට සහ රසායනික ජීව විද්‍යාත්මක විකිරණ න්‍යෂ්ටික සහ පුපුරණ ද්‍රව්‍ය (CBRNE) තර්ජන වලට එරෙහිව ක්‍රියාකාරී සහභාගීත්වය.
	අරමුණ 4.6 රජය විසින් ඉල්ලා සිටින පරිදි සහ සාම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජන වලදී රජයට සහාය වීමට ක්‍රියාකාරී සහභාගීත්වය.
	අරමුණ 4.7 ගුවන් ගමන් පාලන සංගමය (ATCA) විසින් මෙහෙයවන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් අතරතුර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (BIA) වෙත ගුවන් යානා ආරක්ෂිතව පැමිණීම සහ පිටවීම සහතික කිරීම අරමුණු කරගත් හදිසි සැලැස්ම.
ඉලක්කය 05 ඵලදායිතාව ඉහළ නැංවීම සහ වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පවතින පුහුණු ක්‍රමවේදයන් සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.	**අරමුණ 5.1** සමාලෝචනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීම.
	අරමුණ 5.2 ජාතික සහ ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට සමගාමීව ගුවන් හමුදා පුහුණුව ප්‍රමිතිකරණය කිරීම.
	අරමුණ 5.3 ගුවන් හමුදා ආයතනවල සියලුම ආකාරයේ පුහුණු ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීම.
	අරමුණ 5.4 විශ්වාසනීය ඉගෙනුම් සම්පත් සුරක්ෂිත කර ගනිමින් ගුවන් හමුදා අභ්‍යාසලාභීන් විශිෂ්ටත්වය සඳහා සන්නද්ධ කිරීම.
ඉලක්කය 06 ශ්‍රී ලංකාවේ ගුවන් ආරක්ෂක ආවරණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කිරීම.	**අරමුණ 6.1** සියලුම කාලගුණික තත්ත්වයන් යටතේ ජාතික ගුවන් අවකාශය පුරා පැය 24ම නිරීක්ෂණ සැපයීම සඳහා ජාතික ගුවන් ආරක්ෂක පද්ධතියේ හඳුනාගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම
	අරමුණ 6.2 උසස් ගුවන් යානා සමඟ ගුවන් හමුදා ගුවන් ආරක්ෂක හැකියාව ශක්තිමත් කිරීම.
	අරමුණ 6.3 නවීන තාක්ෂණය අනුවර්තනය කරමින් ජාතික ගුවන් ආරක්ෂක ජාලයේ තීරණ ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම
	අරමුණ 6.4 බාධා කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
	අරමුණ 6.5 ගැඹුරින් ආරක්ෂාව සහතික කිරීම සඳහා ජාතික ගුවන් ආරක්ෂක පද්ධතියේ විනාශ කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
ඉලක්කය 07 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් සූදානම වැඩි දියුණු කිරීම සහ පවත්වාගෙන යාම.	**අරමුණ 7.1** අක්‍රීය කාලය අඩු කිරීම: නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වාහන/උපකරණ ක්‍රියා විරහිත වන කාලය අවම කිරීම.
	අරමුණ 7.2 පුහුණුව සහ නිපුණතා සංවර්ධනය: නවීන උපකරණ සඳහා අවශ්‍ය කුසලතා ඇති බව සහතික කිරීම සඳහා පිරිස් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම
	අරමුණ 7.3 තත්ත්ව සහතිකය: නඩත්තු සහ ඉංජිනේරු ක්‍රියාවලීන්හි උසස් තත්ත්වයේ ප්‍රමිතීන් පවත්වා ගැනීම
	අරමුණ 7.4 පුළුල් සහය සහ කාර්යක්ෂමතා මිනුම හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් සූදානම උපරිම කිරීම
ඉලක්කය 08 ගුවන් හමුදා මෙහෙයුම් සහ ආපදා කළමනාකරණය සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සන්නිවේදන ජාලය වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම.	**අරමුණු 8.1** ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතනවල ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන ජාලය සම්පූර්ණ කිරීමෙන් ජාතික ආපදාවලට මුහුණ දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
	අරමුණු 8.2 ගුවන් හමුදා විදුලි සංදේශ ජාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ඉලක්කය 09 දිවා/රාත්‍රී/සියලුම කාලගුණික තත්ත්ව වලදී මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම හා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථ සංවර්ධනය කිරීම	**අරමුණ 9.1** වත්මන් සහ අනාගත යුධ අවශ්‍යතා මෙන්ම සිවිල් ගුවන් මෙහෙයුම් සඳහා අවශ්‍ය වැඩි දියුණු කිරීම් දැනට පවතින ධාවන පථ සහ ගොඩබෑම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ඇතුළත් කිරීම අතිරික්ත මෙහෙයුම් සැලසුම් සකස් කිරීම.
	අරමුණ 9.2 ගුවන් ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් හමුදා ගුවන් තොටුපලවල නාවික ආධාර, ගොඩබෑමේ ආධාර, ගිනි නිවන, ගුවන් ගමනාගමන පාලනය සහ ගොඩබිම් ආධාරක පහසුකම් සංවර්ධනය කිරීම.
	අරමුණ 9.3 අදාළ ගුවන් හමුදා ආයතනවල අභ්‍යන්තර ගුවන් ක්ෂේත්‍රයන්, නව අත්පත් කර ගැනීම් සහ අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
	අරමුණ 9.4 උපාය මාර්ගික බල ප්‍රතිව්‍යුහගත කිරීම, විධිමත් බඳවා ගැනීම් සහ තාක්ෂණික නවෝත්පාදන හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හැකියාවන් ප්‍රශස්ත කිරීම.
ඉලක්කය 10 බඳවා ගැනීමේ සැලැස්ම සංශෝධනය කිරීම සහ නව තාක්ෂණයන් හඳුන්වාදීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බලකා ව්‍යුහයේ නියම ප්‍රමාණය සාක්ෂාත් කර ගැනීම.	**අරමුණ 10.1** ඉහළ ජාතික අරමුණු සඳහා අවශ්‍ය වන පරිදි සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීම සපුරාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා මානව සම්පතෙහි අයිතිවාසිකම් සහ එහි අරමුණු සහ අරමුණු සපුරාලීම සඳහා බාධාවකින් තොරව සංවිධානාත්මක හැකියාව පවත්වා ගැනීම.
	අරමුණ 10.2 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නියම ප්‍රමාණයේ සේවක සංඛ්‍යාව පවත්වා ගැනීමට අවශ්‍ය මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා බඳවා ගැනීමේ වැඩසටහන් පැවැත්වීම.
	අරමුණ 10.3 සංවිධානයේ ඉලක්ක ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින පද්ධතිවලට නව නවෝත්පාදන සහ තාක්ෂණික ඒකාබද්ධ කිරීම් හඳුන්වා දීම.
	අරමුණ 10.4 කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම තුළින් සාමාන්‍ය සහ සාමාන්‍ය නොවන මෙහෙයුම් ක්‍රියාවලීන් විධිමත් කිරීම.
ඉලක්කය 11 ගුවන් හමුදාව සහ ජාතික වැදගත් ඩිජිටල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම සඳහා අති නවීන තොරතුරු තාක්ෂණ හැකියාවන් ස්ථාපිත කිරීම.	**අරමුණ 11.1** දක්ෂතා සංවර්ධන වැඩසටහන් හා වඩාත් ගැලපෙන භූමිකාවන් සඳහා පුහුණු මාර්ග සමඟ පෙළගැස්වීම සඳහා ඇගයීම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
	අරමුණ 11.2 ශ්‍රී ලංකාවේ තීරණාත්මක යටිතල පහසුකම් සහ තීරණාත්මක ජාල ඉලක්ක කර ගනිමින් සයිබර් තර්ජන සක්‍රීයව හඳුනා ගැනීමේ හැකියාව වැඩි කිරීම
	අරමුණ 11.3 දත්ත ආරක්ෂණ සහ රහස්‍යතා නීති, සහ දත්ත බෙදාගැනීමේ ප්‍රතිපත්තිය.
	අරමුණ 11.4 රාජ්‍ය - පෞද්ගලික, දේශීය, ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම.
	අරමුණ 11.5 දැනට පවතින ගුවන් යානා/ඩ්‍රෝන නවීන GIS/RS හැකියාව ඇති සංවේදක වලින් සන්නද්ධ කිරීම.
	අරමුණ 11.6 අන්තර් ක්‍රියාකාරීත්වය සක්‍රීය කරන සහ නවෝත්පාදනයට අනුබල දෙන භූගෝලීය කුසලතා පවත්වා ගෙන යාම සහ වර්ධනය කිරීම
	අරමුණ 11.7 මෙහෙයුම්/පරිපාලන මූලිකාංග වල කාර්යක්ෂමතාවය සක්‍රීය කිරීම සඳහා පවතින තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම.
	අරමුණ 11.8 ගුවන් හමුදාවේ මෙහෙයුම් සහ උපාය මාර්ගික අවශ්‍යතා සඳහා සහාය වීම සඳහා එහි මෘදුකාංග පද්ධති නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම.
	අරමුණ 11.9 දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා දත්ත ජාලය සහ දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
	අරමුණ 11.10 යටිතල පහසුකම් පිරිවැය අඩු කිරීම සහ පරිමාණය වැඩි දියුණු කිරීම සඳහා cloud පරිගණක තාක්ෂණය ප්‍රේරණය කිරීම.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ඉලක්කය 12 සියලුම ගුවන් හමුදා මෙහෙයුම් හරහා දේශගුණයට අනුවර්තනය වීම, ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර බව ඒකාබද්ධ කිරීම	**අරමුණ 12.1** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහසුකම් සහ මෙහෙයුම්වල පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ කොටස සැලකිය යුතු ලෙස වැඩි කිරීම, සූර්ය, සුළං සහ අනෙකුත් තිරසාර බලශක්ති විසඳුම් ප්‍රවර්ධනය කිරීම මඟින් 2028 වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ක්‍රියාකාරකම් වලින් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට හැකි වීම.
	අරමුණ 12.2 දේශගුණික විපර්යාසවල බලපෑමෙන් ගුවන් හමුදා යටිතල පහසුකම්, උපකරණ සහ පිරිස් ආරක්ෂා කිරීම සඳහා පුළුල් දේශගුණික අනුවර්තන සැලැස්මක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
	අරමුණ 12.3 ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු අවට ප්‍රදේශවල පාරිසරික සංරක්ෂණය සහ ජෛව විවිධත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඵලදායී ලෙස දායක වෙමින්, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාවට දායක වන පරිසර පද්ධති පෝෂණය කිරීම.
ඉලක්කය 13 අතිරේක සුභසාධන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් ගුවන් භටයින්ගේ ඉහළ චිත්ත ධෛර්යය පවත්වා ගැනීම සහ දක්ෂ ශ්‍රම බලකායක් රඳවා තබා ගැනීම.	**අරමුණ 13.1** ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ ආසන්නතම පවුල් සහ විශ්‍රාමික පිරිස් සඳහා මූල්‍ය හා සමාජ ආරක්ෂණය සැපයීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
	අරමුණ 13.2 නව සංකල්ප, ක්‍රියා පටිපාටි සහ පද්ධති හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන, මූල්‍ය, නෛතික සහ සැපයුම් පද්ධති වැඩිදියුණු කිරීම.
	අරමුණ 13.3 ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ සමීපතම පවුල්, විශ්‍රාමික පුද්ගලයින් සහ ඔවුන්ගේ කලත්‍රයන් සඳහා වෛද්‍ය සහ දන්ත වෛද්‍ය සේවා සැපයීම.
	අරමුණ 13.4 ජාතික/ගෝලීයව පිළිගත් ප්‍රමිතීන්ට සමගාමීව ගුවන් හමුදා සාමාජිකයින්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම.
	අරමුණ 13.5 තොරතුරු වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් දැනුවත් සහ නියැලී සිටින පිරිස් පෝෂණය කිරීම, සදාචාරය සහ රඳවා තබා ගැනීම ඉහළ නැංවීම

වගුව - 41

(ආර්ඒයූපී රාජපක්ෂ)

ආර්එස්පි(තෙවරක්), වීඑස්වී, යූඑස්පි, එම්එස්සි (එම්ඕඒ) ඇමරිකා එක්සත් ජනපදය,
එම්එස්සි (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්ඒ අයිඑස් සහ එස් (එක්සත් රාජධානිය),
බීඑස්සි (ආරක්ෂක අධ්‍යයන), එම්අයිඑම් (ශ්‍රී ලංකා), ඒඑම්අයිඒ (ශ්‍රී ලංකා), ආර්සිඩිඑස්, පීඑස්සි

එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

2024 මැයි මස 31 වන දින

03 වන පරිච්ඡේදය

3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එෆිජ්-එන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	තක්ෂ 2023	2022	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එෆිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
10,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	14,705,813	14,591,537	
10,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		14,705,813	14,591,537	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		40,997,546,791	36,887,567,000	එෆිජ්-3
-	තැන්පතු		193,165,263	33,984,559	එෆිජ්-4
245,000,000	අත්තිකාරම් ගිණුම්		269,330,802	313,978,254	එෆිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
245,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		41,460,042,856	37,235,529,813	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
255,000,000	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		41,474,748,669	37,250,121,350	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		17	31	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
255,000,000	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		41,474,748,652	37,250,121,319	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
31,272,000,000	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	31,086,099,958	30,926,058,286	
12,448,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	9,906,000,148	6,439,889,649	එෆිජ්-2(ii)
98,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	78,227,270	68,557,245	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
43,818,300,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		41,070,327,376	37,434,505,180	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
7,084,143,000	වැඩිදියුණු කිරීම්	10	1,203,449,554	3,433,365,915	
6,016,883,025	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,157,237,088	785,281,868	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එෆිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
350,000,000	හැකියා වර්ධනය	14	266,380,306	275,425,355	
803,841,975	වෙනත් මූලධන වියදම්	15	267,522,584	87,874,045	
14,254,868,000	මුළු මූලධන වියදම් (උ)		3,894,589,532	4,581,947,183	
-	තැන්පතු ගෙවීම්		192,843,108	44,988,818	එෆිජ්-4
400,000,000	අත්තිකාරම් ගෙවීම්		373,223,846	229,442,050	එෆිජ්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
400,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		566,066,954	274,430,868	
-	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		45,530,983,862	42,290,883,231	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(4,056,235,210)	(5,040,761,913)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,056,235,210)	(5,040,761,913)	එෆිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එෆිජ්-3
			(4,056,235,210)	(5,040,761,913)	

1

Scanned with CamScanner

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්‍ය 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	123,384,293,207	116,796,997,161
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	320,959,567	217,066,523
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**123,705,252,774**	**117,014,063,684**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		236,546,327	132,975,439
දේපළ පිරියත හා උපකරණ සංචිතය		123,384,293,207	116,796,997,161
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	84,413,240	84,091,084
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**123,705,252,774**	**117,014,063,684**

පිටු අංක 01 සිට 57 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 58 සිට 116 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වගීන් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
දිනය : 2024/02/22

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ඒඩබ්වී ආර්වයිපී යුවයිපී වන්ඩිස පීවයිසී එම්ඉග්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

ගණන්දීමේ නිලධාරි
ගුවන් හමුදාධිපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2024/02/26

ආර්වීයූපී රාජපක්ෂ
වයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මූදල්)
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2024/02/22

2

Scanned with CamScanner

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

කප්‍ය

	2023 රු.	2022 රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මුළු බදු ලැබීම්	-	-	
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	14,705,813	14,591,537	
ලාභ	-	-	
ආදායම් නොවන ලැබීම්	-	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,100,530,386	3,270,441,883	
අග්‍රිම ලැබීම්	40,997,546,791	36,887,567,000	
අත්තිකාරම් අයකර ගැනීම්	265,883,160	312,132,406	
තැන්පතු ලැබීම්	193,165,263	33,984,559	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**42,571,831,413**	**40,518,717,384**	
අඩුකළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	38,400,714,856	34,994,152,802	*
සහනාධාර සහ මාරුකිරීම්	78,227,270	68,557,245	*
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	768,280,225	809,537,609	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	17	31	
අත්තිකාරම් ගෙවීම්	371,189,910	227,988,366	
තැන්පතු ගෙවීම්	192,843,108	44,988,818	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**39,811,255,387**	**36,145,224,872**	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,760,576,026**	**4,373,492,512**	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී	8,812,208	11,001,344	
ලාභාංශ	-	-	
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	3,971,569	989,698	
උපණය අයකර ගැනීම්	-	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**12,783,778**	**11,991,042**	
අඩුකළා : මුදල් වැය කිරීම්			
මූලධන වියදම්	2,773,359,803	4,385,483,554	*
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,773,359,803**	**4,385,483,554**	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(2,760,576,026)**	**(4,373,492,512)**	
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**(0)**	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්	-	-	
විදේශීය ණය ගැනීම්	-	-	
ප්‍රදානයන් ලැබීම්	-	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-	
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්	-	-	
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-	
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-	
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-	

* 2023 වර්ෂයට අනුරූපව ගළපන ලද වියදම්

Scanned with CamScanner

3.4 මූල්‍ය තත්වය පිළිබඳ සාරාංශ විශ්ලේෂණය


අ. මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2023 වර්ෂයේ මුළු ආරක්ෂක වියදම් වෙනුවෙන් ලං.රු.මි. 66,628.29ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ආරම්භයේදීම ලැබී ඇත. වර්ෂය තුළදී ලං.රු.මි. 8,555.13ක ප්‍රතිපාදන ආරම්භයේදී ලැබුණු ප්‍රතිපාදන වලින් අඩුකර ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි. 58,073.17කි. වර්ෂය සඳහා මුළු තත්‍ය ආරක්ෂක වියදම වුයේ ලං.රු.මි 44,964.92කි. මෙය නියෝජනය වන්නේ ලං.රු.මි 41,070.33ක් පුනරාවර්තන වියදම් ලෙස හා ලං.රු.මි. 3,894.59ක් මූලධන වියදම් ලෙසයි. කෙසේ නමුත්, මුළු ශුද්ධ ප්‍රතිපාදනය 5.14% කින් වැඩි වී ඇති අතර 2022 වර්ෂය සමඟ සැසඳීමේදී තත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස 7.02% කින් වැඩි වී ඇත. එසේ වුවත් 2023 වර්ෂයේ සමස්ථ ආරක්ෂක වියදම පාර්ලිමේන්තුවෙන් අනුමත මුළු ප්‍රතිපාදන තුළ පැවති අතර මුදල් අමාත්‍යාංශයේ මුළු පාලන වියදම් තුළද පැවතුනි.

පසුගිය වර්ෂයට එරෙහිව සමස්ථ ආරක්ෂක වියදම සංසන්දනය කිරීම

මුළු ආරක්ෂක වියදම	2023 වර්ෂය	2022 වර්ෂය	විචල්‍යතාව
මුළු ශුද්ධ ප්‍රතිපාදන	58,073.17	55,235.71	2,837.46
මුළු වියදම	44,964.92	42,016.45	2,948.47

වගුව – 1



රූප සටහන - 1


ආ. මූල්‍ය කාර්යසාධනය

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ එකතුකළ ආදායම ලං.රු.මි. 41,474.75කි. මෙයට ආදායම් ලැබීම් ලෙස ලං.රු.මි 14.60 ක් සහ ආදායම් නොවන ලැබීම් ලෙස ලං.රු.මි 41,460.04ක් ඇතුළත්ය. 2022 වර්ෂය හා සැසඳීමේදී සමස්ථ එකතු කළ ආදායම ප්‍රතිශතයක් ලෙස 11.34% කින් වැඩි වී ඇත.

පසුගිය වර්ෂයට එරෙහිව සමස්ථ එකතුකළ ආදායම

ආදායම	2023 වර්ෂය	2022 වර්ෂය	විචල්‍යතාව
සමස්ථ එකතුකළ ආදායම	41,474.75	37,250.12	4,224.63

වගුව – 2



රූප සටහන – 2


(1) ආදායම් ලැබීම්

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හුදු ආදායම් ලැබීම් වන්නේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායමය. ගුවන්යානා කුලී ආදායම් පමණක් බදු නොවන ආදායම් වලට ඇතුළත් වන අතර 2023 වර්ෂය ආරම්භයේදී එය ලං.රු.මි. 15.00ක් ලෙස මූලිකවම ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ නමුත් 2023 වර්ෂය අවසානයේ දී ඇස්තමේන්තුගත වටිනාකම ලං.රු.මි. 10.00ක් ලෙස සංශෝධනය කර ඇත. එකතු කළ සමස්ථ ගුවන්යානා කුලී ආදායම ලං.රු.මි 14.71ක් බවට සටහන් විය.

පුරෝකථනය කළ ආදායමට එරෙහිව තත්‍ය ආදායම

ආදායම් කේතය	2023 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ගත ආදායම (ලං.රු.මි)	2023 වර්ෂයේ තත්‍ය ආදායම (ලං.රු.මි)	වෙනස (ලං.රු.මි)
20-03-02-16	10.00	14.71	4.71

වගුව – 3



රූප සටහන – 3

(2) ආදායම් නොවන ලැබීම්

2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ලැබීම් බහුතරයක් ආදායම් නොවන ලැබීම් වන අතර එහි එකතුව ලං.රු.මි 41,460.04කි. එය 2022 වර්ෂය හා සැසඳීමේදී ලං.රු.මි 4,224.51 කින් වැඩි වී ඇත. ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාර අග්‍රිම, තැන්පතු හා අත්තිකාරම් ගිණුම ලෙස පිළිවෙලින් ලං.රු.මි 40,997.55ක්, ලං.රු.මි 193.17ක් හා ලං.රු.මි. 269.33ක් ලෙස ඇත.


(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වියදම්

2023 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම ලං.රු.මි. 45,530.98ක් (ප්‍රධාන ලෙජර් වියදම් ද ඇතුළුව) වන අතර එයින් ලං.රු.මි 41,070.33ක් පුනරාවර්තන වියදම් ලෙසත්, ලං.රු.මි 3,894.58ක් මූලධන වියදම් ලෙසත් සහ ලං.රු.මි. 566.07ක් ප්‍රධාන ලෙජර් වියදම් ලෙසත් වියදම් දරා ඇත. ඒ අනුව පෙර වර්ෂය හා සැසඳීමේදී 2023 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ථ වියදම 7.66% කින් වැඩි වී ඇත.

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ මුළු වියදම (ප්‍රධාන ලෙජර් වියදම් ද ඇතුළුව)

වියදම	2023 වර්ෂය	2022 වර්ෂය	විචල්‍යතාව
තත්‍ය වියදම	45,530.98	42,290.88	3,240.10

වගුව – 4



රූප සටහන – 4

(4) පුනරාවර්තන වියදම්


2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 46,882.30ක මුදලක් වෙන් කර තිබෙන අතර ඊට පුද්ගල පඩිනඩි ලෙස ලං.රු.මි 31,072.00ක් හා අනෙකුත් පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 15,810.30ක් ඇතුළත්ය. 2023 වර්ෂය තුළ දී ප්‍රතිපාදන වලින් ලෙස ලං.රු.මි. 3,064.00ක් අඩු කර ඇත. ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය ලං.රු.මි 43,818.30ක් වන අතර තත්‍ය වියදම ලං.රු.මි. 41,070.33කි. රජයේ ප්‍රතිපාදන මඟින් මුළු ඇස්තමේන්තුව සඳහා අරමුදල් සැපයීමට අපේක්ෂා කර ඇත. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ මුළු ඇස්තමේන්තුගත වියදම පහත සඳහන් වියදම් අයිතමයන් සඳහා වේ.

	ලං.රු.මි
පුද්ගල වේතන	31,072.00
වෙනත් පුනරාවර්තන වියදම්	15,810.30
අතිරේක ප්‍රතිපාදනය	(3,064.00)
සංශෝධිත පුනරාවර්තන ප්‍රතිපාදනය	**43,818.30**

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම්	2023 වර්ෂය සඳහා	2022 වර්ෂය සඳහා	විචල්‍යතාව
සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය	43,818.30	42,963.42	854.88
සමස්ථ වියදම	41,070.33	37,434.51	3,635.82

වගුව – 5



රූප සටහන – 5


(5) ප්‍රාග්ධන වියදම්

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ සේවා පුද්ගලයින්ගේ හා සිවිල් සේවක මණ්ඩලයේ හැකියාව වර්ධනය යනාදිය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 19,745.99ක් සඳහා මූලික ප්‍රතිපාදන ලෙස ලැබී ඇත. ඒ අනුව ප්‍රතිපාදන රුපියල් මිලියන 14,254.87ක් දක්වා අඩු කර ඇත. 2022 වසරට සාපේක්ෂව 2023 වසර සඳහා වන මුළු ශුද්ධ ප්‍රතිපාදන 16.15% කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, පෙර වසරට සාපේක්ෂව සැබෑ වියදම් 15% කින් අඩු වී ඇත.

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම	2023 වර්ෂය සඳහා	2022 වර්ෂය සඳහා	විචල්‍යතාව
සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනය	14,254.87	12,272.29	1,982.58
සමස්ථ වියදම	3,894.59	4,581.95	(687.36)

වගුව - 6



රූප සටහන - 6

(ආ) තවද, 2023 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි. 3,894.59ක් වන අතර එය 2022 වර්ෂය හා සැසඳීමේදී 15%ක පහළ යාමකි.

(ඇ) <u>ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම වර්ෂය තුළ ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය අරමුණු කොට ගෙන ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ලං.රු.මි 12,575.27ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. කෙසේ වුව ද ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලං.රු.මි 5,491.13ක අරමුදල් නතර කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ලං.රු.මි 7,084.14ක් දක්වා අඩු වී ඇත. 2023 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 1,203.44කි.

(ඈ) <u>ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම</u>

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ප්‍රධාන වශයෙන්ම වාහන, ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ හා බඩු භාණ්ඩ සපයා ගැනීම හා බර යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම් වැනි ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ආරම්භයේදී ලං.රු.මි 6,162.74ක වටිනාකමින් යුත් ප්‍රතිපාදන සලසා දී තිබුණි. කෙසේ වුවද මු.රෙ 66/69යටතේ ලං.රු.මි 145.84ක මාරු කිරීම හේතුවෙන් ප්‍රතිපාදනය ලං.රු.මි 6,016.89ක් දක්වා අඩුවී ඇත. 2023 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 2,157.23කි.

(ඉ) <u>හැකියා වර්ධනය</u>

මූලධන වියදම් යටතේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හැකියා වර්ධනය සඳහා ලං.රු.මි 350.00ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. 2023 වර්ෂය තුළ තත්‍ය වියදම ලං.රු.මි 266.40කි.


(ඊ) <u>වෙනත් ප්‍රාග්ධන වියදම්</u>

ප්‍රාග්ධන වියදම් යටතේ, ලං.රු.මි 803.85ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව වෙනත් ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 267.53ක මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වියදම් දරා ඇත.

(උ) වියදම් වර්ග කිරීම් යටතේ ප්‍රතිපාදන වලට එරෙහිව පුනරාවර්තන වියදම්.

කාර්ය විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)	වෙනස
පුද්ගල පඩිනඩි	31,272.00	31,086.10	185.90
වෙනත් පුනරාවර්තන	12,546.30	9,984.23	2,562.07
එකතුව	**43,818.30**	**41,070.33**	**2,747.97**

වගුව – 7




රූප සටහන - 7

(ඌ) වාර්ෂික විසර්ජන ගිණුම් වලට අදාළව ප්‍රාග්ධන වියදම් වර්ග යටතේ ප්‍රතිපාදන (එක් එක් වැය විෂය යටතේ) වලට එරෙහිව වියදම් දැරීම.

වැය විෂය	කාර්ය විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)	වෙනස
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම			
2001	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	250.00	145.48	104.52
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	6,534.14	956.23	5,577.91
2003	වාහන	300.00	101.73	198.27
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම			
2101	වාහන	2,607.77	1,413.60	1,194.17
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	50.00	12.44	37.56
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	2,859.11	535.80	2,323.31
2104	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	500.00	195.39	304.61

	හැකියා වර්ධනය			
2401	කාර්ය මණ්ඩල පුහුණුව	350.00	266.38	83.62
	වෙනත් ප්‍රාග්ධන වියදම්			
2509	වෙනත්	803.84	267.53	536.31
එකතුව		**14,254.86**	**3,894.58**	**10,360.28**

වගුව - 8




රූප සටහන - 8

(ඒ) <u>අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් නියම කළ සීමාවන්ට එරෙහිව තත්‍ය සීමාවන්</u>

රාජ්‍ය නිලධාරීන්ට ණය ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එක් අත්තිකාරම් ගිණුමක් ඇත. 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අත්තිකාරම් ගිණුමේ නියමිත සීමාවන්ට අනුකූලව කටයුතු කර ඇති අතර මෙම ගිණුමේ මෙහෙයුම් පහත පරිදිය.

විස්තරය	**පවත්නා වර්ෂයේදී නිර්දේශිත සීමාවන් (ලං.රු.මි)**	**පවත්නා වර්ෂයේ තත්‍ය වියදම (ලං.රු.මි)**	**වෙනස (ලං.රු.මි)**
අංක:22401 අත්තිකාරම් "බී" ගිණුම			
උපරිම වියදම් සීමාව	400.00	371.18	28.81
අවම ලැබීම් සීමාව	245.00	265.88	(20.88)
උපරිම හර සීමාව	500.00	320.96	179.05

වගුව – 9



රූප සටහන - 9

(ඒ) <u>2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන</u>

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන, ගණන්දීමේ නිලධාරී හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පිළිවෙලින් 2023 පෙබරවාරි 26 හා 27 දිනවලදී අනුමත කරන ලදී.

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ


2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

CS Scanned with CamScanner

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය



එම්ජ - 1

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරී : ගුවන් හමුදාධිපති

විෂයම් මිථිය ආකාය : 224

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම් (2)			(3)	ආදායමෙන් අපහු හෙවීම් (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම්	වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් (SA-21)	එකතුව	ඉහ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
2003.02.16	ගුවන්යානා කුලී ආදායම්	4	15,000,000	10,000,000	14,705,813	-	14,705,813	-	-	-	-	14,705,813

ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2024/01/22
ටවී. ඒ. ඩී. ජයලත්
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ආදායම් ගණන්දීමේ නිලධාරී
ගුවන් හමුදාධිපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 2024/02/26
ආර්ජුපි රාජපක්ෂ
වයිස් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

වගුව – 10

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(ලං.රු.මි.)

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදනයේ %
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	46,882.30	43,818.30	41,070.32	93.72%
ප්‍රාග්ධන	19,746.00	14,254.87	3,894.59	27.32%

වගුව - 11

3.8 මුරෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)	තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
01	බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	රාජ්‍ය වෙසක් උත්සවය - (බුද්ධ වර්ෂ 2567)	127,500.00	127,500.00	100%
02	ආරක්ෂක අමාත්‍යාංශය මාරුකිරීම්	මාරුකිරීම් - සුභසාධන වැඩසටහන් - රණවිරුමාපිය	285,715,500.00	284,166,581.58	99.46%
03	වෛද්‍ය සැපයීම් අංශය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	වෛද්‍ය සැපයීම් - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	-	(52,162,733.22)	-
04	බහුකාර්ය සංවර්ධන බලකා දෙපාර්තමේන්තුව	බහුකාර්ය සංවර්ධන බලකා දෙපාර්තමේන්තුව	720,000.00	707,850.00	98.31%
05	ශ්‍රී ලංකා නාවික හමුදාව	ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා ගුවන් ප්‍රවේශපත්‍ර (රුසියාවේ පවත්වන ලද රග්බි තරගාවලිය)	3,072,500.00	3,072,500.00	100%
06	අධ්‍යාපන අමාත්‍යාංශය	ආරක්ෂක විද්‍යාලය - කොළඹ/ කුරුණෑගල	3,030,000.00	1,408,409.33	46.48%
07	ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය	පුනරාවර්තන මාරුකිරීම් – නිවාඩු ගමන් බලපත්‍ර	45,000,000.00	44,880,104.50	99.73%
08	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	මාරුකිරීම් - සුභසාධන වැඩසටහන් (අසනීප ආබාධිත දීමනා)	450,450,000.00	448,496,689.71	99.57%
		මාරුකිරීම් - සුභසාධන වැඩසටහන් (පාරිතෝෂික)	37,583,323.59	37,583,323.59	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(ලං.රු.මි.)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ඉදිකිරීම්	15,265.63	15,265.63	නැත	100%
9152	යන්ත්‍රෝපකරණ	67,309.11	67,309.11	නැත	100%
9153	ඉඩම්	39,985.36	39,985.36	නැත	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	සිදුකරමින් පවතින වැඩ	824.19	824.19	නැත	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

වගුව - 13

3.10 <u>විගණකාධිපතිවරයාගේ වාර්තාව</u>

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. DEF/D/SLAF/23/11 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 මැයි 30 දින

ගුවන් හමුදාධිපති

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

.....

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1 .6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය

සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය
2022 154(6) වාර්තාව 1.5 (ආ)	2011නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි .මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි .මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

2022 සහ 2023 වර්ෂයන් තුළදී ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබාදුන් ගුවන් යානා ඉන්ධන ලීටර් 202,000 කින් වටිනාකම රු.28,727,120 ක් වූ ඉන්ධන ලීටර් 77,000 ක් 2022 වර්ෂයේදී ලැබී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන ලීටර් 202,000 හි මුළු වටිනාකම වූ රු.67,320,620 ම වැය විෂය 224-1-1-1202-3 යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ ඉන්ධන වියදම 28,727,120 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් පරිදි ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය/මියගිය/සේවය අවසන් වන නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථාවලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැර වීම නිසා මියගිය/විශ්‍රාම ගිය/වැඩ තහනම් කරන ලද /සේවය හැරගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිහහිටි ණය ශේෂය රු.10,759,840 ක් විය. වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිහ හිටි ණය ශේෂය රු.7,734,231 ක් විය.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) .ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම හා ලේඛණගත කිරීම සඳහා නිවැරදි පද්ධතියක් ස්ථාපිතව නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ දෙකක ආරම්භක ශේෂයට ඉකුත් වර්ෂයන් වලදී අත්හැරී තිබූ මූල්‍ය නොවන වත්කම් රු.5,806,436,807 ක වටිනාකමක් එකතු වී තිබුණි. එම වටිනාකම තුළ 1985 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා ගිණුම්ගත වීම අත්හැරී තිබූ ගුවන් යානා 08 ක එකතු වටිනාකම රු.1,492,897,135 ක් ද ඇතුළත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2023 මැයි 31 ඉදිකිරීම් පිරිවැය රු,6,904,872,231 ක් වූ අකුරේගොඩ පිහිටි නව ගුවන් හමුදා මූලස්ථාන ගොඩනැගිල්ල හා ඉඩම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලින් ගිණුම්ගත කිරීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඒ.සී.ඒ.6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළින් වාහන 24 ක් ගිණුම් ගත කිරීම අත්හැරි තිබුණි.

2 මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) ආදායම් ශීර්ෂ 20-03-02-16 ගුවන් යානා කුලී ආදායම් ඉපයීම අනුව, 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික ශුද්ධ ආදායම් ඉපැයීම් අඩුවීමේ ප්‍රවනතාවයක් පැවතුණි. එය 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 24 සිට සියයට 94 ක් දක්වා පරාසයක ආදායම් ඉපැයීම් අහිතකර අවකරණයකින් යුතුව විචලනය වී පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව, ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන 02 කින් ගුවන් යානා කුලී ආදායම් එකතුව රු.12,674,073 ක් වර්ෂ 05 ත් 20 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පැවතුණි.

(ඇ) මු.රෙ.128 (2) (එ) ප්‍රකාරව ,රජයේ ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය තැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව කලින් කල වරිපනම් හා අයකිරීම් හෝ බදු හා ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වුවත් 2016 වර්ෂයෙන් පසු ගුවන් යානා ගොඩබෑමේ ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි .ඒ අනුව ගුවන්යානා ගොඩබෑමේ ගාස්තු අයවීම් රු.120.75 ලෙස ඉතා අවම මුදලක් වූ අතර ගුවන් යානා ගොඩබෑමේ වාර 2009 ක් වෙනුවෙන් ලද ආදායම රු.236,221 ක ඉතා පහළ අගයක් විය.

(ඈ) තවද යටෝක්ත මු.රෙ. ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ඒකල ගුවන් හමුදා කඳවුර තුල ගොඩනැගිලි 05 ක් බදු දීම සඳහා රජයේ අදායමට ගැනීමට එක් ගිවිසුමක් හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලකට ආදායම් ලබා ගැනීමට තවත් ගිවිසුමක් ලෙස ගිවිසුම්ගත වී බදු කුලී අය කිරීම හේතුවෙන් එකතුව රු.2,037,400 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) විදේශ අධ්‍යයනය , පුහුණුව, සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා විදේශගතවීමේදී අදාල කර ගත යුතු අංක MF/06/23/50/2023 දරණ සහ 2023 මාර්තු 20 දිනැති මුදල් අමාත්‍යාංශයේ නව චක්‍රලේඛයේ02(1) ඡේදය අනුව එක් දිනකට ඇ.එ.ජ.ඩොලර් 40 ක්ව පැවති අනියම් දීමනාව ඇ.එ.ජ. ඩොලර් 25 දක්වා අඩුකර උපරිම දින 15 ලෙස සංශෝධනය කර තිබුණු නමුත් එම නියමයෙන් බැහැරව 2023 මාර්තු 20 දිනෙන් පසුවද විදේශ අධ්‍යයන පුහුණු සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ නිලධාරීන් දහ දෙනෙකුට දිනකට ඇ.එ.ජ ඩො.40 බැගින් ගෙවීම් කර තිබුණි.ඒ අනුව විදේශ ගමන් වියදම් වෙනුවෙන් ඇ.එ.ජ.ඩො. 6045 ක් එනම් රු.2,006,109 ක් චක්‍රලේඛයට පටහැනිව වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නිළ ඇදුම් මිළදී ගැනීම මෙන්ම වාහන අළුත්වැඩියා දැඩි අවශ්‍යතාවයක් පැවතියදීත් අදාළ වාර්ෂික ප්‍රතිපාදන 2023 නොවැම්බර් 30 දින වන විටත් වැය නොකර ඌන උපයෝජනය වීම හේතුවෙන් රු.3,064,000,000 ක පුනරාවර්තන ප්‍රතිපාදන සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂය මගින් රු.5,491,127,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන අවුරා තබා ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් ලබාදී තිබුණි.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයක් වෙනුවෙන් වාර්ෂිකව දරණ ලද බැදීම් හා බැරකම් වල එකතුව කිසිදු අවස්ථාවක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් එම නියමයෙන් බැහැරව 2023 වර්ෂයේදී වැය විෂය අංක 224-1-1-1401 - ප්‍රවාහන යටතේ රු.1,765,607 ක් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවිය යුතු සියළු බැරකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම iii - බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කල යුතු වුවත්, අවස්ථා 28 කට අදාල රු.20,121,111 ක් වටිනා බැරකම් සමාලෝචිත වර්ෂයේදී ඊට ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ප්‍රකාශයට ඇතුළත් නොවූ අවස්ථා 10 කට අදාළ එකතු වටිනාකම රු.12,619,050 ක් වූ බැරකම් වෙනුවෙන් 2023 වර්ෂයේ දී ගෙවා තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති යොමුව	නිරීක්ෂණය
ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 1 සහ 2	රජයේ වැටුප් ලබන නිලධාරියෙකු රාජ්‍ය සේවයේ වෙනත් තනතුරකට මුදාහැරිය හැකි වුවත් ඉන් බැහැර වෙනත් වූ රජයේ නොවන බාහිර ආයතනයන්හි කටයුතු වෙනුවෙන් යෙදවිය නොහැකි වුවද එම නියමයන්ගෙන් බැහැරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයන් සිව් දෙනෙකු රාජ්‍ය සේවයෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත මුදාහැර 2023 මාර්තු 01 දින සිට 2023 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන්

7

රු.2,360,680 ක් වූ වැටුප් රජයෙන් ගෙවා තිබුණි.එසේම කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් භටයින් 31 ක් දින 01 සිට මාස 03 ක කාලයක් තම නිත්‍ය රාජකාරියෙන් බැහැරව වෙනත් බාහිර ආයතනයන්හි කටයුතු වලට යොදවා තිබුණි

මු.රෙ. 128(1) (ආ)

දෙපාර්තමේන්තු මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට හා අවශ්‍ය අවස්ථා වලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා ඒවා ක්‍රමානුකූලව සම්පූර්ණයෙන්ද අප්‍රමාදව එකතු කර ගැනීම සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද ගණන් දීමේ නිලධාරී, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත වගකීමට බැඳේ.එසේ වුවද එම නියමයෙන් බැහැරව කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි ඇති රජයේ මානව හා භෞතික වත්කම් උපයෝජනයෙන් මෙහෙයවනු ලබන ආදායම් ප්‍රභවයන් 24 කින් උපයන ලද රු.15, 303,304 ක් රජයේ ගිණුමට බැර නොකර සේවා ආයතන අරමුදල සහ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වෙත බැර කිරීම හේතුවෙන් රජයට එම ආදායම් අහිමි වී තිබුණි.

මු.රෙ.2.(1)

(ඇ) රජය සතු සියළුම ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවත් එයින් බැහැරව මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරඟ සඳහා පුහුණු වීමට කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙහි ගුවන් පථය ලබාදීම වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂයේ රු.1,383,125 ක් ගුවන් හමුදාව විසින් උපයාගෙන ඒකාබද්ධ අරමුදලට බැර නොකර ව්‍යවස්ථාපිත නොවූ අරමුදලක් වන සේවා ආයතන අරමුදල වෙත බැර කර තිබුණි.

2.5 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්

2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2023 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් මාස තුනට අදාලව නිලධාරීන් 100 කගේ නියැදියකින් රු.2,875,270 ක් වූ අය විය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) වෙනුවට රු.482,770 ක් පමණක් අයකරගෙන තිබුණි.ඒ අනුව නව දේශීය ආදායම් පනතට අනුව සේවා නියුක්තික ආදායම නිවැරදිව හඳුනා නොගැනීමෙන් රු.2,392,500 ක අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වටිනාකම රජයට අහිමි වී තිබුණි.

2.6 අවධිමත් ගනුදෙනු

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් සහ ඉහල නිලධාරීන් රජයේ ආයතන වල වෙනත් තනතුරු වලට මුදා හැරීමේදී ඔවුන්ට වෙන්කල මාණ්ඩලික රථ ද අදාල ආයතන වෙත මුදා හැර තිබුණි. ඒ වෙනුවෙන් 2022 ජනවාරි 01 සිට 2022 සැප්තැම්බර් 30 දිනට ඉන්ධන ලීටර් 76,175 ක් සපයා තිබුණු අතර එම වාහන වෙනුවෙන් කුලිය රු. 10,800,000ක් ගෙවා තිබුණි.ඒ අනුව ගුවන් හමුදාවේ රාජකාරියෙන් පරිභාහිරව වෙනත් ආයතන වල රාජකාරී කටයුතු වෙනුවෙන් ගුවන් හමුදා වැය ශීර්ෂයෙන් රු.10,800,000 ක වියදම් දරා තිබුණි.

(ආ) මාසිකව රු.50,000 ක කුලී පදනම මත ලබා ගත් වාහන සඳහා මුදල් ගෙවීම් වවුචර් සමග අමුණා තිබුණු ඉන්වොයිසි වල කුලිය ගෙවීමට අදාලව ගෙවීම් සිදුකල වාහනයේ අත්‍යවශ්‍ය සාධකයක් වූ ගුවන් වාහන අංකය හෝ සිවිල් අංකය යන දෙකම රහිතව වාහන 47ක් වෙනුවෙන් එකතු වටිනාකම රු.21,150,000 ක් ගෙවා තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක මූලික කඳවුරේ පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගයේ ව්‍යාපෘතියක් වන මෙට්ට ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරනු ලබන මෙට්ට 1380ක් 2021 සිට 2024 පෙබරවාරි 09 දින දක්වා කාලය තුල රු.6,915,000 කට ප්‍රමිති සහතිකයක් මෙන්ම නිශ්චිත වගකීම් කාලයක්ද රහිතව කෘෂි අරමුදල ව්‍යාපෘතියෙන් (AGRO FUND) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිලදී ගෙන තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදයෙහි ප්‍රසම්පාදනයට අදාළ ප්‍රධාන අරමුණ වන ගුණාත්මකභාවය යන්න වූ අවශ්‍යතාවය සනාථ කර ගැනීමෙන් පසුව මිලදී ගැනීම් සිදු විය යුතු වුවත් එයින් බැහැර වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වටිනාකම රු.1,785,000 ක් වූ මෙට්ට 300 ක් විධිමත්ව ප්‍රමිතිය පරීක්ෂා නොකර, ලේඛන වලට ඇතුළත් නොකර 2024 ජනවාරි 1 දින අකුරේගොඩ ගුවන් හමුදා මූලස්ථානයේ පැවති පිරිත් වැඩසටහන වෙනුවෙන් භාවිතා කර තිබුණු අතර ඒවා මිලදී ගැනීමට අදාල ඇණවුම ඊට පසු දිනක (2024 ජනවාරි 20 දිනැති අංක PD/L/BRK/23/10266 දරන ඇණවුම මගින්) නිකුත් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ටෙක් නෙට් ඔටෝ වර්ල්ඩ් (පුද්) සමාගම සමඟ රු.9,675,750 ක (වැට් රහිත) ගිවිසුම්ගත මුදලකට G 3184/ G -3174/ G -3215 දරණ ඩිෆෙන්ඩර් රථ 03 ක් Conversion Repair of non TDI defender jeep in to 300 TDI soft top defender jeep ලෙස අළුත්වැඩියාවන් වෙනුවෙන් 2021 පෙබරවාරි 06 දින ගිවිසුම් ගත වී තිබුණු නමුත් 2023 මාර්තු 21 දිනට වාහන තුනෙහිම අළුත්වැඩියාව සිදු නොකර දින 673 ක් බැගින් වූ කාල ප්‍රමාදයකින් යුතුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු භාර දී තිබුණි. අදාළ ප්‍රසම්පාදනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අවලංගු කර තිබූ නමුත් ප්‍රසම්පාදනයට අදාළව තාක්ෂණික ඇගයීම පරීක්ෂාවේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1. (අ) IV ප්‍රකාර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ හා පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව ක්‍රියා කරන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තනි තනිව හා කමිටුව වශකිව යුතු වුවත්, එයින් බැහැරව අභ්‍යන්තර විගණන වාර්තාවක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන ප්‍රදානය සිදු කර තිබුණි.ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි වගකීමෙන් බැහැරවීම මත අදාළ ප්‍රසම්පාදනය අසාර්ථක වී පැවතුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි යන්ත්‍ර ප්‍රවාහන අළුත්වැඩියා කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ පක්ෂාංගය වෙත 2011 ජූනි 23 සිට අළුත්වැඩියාවන් වෙනුවෙන් ලැබී තිබූ වාහන 105 ක් නිසි සැලසුමකින් යුක්තව අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 12 ක කාලයක් නිෂ්කාර්යව ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි සැපයුම් හා නඩත්තු පක්ෂාංගය තුල පවතින ගබඩා සඳහා ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේදී රු.1,346,000 ක් සහ 2023 වර්ෂයේදී රු.3,841,860 ක භාණ්ඩ ලෙස මුළු එකතුව රු.5,187,860 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2024 පෙබරවාරි 09 දින වන විටත් අදාළ ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත නොවීම හේතුවෙන් එම භාණ්ඩ ගබඩා තුල නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගබඩා අංශ 06 ක් තුල සෙමින් නිකුත් වන රු.5,574,656 ක් වටිනා භාණ්ඩ අයිතම 22,061 ක්, නිකුත් නොවී ගබඩා තුල පවතින රු.2,763,655 ක් වටිනා භාණ්ඩ අයිතම 12,946 ක් සහ අපහරණ මණ්ඩලය වෙත යොමු කරන ලද රු.840,570 ක් වටිනා භාණ්ඩ අයිතම 633 ක් 2024 පෙබරවාරි 09 දිනට ගබඩා තුල පැවතුණි.

(ඈ) 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අළුත්වැඩියාවන් සඳහා විදේශයන් වෙත යවන ලද අළුත්වැඩියා වටිනාකම ඇ.ඩො. 191,289.22 ක් වූ ගුවන් යානා අමතර කොටස් 27 ක් හා අගයන් වාර්තා නොවූ එහි සුන්බුන් අගය එකතුව ඇ.ඩො 63,000 ක් වූ ගුවන් යානා අමතර කොටස් 32 ක් විදේශයන් වෙත යවා වර්ෂ 09 -19 කාලයක් ගතවී තිබුණද 2024 පෙබරවාරි 09 දින වන විටත් ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.

(ඉ) (I). කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් යානා අමතර කොටස් පකෂාංගයේ 2020 වර්ෂයේ සිට 2024 පෙබරවාරි 09 දිනය දක්වා විදේශයන් වෙතින් නව මිලදි ගැනීම් හා අළුත්වැඩියාවන් අවසන් වීම් ලෙස ගෙන්වා ගෙන තිබූ ගුවන් යානා අමතර කොටස් 63 ක් විවිධ ගැටළු හේතුවෙන් අදාල පක්ශාංගය වෙත නිකුත් නොකර වර්ෂ 1-4 කාල ප්‍රමාදයකින් නිරෝධායනයන් (Quarantined Items) ලෙස රඳවාගෙන තිබුණි. ඒ අනුව එහි නිශ්චිත වටිනාකම සඳහන් අවස්ථා 09 ක් යටතේ මිලදීගෙන තිබූ වටිනාකම යූරෝ 21,218.86 හා ඇ.ඩො.50,141 ක වටිනාකමකින් යුතු ගුවන් යානා අමතර කොටස් හා 2020 සිට 2023 දක්වා කාල සීමාව තුලදී අළුත්වැඩියාව අවසන් කරන ලද අවස්ථා 16 කට අදාලව එකතුව ඇ.ඩො. 527,550 ක් වූ ලෙස ඉතා අධික වටිනාකමෙන් යුතු ගුවන් යානා අමතර කොටස් නිෂ්කාර්ය ගබඩාව තුල පැවතුණි.

(II) ඉහත විස්තර සඳහන් ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම යටතේ අවස්ථා 09 ක දී රේගු ගාස්තු ලෙස රු.65,752,943ක් වූ වියදමක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මේ සඳහා දරා තිබූ නමුත් එම ගුවන් යානා අමතර කොටස් මුළුමණින්ම හෝ ඇණවුමේ කොටසක් වශයෙන් නිරෝධායන අයිතම (Quarantined Items) ලෙස රඳවා තබා ගැනීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරණ ලද මෙම වියදම වර්ෂ 01-4 කාලයක් නිෂ්කාර්ය වීම මෙන්ම එම වියදමේ ඵලදායිත්වය රජයට ලැබී නොතිබුණි.

3.3 පාඩු හා හානි

(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ ඇමුණුම (ii) පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් අවස්ථා 10 කට අදාලව එකතු වටිනාකම රු.9,740,136 ක් වූ පාඩු හා අත්හැරීම් වෙනුවෙන් මු.රෙ.109 යටතේ අලාභයන් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී තිබුණු නමුත් අදාළ අනුමැතිය ලැබී මාස 1-13 ත් අතර කාලයක් ගත වී පැවතියදීත් එම පාඩු සහ අත්හැරීම් පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කපා නොහළ ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් ශේෂය රු.577,625,996 ක් වුවද,සමාලෝචිත 2023 ජනවාරි 1 දිනට ආරම්භක කපා නොහළ ශේෂය ලෙස රු.595,362,729 ක් වීම නිසා රු.17,736,733 ක ආරම්භක ශේෂ වෙනසක් පැවතුණි.

(ඇ) ගුවන් 3878 දරණ වාහනයේ සිදු වූ අනතුරට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු1,508,440 ක ශේෂය (මු.රෙ.109 ප්‍රකාර ඇමුණුම (ii) යටතේ වන පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම් ප්‍රකාශනයෙන්) සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි.එසේම 2023 දෙසැම්බර් 31 දිනට පාඩු හා අත්හැරීම් වලට අදාළව වගකිව යුතු පාර්ශව වෙතින් වැටුපෙන් අයකර තිබූ පාඩු හා අත්හැරීම් සිදුවීම් 19 කට අදාලව එකතු වටිනාකම රු.3,014 ,342 ක් (මු.රෙ.109 ප්‍රකාර ඇමුණුම (ii) යටතේ පොතෙන් කපා හැරීම් හා අය කිරීම් පිළිබඳ ප්‍රකාශනයේ) අයකර ගැනීම් ලෙස ඇතුලත් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පාඩු හා අත්හැරීම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ඇතුළත් වී තිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් බැටරි නැවත ආරෝපණය කිරීම හා බැටරිය විශ්ලේෂණය කිරීම අරමුණින් බැටරි විශ්ලේෂක (Battery analyzer) 17 ක් හා ඊට අදාල adapter 108 ක් ප්‍රසම්පාදන අංක PDF/AVN/21/10080 යටතේ USD 105,717 වටිනාකමට Cadex Electronics inc ආයතනයෙන් 2022 මාර්තු 25 දින මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

I. සියලුම ආශ්‍රිත වියදම් ඇතුලත් කර මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 ප්‍රකාර පිරිවැය ඇස්තමේන්තු උද්ධමනය වැනි සාධක හමුවේ වෙනස් වීම් සිදුවන්නේ නම් අදාල අධිකාරිය විසින් එම සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කළ යුතු වුවත් එයින් බැහැරව ප්‍රසම්පාදන කමිටුව විසින් අදාල මිලදී ගැනීමේ මුළු පිරිවැය 2021 නොවැම්බර් 26 දින වන විට රු.24,863,776 ක් ලෙස අනුමත කර ඇතත් තත්‍ය වශයෙන්ම රු.35,609,286 ක් වූ වියදමක් දරා තිබුණි ඊට අදාල පිරිවැය සංශෝධිත ඇස්තමේන්තු අදාල අධිකාරීත්වය විසින් අනුමත කර නොතිබුණි.

II. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ප්‍රකාර සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේදී තරඟකරී මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගන්නා විභව සැපයුම්කරුවන්ගේ ලංසු කැඳවිය යුතු වුවත් යටොක්ත ප්‍රසම්පාදනයට අදාල C-7400-C Cadex Battery analyzer (07-740-0100) ඒකක මිල අන්තර්ජාලයෙන් පරීක්ෂාවේදී (භාණ්ඩයේ මිල ගණන් Cadex Electronics inc ආයතනයේ වෙබ් පිටුවෙන්) ඇ.ඩො.2630 ක් ලෙස මිල ප්‍රදර්ශණය වුවත් ප්‍රසම්පාදනය පැවරුමට අදාල Cadex Electronics inc ආයතනයෙන් ඒකක මිල ඇ.ඩො.5090 ඉතා අධික මිලකට මිලදී ගෙන තිබුණි. තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් මෙම ප්‍රසම්පාදනය සිදු නොකිරීම නිසාවෙන් එකතුව රු.14,051,520 ක්වූ ආසන්න මුදලක් රජයට අවාසිදායක වන අයුරින් වැය කර තිබුණි.

III. Battery Analyzer 17 ක් හා Adapter 108 ක් මිලදී ගැනීම වෙනුවෙන් ඇ.ඩො.105,717 (රු.35,520,912 ක්) වූ අධික වැයක් දරා තිබූ නමුත් ඒවා උපයෝජනයට අදාළ ගුවන් හමුදාව සතු භාවිතා කරනු ලබන චෝර්කි ටෝර්කි ප්‍රමාණය 2594 ක් වූ සීමිත ප්‍රමාණයක් වූ අතර ඒ වෙනුවෙන් යොදා ගන්නා ලද බැටරි ගණන 3282 ක් විය. ඒ අනුව බැටරි 3282 හි මුළු වටිනාකම රු.5,439,701 ක් වූ අතර එහි සාමාන්‍ය ඒකක පිරිවැය රු.5000 කට අඩු අගයක්ව පැවතුණි.ඒ අනුව මිලදී ගැනීමේ අවශ්‍යතාවය ප්‍රමුඛගත කිරීමේදී ඉතාම සුළු වටිනාකමකින් යුතු බැටරි විශ්ලේෂණය කිරීම සඳහා රු.35,520,912 වැයක් දරා තිබීම විගණනයේදී අනාර්ථික ගණුදෙනුවක් බව නිරීක්ෂණය විය.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුකුරුන්ද කඳවුර තුළ 2001 වර්ෂයේ සිට ගිවිසුම් රහිතව ගුවන් මෙහෙයුම් කටයුතු සිදු කල Asian Aviation පුද්ගලික සමාගම 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා කාර්තු හතරකට අදාලව රු.420,453 ක් වූ හිඟ මුදල් ගෙවීම් නොකර 2021 මාර්තු 18 වන දින කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙන් වත්කම් සියල්ල ඉවත් කර ගෙන තිබුණි. ගුවන් සමාගම හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතර කුලී ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් මෙම සමාගමෙන් අයවිය යුතු මුදල් අයකල නොහැකි වී තිබුණි.

ජේ.සුනිල් ශාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 වන පරිච්ඡේදය

4. කාර්යසාධන දර්ශක

4.1 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ය නිමැවුම		
		90% - 100%	75% - 89%	50% - 74%
01	Y-12 ගුවන් යානා 2ක් මිලදී ගැනීම	✓		
02	AN-32B ගුවන් යානා 3ක් පූර්ණ අළුත්වැඩියා කිරීම	✓		
03	MI-17 හෙලිකොප්ටර් 2ක් පූර්ණ අළුත්වැඩියාව කිරීම (SMH-4417 සහ SMH-4418)	✓		
04	MI-17 හෙලිකොප්ටර් 1ක් පූර්ණ අළුත්වැඩියාව කිරීම (SMH-4428)	✓		
05	මිලිමීටර් 7.62 Emtan MZ 47 රයිෆල් 40ක් මිලදී ගැනීම	✓		
06	මිලිමීටර් 9 CZ scorpion EVO 3 A 1 CAL රයිෆල් 40ක් මිලදී ගැනීම	✓		
07	මිලිමීටර් 7.62 CH 212 බෝල 1,500,000ක්, මිලිමීටර් 7.62 CH 216 හිස් පතොරම් 500,000ක් සහ මිලිමීටර් 9 බෝල පතොරම් 250,000ක් මිලදී ගැනීම	✓		
08	F-7 GS සහ K-8 ගුවන් යානා බලඇණිය සඳහා ඉජෙක්ෂන් ආසන කාට්රිජ් මිලදී ගැනීම (F7/GS ගුවන් යානා සඳහා 03ක් සහ K-8 ගුවන් යානා 04ක් සඳහා)	✓		
09	මිලිමීටර් 9 මේජර් වෙඩි තැබීමේ පතොරම් 119,500ක් සහ මිලිමීටර් 9 සුළු තරඟ වෙඩි තැබීමේ පතොරම් 119,500ක් මිලදී ගැනීම	✓		
10	K-8 සහ F-7 ගුවන් යානා ඇණිය සඳහා ඉජෙක්ෂන් ආසන අමතර කොටස් මිලදී ගැනීම (F7/GS ගුවන් යානා සඳහා 03ක් සහ K-8 ගුවන් යානා 04ක් සඳහා)	✓		
11	මිලිමීටර් 9 CZ P10 M පිස්තෝල 75ක් මිලදී ගැනීම	✓		
12	මිලිමීටර් 23 Zu පතොරම් 3,000ක් මිලදී ගැනීම	✓		
13	බෙල් 212/412 හෙලිකොප්ටර් සහ B-200 Beechcraft ගුවන් යානා සඳහා ගිනි නිවීම් බෝතල් සඳහා Squibs 06ක් මිලදී ගැනීම	✓		
14	ගුවන් හමුදා අවශ්‍යතා සඳහා මෙලමයින් පුවරු 700ක් මිලදී ගැනීම	✓		
15	අතේ ගෙන යා හැකි ලෝඩ් බෑන්ක් AC 400 HZ – 200/115VAC මිලදී ගැනීම			✓
16	අංක 61 බල ඇණිය සඳහා වායුපද්ධති 01ක් අළුත්වැඩියා කිරීම			✓
17	අංක 02 බලසණය සඳහා කර්චා උණු වතුර සේදුම් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම			✓
18	මගී වැන් රථ 03ක ප්‍රධාන අළුත්වැඩියාවන්	✓		
19	LRD ජීප් රථ 02ක ප්‍රධාන අළුත්වැඩියාව	✓		

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ය නිමැවුම		
		90% - 100%	75% - 89%	50% - 74%
20	Bollero කැබ් රථ 02ක ප්‍රධාන අළුත්වැඩියාව	✓		
21	Prime Mover 01ක ප්‍රධාන අළුත්වැඩියාව	✓		
22	ගිලන්රථ 01ක ප්‍රධාන අළුත්වැඩියාව	✓		
23	මිනිසුන් 20 දෙනෙකු සඳහා වන කුඩාරම් 04ක් නිෂ්පාදනය	✓		
24	සටන් ආරක්ෂක පටි 900ක් නිෂ්පාදනය කිරීම	✓		
25	විශාල ඇසුරුම් 1,200ක් නිෂ්පාදනය කිරීම	✓		
26	සිවිල් ඉංජිනේරු යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම			✓
27	ගොඩනැගිලි සහ ව්‍යුහයන් ඉදිකිරීම			✓
28	ඩම්ප් ට්‍රක් රථ නඩත්තුව		✓	
29	සිවිල් ඉංජිනේරු යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම		✓	
30	ගොඩනැගිලි නඩත්තු කිරීම	✓		
31	ශ්‍රී ලංකා ගුවන් හමුදාව රත්මලාන හෙලිටුවර්ස්හි SCM-3501(4R-HTN) MA-60 ගුවන් යානයේ EFIS-85N පද්ධතිය සඳහා අමතර කොටස් මිලදී ගැනීම	✓		
32	ගුවන් හමුදාවෙහි ඩිජිටල් හඬ පටිගත කරන යන්ත්‍ර සඳහා (SHT) 8B/PCI හඬ පටිගත කිරීමේ කාඩ්පතක් මිලදී ගැනීම	✓		
33	අකුරේගොඩ DHQC සඳහා භාවිතා කිරීමට S4 IP Controller (Park Air) මිලදී ගැනීම	✓		
34	අකුරේගොඩ DHQC සඳහා භාවිතා කිරීමට RF කේබල් මිලදී ගැනීම	✓		
35	ගුවන් හමුදා ආයතන සඳහා භාවිතා කිරීමට බැටරි විශ්ලේෂක මිලදී ගැනීම	✓		
36	දිශා ජාල විශ්ලේෂක (Vector Network Analyzer) මිලදී ගැනීම	✓		
37	අතේ ගෙන යා හැකි බැටරි මිලදී ගැනීම	✓		
38	දේශීය පුහුණු පාඨමාලා - 2023	✓		
39	විදේශ පුහුණු පාඨමාලා - 2023	✓		
40	පරිගණක අමතර කොටස් මිලදී ගැනීම	✓		
41	ඉන්ට්‍රානෙට් සහ අන්තර්ජාල ජාල නඩත්තුව සහ ව්‍යාප්තිය	✓		
42	සයිබර් ආරක්ෂණ මෙවලම් වල බලපත්‍ර මිලදී ගැනීම සහ වැඩිදියුණු කිරීම			✓
43	බහුකාර්ය වසම තුළ ක්‍රියා කළ හැකි කුඩා කණ්ඩායම් නිර්මාණය කිරීම	✓		
44	නවීන CBRNE උපකරණ ලබා ගැනීම	✓		
45	සටන් උපකරණ ලබා ගැනීම හරහා හැකියාවන් ගොඩනැගීම	✓		
46	ඖෂධ සහ සැරහුම් අයිතම, රසායනාගාර අයිතම මිලදී ගැනීම		✓	
47	ගුවන් හමුදා රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා ප්‍රාග්ධන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම			✓
48	ප්‍රාග්ධන වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීම/ වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන උපකරණවල සේවා ගිවිසුම් පවත්වා ගැනීම			✓

05 වන පරිච්ඡේදය

5. <u>තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය</u>

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
<u>අරමුණ 03</u> නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.	**3.1** 2030 වන විට සජීවී උපත් 100,000කට ගෝලීය මාතෘ මරණ අනුපාතය 70ට වඩා අඩු කිරීම	නිසි පෝෂණය, ප්‍රමාණවත් අධ්‍යාපනය, අවශ්‍ය පරීක්ෂණ සහ එන්නත් ආදිය ඉලක්ක කර ගනිමින් අපගේ පහසුකම් තුළ පූර්ව ප්‍රසව සායන පැවැත්වීම.	√	-	-
	3.2 2030 වන විට, සියලු රටවල් ඉලක්ක කර ගනිමින්, නව ජන්ම මරණ අවම වශයෙන් සජීවී උපත් 1,000කට 12 දක්වාත්, අවුරුදු 5ට අඩු ළමුන්ගේ මරණ සංඛ්‍යාව අවම වශයෙන් 1,000කට 25 දක්වාත, අලුත උපන් බිළිඳුන්ගේ සහ අවුරුදු 5ට අඩු දරුවන්ගේ වැළැක්විය හැකි මරණ අවසන් කිරීම.	අලුත උපන් බිළිඳුන් සහ වයස අවුරුදු 5ට අඩු ළමුන් සඳහා EPI කාලසටහන සමඟ සම්බන්ධීකරණයෙන් වළක්වා ගත හැකි රෝග සඳහා එන්නත් ලබා දීම.	√	-	-
	3.3 2030 වන විට, ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියාව සහ නොසලකා හරින ලද නිවර්තන රෝග වසංගත අවසන් කිරීම සහ හෙපටයිටිස්, ජලයෙන් බෝවන රෝග සහ වෙනත් බෝවන රෝග වලට එරෙහිව සටන් කිරීම.	1. ලිංගාශ්‍රිත රෝග සහ ජලයෙන් බෝවන රෝග/ අනෙකුත් බෝවන රෝග පිළිබඳව සෑම පුද්ගලයෙකුටම අවශ්‍ය සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම. 2. හැකි සෑම විටම පූර්ව එන්නත්කරණය සිදු කිරීම.	√	-	-
	3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ සහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	පූර්ව ප්‍රසව සායන පැවැත්වීම සහ ගර්භනී කාන්තාවන් සඳහා අවශ්‍ය සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.	√	-	-
	3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ	1. අවදානමට ලක්විය හැකි වයස් කාණ්ඩ ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම. 2. එවැනි අවස්ථාවන් හඳුනා ගැනීම සඳහා අහඹු ලෙස	√	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
	ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	තෝරාගත් පුද්ගලයින් සඳහා රසායනාගාර විශ්ලේෂණයක් පැවැත්වීම.			
		මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම. අ. අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය. මත්ද්‍රව්‍ය — ප්‍රමාණය අයිස් මත්ද්‍රව්‍ය — 155.859g හෙරොයින් — 74.513g ගංජා — 133.83Kg ගංජා පැළ — 43,390 නීති විරෝධී මත්පැන් — 2,733.54 Ltr විදේශීය මත්පැන් — 121.15 Ltr නීති විරෝධී සිගරට් — 41,826 මත්පෙති — 7,907 බීඩි කොළ — 536.26 Kg ආ. වසරකට අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව - 245	-	-	-
	3.7 2030 වන විට, පවුල් සැලසුම්, තොරතුරු සහ අධ්‍යාපනය, සහ ප්‍රජනක සෞඛ්‍ය ජාතික උපාය මාර්ග සහ වැඩසටහන්වලට ඒකාබද්ධ කිරීම ඇතුළුව ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම.	විවාහයට පෙර උපදේශන පැවැත්වීම, පවුල් සැලසුම් ක්‍රම හඳුන්වා දීම සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.	√	-	-
	3.8 මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක හා අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ සැමට ආරක්ෂිත, ඵලදායී, ගුණාත්මක සහ දැරිය හැකි මිලකට අත්‍යාවශ්‍ය ඖෂධ සහ එන්නත් සඳහා ප්‍රවේශය ඇතුළත් විශ්වීය සෞඛ්‍ය ආවරණයක් සාක්ෂාත් කර ගැනීම.	සේවය කරන සාමාජිකයින්ට සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් සඳහා නොමිලේ වෛද්‍ය පහසුකම් ලබා දී ඇත.	√	-	-
	3.a දුම්කොළ පාලනය පිළිබඳ ලෝක සෞඛ්‍ය	දුම්කොළ භාවිතයේ අවාසි පිළිබඳව අවදානම් කණ්ඩායම්	√	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
	සංවිධානයේ සම්මුතිය සුදුසු පරිදි සෑම රටකම ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම	ඉලක්ක කර දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.			
	3.b සෞඛ්‍ය මූලෝපාය වැඩි කිරීම සහ සංවර්ධනය වෙමින් පවතින රටවල, විශේෂයෙන් අඩු සංවර්ධිත රටවල සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍ය වල සෞඛ්‍ය ශ්‍රම බලකාය බඳවා ගැනීම, සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ රඳවා තබා ගැනීම	ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්ථිර සෞඛ්‍ය සේවා ගාස්තු පවත්වාගෙන යාම ඉලක්ක කරගත් ප්‍රමාණවත් පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගැනීම.	√	-	-
	3.c ජාතික හා ගෝලීය සෞඛ්‍ය අවදානම් පූර්ව අනතුරු ඇඟවීම්, අවදානම් අඩු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සියලුම රටවල, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ධාරිතාව ශක්තිමත් කිරීම	නිසි සනීපාරක්ෂක පියවර, අවදානම් සාධක වැළැක්වීම, රෝග වාහක සතුන් තුරන් කිරීම ආදිය ඉලක්ක කර ගනිමින් සෞඛ්‍ය අධ්‍යාපනය නංවාලීම සඳහා නිසි එන්නත් කිරීම අඛණ්ඩව පවත්වාගැනීම	√	-	-
අරමුණ 04 පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.4 2030 වන විට තිරසාර රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටි සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම.	මානව සම්පත් දැනුම හා කුසලතා වර්ධනය කිරීම. 1. පුහුණු පුද්ගලයින් සංඛ්‍යාව විදේශීය - 287 දේශීය - 720	√	-	-
		1. ධාරිතාව සහ දිගු කාලීන තිරසාර බව සහතික කිරීම සඳහා නවතම දෘඪාංග සහ ජාල තාක්ෂණයන් ලබා ගැනීම සඳහා ආයෝජනය කිරීම. 2. සේවා පුද්ගලයින් සඳහා තොරතුරු තාක්ෂණ දැනුම ලබාදීම අඛණ්ඩව සිදු කරනු ලබයි.	-	-	√
අරමුණ 06 සියල්ලන්ටම ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි බව සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම	**6.1** 2030 වන විට සැමට සුරක්ෂිතව සහ දැරිය හැකි ලෙස පානීය ජලය ලබාදීම සඳහා විශ්වීය සහ සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීම	පිරිසිදු කිරීමේ සහ බෙදාහැරීමේ පද්ධති ප්‍රවර්ධනය කිරීම මගින් පිරිසිදු පානීය ජලය සඳහා ප්‍රවේශය වැඩි කිරීම	-	√	-
	6.2 2030 වන විට, සැමට ප්‍රමාණවත් සහ සාධාරණ	ඵලදායී අංශයක් සහ ශක්තිමත් වගවීමේ රාමුවක් පිහිටුවීම	-	√	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
	සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා ගැනීම සහ විවෘත මලපහ කිරීම අවසන් කිරීම, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ සහ අවශ්‍යතාවන්ට සහ අවදානමට ලක්විය හැකි තත්වයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම				
	6.3 2030 වන විට, දූෂණය අවම කිරීම, බැහැර කිරීම, ඉවත් කිරීම සහ අන්තරායකර රසායනික ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය මුදා හැරීම අවම කිරීම මගින්, පිරිපහදු නොකළ අපජල අනුපාතය අඩකින් අඩු කිරීම සහ ගෝලීය වශයෙන් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂිත නැවත භාවිතය සැලකිය යුතු ලෙස වැඩි කිරීම මගින් ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.	ජල සම්පත් සහ ගබඩා කිරීම නිරීක්ෂණය, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම	-	√	-
		උපද්‍රව්‍ය ලෙස බැහැර කරන ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම	√	-	-
	6.4 2030 වන විට, සියලු අංශ හරහා ජල පරිහරණ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම සහ ජල හිඟයට පිළියම් යෙදීම සඳහා තිරසාර ලෙස ඉවත් කිරීම සහ පිරිසිදු ජලය සැපයීම සහතික කිරීම සහ ජල හිඟයෙන් පෙළෙන පුද්ගලයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු කිරීම.	1. අවම ජල ප්‍රමාණයෙන් ප්‍රතිඵලය වැඩි දියුණු කිරීම. 2. දෙන ලද ස්වයං සහ සමාජ අරමුණක් සඳහා භාවිතා කරන ජල ප්‍රමාණය අවම කිරීම.	√	-	-
	6.5 2030 වන විට, යෝග්‍ය පරිදි මායිම් සහයෝගීතාව ඇතුළුව, සියලු මට්ටම්වල ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම.	දැනුවත් කිරීමේ වැඩසටහන්, සමාජ ප්‍රතිලාභ සහ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයේ අවදානම වැඩි දියුණු කිරීම	√	-	-
	6.b ජලය සහ සනීපාරක්ෂක කළමනාකරණ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහාය වීම	ජල හා සනීපාරක්ෂක කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහභාගීත්වය සඳහා පරිපාලන හා මෙහෙයුම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම	√	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
	සහ සහභාගීත්වය ශක්තිමත් කිරීම.				
<u>අරමුණ 07</u> සෑමට දැරිය හැකි, විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සඳහා ප්‍රවේශය සහතික කිරීම	**7.2** 2030 වන විට ගෝලීය බලශක්ති මිශ්‍රණයේ පුනර්ජනනීය බලශක්තියේ කොටස සැලකිය යුතු ලෙස වැඩි කිරීම.	පවතින ඉඩ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගනිමින් විදුලි ජනන ධාරිතාව වැඩි කිරීම.	√	-	-
	7.3 2030 වන විට බලශක්ති කාර්යක්ෂමතාවයේ ගෝලීය වැඩිදියුණු කිරීමේ අනුපාතය දෙගුණ කිරීම.	උසස් හා නවීන තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම මගින් බලශක්ති උත්පාදනය වැඩිදියුණු කිරීම.	√	-	-
<u>අරමුණ 09</u> සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	**9.5** 2030 වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන සේවකයින් මිලියන 1ක් ලෙස සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, 2030 වන විට, සියලුම රටවල, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම.	1. සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘති ගණන. 2. හඳුන්වා දුන් උසස් තාක්ෂණික උපකරණ ගණන	-	-	√
<u>අරමුණ 12</u> තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.	**12.7** ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.	මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ මූල්‍ය නියාමනය අනුගමනය කිරීම.	-	-	√
<u>අරමුණ 15</u> භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ඉඩම්හායනය නැවැත්වීම සහ	**15.2** 2020 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශවූ වනාන්තර යථා තත්ත්වයට පත්කිරීම, ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම.	1. 75 වන නිදහසට සමගාමීව ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතන අතර පලතුරු හා වන පැළ 1,550ක් බෙදා හැරීම. 2. බීජ බෝම්බ 80,000ක් හෙළීම සඳහා 2023 ඔක්තෝබර් 30 වෙනි දින අනුරාධපුර කටුගම්පලයාගම ලබුගස්දමන අක්කර 50.5ක බීජ බෝම්බ හෙළීම සිදු කරන ලදී. 3. හෙරලි පෙරළි වැඩසටහන යටතේ ගුවන් හමුදා ආයතනවල	-	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2023		
			0% - 49%	50% - 74%	75% - 100%
පුනරුත්තාපනය හා පෛව විවිධත්වය විනාශය නැවැත්වීම.		සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල කොස් පැළ 6,900ක් අධීක්ෂණය හා වගා කිරීම.			

වගුව - 1

06 වන පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුව 1 සහ 2හි දක්වා ඇත.

අ. **සේවා කාර්ය මණ්ඩලය**

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත (ඇබෑර්තු)
නිළධාරීන් (නිත්‍ය/ ස්වේච්ඡා)	2,557	2,093	(464)
සෙසු නිලයන් (නිත්‍ය/ ස්වේච්ඡා)	34,381	26,643	(7,738)
එකතුව	**36,938**	**28,736**	**(8,202)**

වගුව - 1

ආ. **සිවිල් කාර්ය මණ්ඩලය**

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත (ඇබෑර්තු)
ජ්‍යෙෂ්ඨ මට්ටම	8	4	(4)
තෘතීය මට්ටම	3	2	(1)
ද්විතීය මට්ටම	192	93	(99)
ප්‍රාථමික මට්ටම	2,854	2,042	(812)
තාවකාලික/ කොන්ත්‍රාත්	328	85	(243)
එකතුව	**3,385**	**2,226**	**(1,159)**

වගුව - 2

ඇ. **2023 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයද ඇතුලත් වන පරිදි එක් එක් අංශ වල සිටින නිළධාරීන් සංඛ්‍යාව (දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය).**

අංශයේ නම	අනුමත සේවක සංඛ්‍යාව (මුළු නිළධාරීන් සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව			
		නිත්‍ය නිළධාරීන්	ස්වේච්ඡා නිළධාරීන්	කැඩෙට් නිළධාරීන්	නිත්‍ය නිළධාරීන්
සාමාන්‍ය රාජකාරී - ගුවන් නියමු	394	216	-	25	**241**
ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු	285	195	06	29	**230**
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු	135	94	-	13	**107**
තොරතුරු තාක්ෂණ ඉංජිනේරු	80	71	04	06	**81**
ගුවන් මෙහෙයුම්	138	99	-	15	**114**
රෙජිමේන්තු	547	338	02	80	**420**
සැපයුම්	245	192	-	28	**220**
පරිපාලන	276	194	-	42	**236**
සිවිල් ඉංජිනේරු	138	92	07	07	**106**
වෛද්‍ය	110	59	-	104	**163**

දන්ත	43	19	-	-	**19**
නීති	17	13	01	01	**15**
පශු	11	08	-	-	**08**
විනයාරක්ෂක	37	22	-	04	**26**
වෛද්‍ය/ මනෝ	06	06	02	-	**08**
අතුරු වෛද්‍ය	04	03	-	-	**03**
කෘෂි	17	17	-	-	**17**
ප්‍රසාංගික කලා	27	12	-	-	**12**
අධ්‍යාපන	26	-	16	03	**19**
විගණන	08	09	-	-	**09**
සංචිත	13	-	-	-	**-**
KDU 40*				39	**39**
එකතුව	**2,557**	**1,659**	**38**	**396**	**2,093**

වගුව - 3

ඇ. **2023 දෙසැම්බර් 31 දිනට නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව.**

සෙසු නිල	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	
		ස්වේච්ඡා (ගුවන්භට/ ගුවන් කාන්තා)	නිත්‍ය (ගුවන්භට/ ගුවන් කාන්තා)
ප්‍රධාන බලලත් නිළධාරී	168	-	68
බලලත් නිළධාරී	1,066	20	723
බලපත්ති සැරයන්	2,215	79	1,939
සැරයන්	3,990	525	3,114
කෝප්‍රල්	7,569	1,954	4,951
නායක ගුවන්භට/ ගුවන්භට	19,373	6,498	6,772
එකතුව	**34,381**	**9,076**	**17,567**

වගුව - 4

ඉ. 2023 වර්ෂයේ නිළධාරී උසස්වීම් පිළිබඳ තොරතුරු.

(1) 2023 වර්ෂයේ නිත්‍ය නිළධාරී උසස්වීම් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිළධාරීන් සංඛ්‍යාව
01	ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට	06
02	තාවකාලික එයාර් වයිස් මාර්ෂල් නිලයට	07
03	ස්ථිර ගුවන් කොමදෝරු නිලයට	11
04	තාවකාලික ගුවන් කොමදෝරු නිලයට	13
05	ස්ථිර ගෘප් කපිතාන් නිලයට	19
06	තාවකාලික ගෘප් කපිතාන් නිලයට	21
07	ස්ථිර විංග් කමාන්ඩර් නිලයට	34
08	තාවකාලික විංග් කමාන්ඩර් නිලයට	62
09	ස්ථිර බලඝන නායක නිලයට	84
10	තාවකාලික බලඝන නායක නිලයට	84
11	පියාසර ලුතිනන් නිලයට	35
12	පියාසර නිළධාරී නිලයට	42
එකතුව		**418**

වගුව - 5

(2) 2023 වර්ෂය තුල ස්වේච්ඡා නිළධාරීන්ගේ උසස්වීම් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිළධාරීන් සංඛ්‍යාව
01	තාවකාලික විංග් කමාන්ඩර්	01
02	ස්ථිර බලඝන නායක නිලයට	02
03	තාවකාලික බලඝන නායක නිලයට	01
04	පියාසර ලුතිනන් නිලයට	02
05	පියාසර නිළධාරී නිලයට	01
එකතුව		**07**

වගුව - 6

ඊ. **2023 වර්ෂය තුල නිළධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු.**

(1) 2023 වර්ෂය තුල නිත්‍ය නිළධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	එයාර් චීෆ් මාර්ෂල්	එයාර් වයිස් මාර්ෂල්	ගුවන් කොමදෝරු	ගෲප් කපිතාන්	විංග් කමාන්ඩර්	බලඝන නායක	ඉයාසර් ලුතිනන්	ඉයාසර් නිළධාරී	කැඩෙට් නිළධාරී	එකතුව
විශ්‍රාම ගැන්වූ	01	09	08	10	32	12	-	-	-	72
අධිකාරියෙන් ඉවත් වීම	-	-	-	-	01	36	11	03	-	51
සේවය අවලංගු කිරීම	-	-	-	-	-	02	04	-	05	11
උසස්ම නිලයට පත් වීම	-	-	-	-	-	04	02	01	-	07
අධිකාරියෙන් ඉවත් වීම	-	-	-	-	-	-	-	-	06	06
අවමන් සහිතව සේවයෙන් පහකිරීම	-	-	-	-	-	-	01	01	01	03
මුදල් ගෙවීමේ පදනම මත නිම සේවා ගැන්වීම	-	-	-	-	-	-	-	-	01	01
එකතුව	**01**	**09**	**08**	**10**	**33**	**54**	**18**	**05**	**13**	**151**

වගුව - 7

(2) 2023 වර්ෂය තුල ස්වේච්ඡා නිළධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	විංග් කමාන්ඩර්	බලඝන නායක	ඉයාසර් ලුතිනන්	ඉයාසර් නිළධාරී	එකතුව
වෛද්‍ය හේතූන් මත සේවය අවලංගු කිරීම	-	01	-	-	**01**
අධිකාරියෙන් ඉවත් වීම	-	01	01	08	**10**
විශ්‍රාම ගැන්වූ	02	-	-	-	**02**
අධිකාරියෙන් ඉවත් කිරීම	-	-	-	-	**-**
එකතුව	**02**	**02**	**01**	**08**	**13**

වගුව - 8

එ. නිත්‍ය ගුවන්භට/ ගුවන්කාන්තා උසස්වීම් - 2023.

(1) 2023 වර්ෂය තුල නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	උසස්වීම් සංඛ්‍යාව
ප්‍රධාන බලලත් නිළධාරී	82
ස්ථීර බලලත් නිළධාරී	347
වැඩබලන බලලත් නිළධාරී	430
ස්ථීර පියාසර සැරයන්	621
වැඩබලන පියාසර සැරයන්	689
ස්ථීර සැරයන්	624
වැඩබලන සැරයන්	822
ස්ථීර කෝප්‍රල්	821
වැඩබලන කෝප්‍රල්	1,075
එකතුව	**5,511**

වගුව - 09

(2) 2023 වර්ෂය තුල ස්වේච්ඡා ගුවන්භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	උසස්වීම් සංඛ්‍යාව
ප්‍රධාන බලලත් නිළධාරී	03
වැඩබලන බලලත් නිළධාරී	27
වැඩබලන පියාසර සැරයන	49
වැඩබලන සැරයන	206
වැඩබලන කෝප්‍රල්	531
එකතුව	**816**

වගුව - 10

ඒ. නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ නිම සේවා ගැන්වීම - 2023.

(1) 2023 වර්ෂය තුල නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය/ නිම සේවා ගැන්වීම තොරතුරු	2023 දෙසැම්බර් 31 දිනට		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව
විශ්‍රාම ගැන්වූ	851	03	**854**
සේවා ගිවිසුම අවසන් කිරීම	349	12	**361**
සේවය තව දුරටත් අවශ්‍ය නොවීම/ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම	130	11	**141**
වෛද්‍ය හේතූන් මත නිම සේවා ගැන්වීම	75	11	**86**
මුදල් ගෙවීමේ පදනම මත නිම සේවා ගැන්වීම	22	06	**28**
සානුකම්පිත හේතූන් මත විශ්‍රාම ගැන්වීම	161	11	**172**
එකතුව	**1,588**	**54**	**1,642**

වගුව - 11

(2) 2023 වර්ෂය තුල ස්වේච්ඡා ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	2023 දෙසැම්බර් 31 දිනට		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව
විශ්‍රාම ගැන්වූ	398	27	**425**
සේවා ගිවිසුම අවසන් කිරීම	240	13	**253**
ඉල්ලීම මත නිම සේවා ගැන්වීම	214	08	**222**
සේවය තව දුරටත් අවශ්‍ය නොවීම	60	02	**62**
වෛද්‍ය හේතූන් මත නිම සේවා ගැන්වීම	68	-	**68**
නිත්‍ය සේවයට මාරු කිරීම /අන්තර් ග්‍රහණය කිරීම	01	-	**01**
එකතුව	**981**	**50**	**1,031**

වගුව - 12

6.2 මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපෑම

2023 වර්ෂයේ ශ්‍රීලංගුහ අනුමත සේවක සංඛ්‍යාවේ තත්‍ය උපයෝජනය 76.78% කි.අනුමත කාර්ය මණ්ඩලයේ උපයෝජනය නොකළ ප්‍රතිශතය 23.21% ක් වන අතර එය සේවා පුද්ගල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 8,202 ක් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 1,159 ක් ද ඇතුළුව මුළු පුරප්පාඩු 9,361 ක් නියෝජනය කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරුන් සඳහා දේශන ගාස්තු ගෙවීම	2	පැය 30		0.04	-	දේශීය	ව්‍යට අදාලව
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය පීඨ සාමාජිකයින් සඳහා ගාස්තු ගෙවීම	5	පැය 20		0.17	-	දේශීය	විෂයට අදාලව
TKT මොඩියුල II සඳහා නිලධාරීන් සහ ගුරුවරුන් විසින් දරන ලද පිරිවැය ප්‍රතිපූරණය	7	2023 ජූනි 15	2023 ජූනි 19	0.13	-	දේශීය	විෂයට අදාලව
කළමනාකරණ මොඩියුල අංක 18 ඉංග්‍රීසි මාධ්‍යය සහ අංක 89 සිංහල මාධ්‍යය අධිකාරී නොලත් නිලධාරීන්ගේ කළමනාකරණ පාඨමාලා ගාස්තු ගෙවීම	5	2022 සැප්. 26	2022 දෙසැ. 23	0.23	-	දේශීය	විෂයට අදාලව
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරුන් සඳහා දේශන ගාස්තු ගෙවීම	1	පැය 20		0.05	-	දේශීය	විෂයට අදාලව
2022/2023 58 වැනි තත්ව කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා දේශන ගාස්තු ගෙවීම්	2	දස මස් (10)		0.21	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා වන ගුවන් ගමන් ගාස්තු පිළිබඳ e-ticketing ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ගාස්තු ගෙවීම	2	ත්‍රෛමාසික (ඉරිදා සහ සෙනසුරාදා - පැය 0900 සිට පැය 1200)		0.10	-	දේශීය	විෂයට අදාලව
අංක 72 කණිෂ්ඨ විධායක සහ මාණ්ඩලික	2	පැය 35 1/2		0.09	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
පාඨමාලා සඳහා බාහිර දේශන ගාස්තු ගෙවීම							
නිලධාරීන් /ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - චිත්‍රාගාර සහ මහජන ඇමතුම් පද්ධති වළ ශබ්ද පරිපාලනය සඳහා වන සහතික පත් පාඨමාලාව 43 වන කණ්ඩායම	2	2023 පෙබ. 18 සිට 2023 මැයි 28 - දින 24 (සෙනසුරාද සහ ඉරිදා)		0.10	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන්ගේ 6 වන අධ්‍යයන සැසිය සඳහා - 2023	34	2023 පෙබ. 25 සහ 26 (0800 පැයේ සිට 1700 පැය දක්වා)		0.09	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම අන්තරායකාරී ඖෂධ වලින් වැළකීම පිළිබඳ සහතික පත් පාඨමාලාව	2	දින 07 (සෙනසුරාදා දිනයන්හි)		0.04	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා ගෙවීම - ප්‍රායෝගික පුහුණු සහතික පත් පාඨමාලාව සඳහා අනුග්‍රාහකත්වය	1	2023 මාර්තු 01		0.01	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - යෝග්‍යතා පුහුණු කරුවන් සඳහා වන සහතික පත් පාඨමාලාව 2023	5	තෙමස් (03) (සිකුරාදා - පැය 0900 සිට පැය 1300 දක්වා)		0.09	-	දේශීය	විෂයට අදාලව
සිවිල් දෙමළ උපදේශක ගාස්තු ගෙවීම - ශ්‍රීලංගුහ පලාලි කඳවුර	1	පැය 48		0.06	-	දේශීය	විෂයට අදාලව
ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ 90 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය - 2023 සඳහා ලියාපදිංචි ගාස්තු ගෙවීම	9	2023 ජුනි 29	2023 ජූලි 01	0.01	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් /ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ප්‍රවාලන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ නිපුණතා සංවර්ධන පාඨමාලාව	10	දින 12 (පැය 90)		0.22	-	දේශීය	විෂයට අදාලව
කළමනාකරණ මොඩියුල අංක 19 ඉංග්‍රීසි මාධ්‍යය සහ අංක 90 සිංහල මාධ්‍යය අධිකාරී නොලත් නිලධාරීන්ගේ	5	2023 පෙබ. 13	2023 පෙබ. 17	0.23	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
කළමනාකරණ පාඨමාලා ගාස්තු ගෙවීම							
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම අපරාධ විද්‍යාව සහ අපරාධ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	1	වසර 01 (සෙනසුරාදා දිනයන්හි)		0.10	-	දේශීය	විෂයට අදාලව
සයිබර් ආරක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා ගාස්තු ගෙවීම	2	මාස 03		0.05	-	දේශීය	විෂයට අදාලව
ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ 90 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය - 2023 සඳහා ලියාපදිංචි ගාස්තු (අන්තර් ජාතික දන්ත සම්මේලනය) ගෙවීම	4	2023 ජූලි 08 (එක් දින වැඩසටහන)		0.04	-	දේශීය	විෂයට අදාලව
ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ 90 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය - 2023 සඳහා ලියාපදිංචි ගාස්තු (අන්තර් ජාතික දන්ත සම්මේලනය) ගෙවීම	6	2023 ජූලි 08 (එක් දින වැඩසටහන)		0.01	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භට Hacking Challenge තරගය සඳහා ගාස්තු ගෙවීම	9	2023 මැයි 16 (0830 - 1500)		0.02	-	දේශීය	විෂයට අදාලව
Olympic Solidarity Sport පරිපාලන පාඨමාලාව (OSSAC) - 2023 සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	3	2023 මැයි 01	2023 මැයි 14	0.06	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා කොළඹ වෛද්‍ය විද්‍යාලයේ හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ගෙවන ලද ගාස්තු ප්‍රතිපූරණය කිරීම	1	2023 මැයි 08 සිට සැප්. 07 දක්වා (පූර්ණ කාලීන)		0.42	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් /ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම වඩා හිතකර සේවා පරිසරයක් සඳහා වෘත්තීය සෞඛ්‍යය සහ	15	2023 ජූනි 27 සහ 28		0.14	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව							
නිලධාරීන් සඳහා - කණිෂ්ඨ අණ හා මාණ්ඩලික පාඨමාලා අංක 73, බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගෙවන ලද දේශන ගාස්තු ප්‍රතිපූරණය කිරීම	2	පැය 30 1/2		0.08	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා ගෙවීම් - පුහුණු උපදේශකයින් සඳහා අධ්‍යාපනික මනෝවිද්‍යාව සහ උපදේශන ක්‍රමවේද අදියර පිළිබඳ පාඨමාලාව	51	දින 10 (2023 අගෝ. 02 සිට 2023 අගෝ. 15 දක්වා)		0.37	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා ගෙවීම - ආහාර සැපයුම් සහකාර සඳහා සත්කාරක කළමනාකරණය	10	දින අට (08) 2023 ජූනි 10,11,17,18,25 සහ 2023 ජූලි 01,02		0.48	-		
ගුවන් භටයින් සඳහා ගෙවීම - ආහාර සැපයුම් සහකාර සඳහා සත්කාරක කළමනාකරණය	10	දින අට (08) 2023 ජූලි 08,09,15,16,22,23, 29 සහ 30 (සෙනසුරාදා ඉරිදා)		0.31	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා ගෙවීම - රියදුරු උපදේශක පාඨමාලාව - 2023	12	වැඩ කරන දින තිස්හය 36		0.35	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ජල පොම්ප කිරීම සහ සම්පීඩක නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	3	2023 ජූනි 24	2023 ජූලි 01	0.04	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ජල පොම්ප කිරීම සහ සම්පීඩක නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	3	2023 ජූනි 24	2023 ජූලි 01	0.04	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - හයිඩ්‍රොලික් පද්ධති නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	4	දින පහ (05) (2023 ජූලි 15,16,22,23 සහ 29)		0.10	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
කනිෂ්ඨ අණ හා මාණ්ඩලික පාසලේ අංක 71 72 73 දරණ ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පාඨමාලා ගාස්තු ගෙවීම	86	අංක - 71 පාඨමාලාව (2022 අගෝ. 29 සිට දෙසැ. 06 දක්වා) අංක - 72 පාඨමාලාව (2023 ජන. 02 සිට අප්‍රේල් 08 දක්වා) අංක - 73 පාඨමාලා (2023 මැයි 23 සිට අගෝ. 12 දක්වා)		1.40	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	4	වසර 01 (සති අන්ත ඉරිදා)		0.38	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - කාර්මික සහ කම්කරු නීති යෙදවුම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) – 5 ඉංග්‍රීසි මාධ්‍යය	2	වසර 01 (සති අන්ත ඉරිදා		0.22	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ජාතික මානව සම්පත් කළමනාකරණ සමුළුව - 2023	5	2023 ජූනි 21 සහ 22		0.11	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - මොටර් රථ විද්‍යුත් තාක්ෂණ	9	දින 30 (පැය 240 - සති අන්ත)		0.20	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - බෝතල් කල පානීය ජලය නිෂ්පාදනය කිරීම සඳහා වන ප්‍රායෝගික තත්ත්ව සහතික පුහුණුව 2023	5	1 වන පුහුණු වැඩසටහන - 2023 ජූලි 29 (දින 01) 2 වන පුහුණු වැඩසටහන - 2023 නොවැ. 16 (දින 01)		0.05	-	දේශීය	විෂයට අදාලව
2023 සූපශාස්තර තරඟ සඳහා ලියාපදිංචි ගාස්තු ප්‍රතිපූරණය කිරීම	9	2023 ජූනි 09 සිට 2023 ජූනි 11 දක්වා		0.02	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	25	දින පහ (05)		0.48	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
- ගෘහස්ථ ගුවන් ආරක්ෂිත පුහුණු වැඩසටහන							
ප්‍රතිපූරණය කිරීමේ පදනම මත සම්මුතිකරණ වැඩමුළු පාඨමාලා පැවැත්වීම	20	දින 05 (2023 අගෝ. 14,25,16,17 සහ 18)		0.23	-	දේශීය	විෂයට අදාලව
ISO 9001 2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව	30	2023 ජූලි 25 සිට 2023 ජූලි 26 දක්වා		0.18	-	දේශීය	විෂයට අදාලව
අංක 17 (2023) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පාඨමාලාවේ ශිෂ්‍ය නිලධාරීන් සඳහා නොමිලේ ඉංග්‍රීසි භාෂා සැසි පැකේජය සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම.	28	මාස 02 දින 13		0.98	-		
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම තත්ත්ව කලමනාකරණය පිළිබඳ සහතිකපත් පාඨමාලාව	3	-		0.14	-		
තත්ත්ව කලමනාකරණය පිළිබඳ සහතිකපත් පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	4	සෙනසුරාදා දිනයන් දහය (10)		0.19	-	දේශීය	විෂයට අදාලව
චීන වරාය ශ්‍රීලංගුහ විද්‍යායතනයේ ගුවන්සේවා අධ්‍යයන උපාධි වැඩසටහනේ (අංක 66 කැඩෙට් නිලධාරී සහ අංක 18 කාන්තා නිලධාරී ශිෂ්‍යභට බඳවා ගැනීම්) 15 වැනි කණ්ඩායම සඳහා පවත්වනු ලබන දේශන සඳහා ගෙවීම්	2	පැය 20		0.04	-	දේශීය	විෂයට අදාලව
දන්ත/පශු වෛද්‍ය රෝග විනිශ්චය එක්ස් කිරණ යන්ත්‍ර ක්‍රියාකරන්නන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ ජාතික ගුවන් භට පුහුණු පාඨමාලාව සඳහා ගාස්තු ප්‍රතිපූරණය කිරීම	1	2022 අගෝ. 17 සිට 2022 අගෝ. 19 දක්වා		0.01	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - පයිතන් වැඩසටහන්කරනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව	2	මාස 04 (සති අන්තයේ පමණි)		0.05	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - Olympic Solidarity Sport පරිපාලන පාඨමාලාව (OSSAC) – 2023	3	2023 අගෝ. 10 සිට 2023 අගෝ. 13 දක්වා		0.06	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - Olympic Solidarity Sport පරිපාලන පාඨමාලාව (OSSAC) – 2023	4	2023 අගෝ. 05 සිට 2024 අගෝ. 18 දක්වා (වසර 01)		0.26	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් /ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - අන්තරායකාරී ඖෂධ වලින් වැලකීම පිළිබඳ සහතිකපත් පාඨමාලාව	4	දින 07 (සෙනසුරාදා)		0.08	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ඔප්ටිකල් ෆයිබර් තාක්ෂණය පිළිබඳ සහතිකය සහ ඔප්ටිකල් ෆයිබර් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකය	11	2023 සැප්. 04 සිට 2023 සැප්. 15 දක්වා (වැඩකරන දින 10)		0.99	-	දේශීය	විෂයට අදාලව
ගෘහස්ථ වැඩමුළු පාඨමාලාව සඳහා ගාස්තු ප්‍රතිපූරණය	30	දින 01		0.06	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන්/ගුවන් භටයින් සඳහා ගාස්තු ප්‍රතිපූරණය - ඉලෙක්ට්‍රොනික/විදුලි පරීක්ෂණ උපකරණ ක්‍රමාංකනය පිළිබඳ පුහුණු වැඩසටහන	15	දින පහ (05) - 2023 ඔක්. 09,10,11,12,13		0.11	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා ගාස්තු ප්‍රතිපූරණය - ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2	මාස 08 (ඉරිදා)		0.09	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා - ගුවන් සේවා අධ්‍යයන උපාධි වැඩසටහනේ	1			0.05	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
බාහිර කථිකාචාර්ය ගාස්තු ප්‍රතිපූරණය							
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික සහතිකපත් පාඨමාලාව සඳහා ගාස්තු ගෙවීම	8	මාස 03 (ඉරිදා)		0.19	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වරලත් පාඨමාලාව	4	මාස 06 (සති අන්ත)		0.83	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික පාඨමාලාව	15	දින දාහත (සෙනසුරාදාවන්)		0.33	-	දේශීය	විෂයට අදාලව
ව්‍යුහයන් සහ පද්ධති ආලෝක ආරක්ෂණය සහ භූගත කිරීම සඳහා වන පාඨමාලාව සඳහා ගාස්තුව ගෙවීම	10	දින දෙකකි		0.18	-	දේශීය	විෂයට අදාලව
TKT මොඩියුල - 01 (ගුරුවරුන්ගේ දැනුම පරීක්ෂණය) සඳහා නිලධාරීන් සහ ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය - ඉංග්‍රීසි භාෂා උපදේශකයින් සඳහා වන වැඩසටහන.	4	-		0.06	-	දේශීය	විෂයට අදාලව
අකුණු ආරක්ෂණ පද්ධති සහ විශේෂ හමුදා යෙදවුම් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	25	2023 අගෝ. 02 දින 08.30 සිට	17.00 දක්වා	0.03	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකපත් පාඨමාලාව	2	දින 08 (ඉරිදා)		0.06	-	දේශීය	විෂයට අදාලව
2023 ජාතික සැපයුම් දාම දින සම්මන්ත්‍රණය සහ CEO සංසදය සහ ජාතික සැපයුම් දාම විශිෂ්ටතා සම්මාන 2023 සඳහා ලියාපදිංචි ගාස්තු ගෙවීම	7	2023 ඔක්. 24 (පැය 0830 සිට	පැය 1630 දක්වා)	0.05	-	දේශීය	විෂයට අදාලව
ගුවන් සේවා අධ්‍යයන උපාධි වැඩසටහනේ බාහිර කථිකාචාර්ය	1	2023 ජූලි 17 සිට	2023 ජූලි 21 දක්වා	0.02	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
ගාස්තු සඳහා ගෙවීම ප්‍රතිපූරණය කිරීම							
මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය (IHL) කනිෂ්ඨ අණ සහ මාණ්ඩලික පාඨමාලාව අංක 74 සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම	25	දින තුනක් (03)		0.09	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ජාල පරිපාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	3	මාස දෙකකි		0.04	-	දේශීය	විෂයට අදාලව
ගුවන් හමුදා නිලධාරීන් සඳහා වන භූ පද්ධති විද්‍යාව පිළිබඳ වන භූ තොරතුරු පාඨමාලාව සඳහා ගාස්තු ගෙවීම	2	-	-	0.12	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - භූ පද්ධති විද්‍යාව පිළිබඳ වන භූ තොරතුරු පාඨමාලාව	1	-	-	0.06	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා වන ඉහළ අවදානම් කාර්මික උපකරණ සහ ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව හා පාඨමාලාව සඳහා ගාස්තු ගෙවීම	5	2023 ඔක්. 21 (පැය 04)		0.03	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම මෝටර් රථ ඉංජිනේරු තාක්ෂණවේදයේ ස්වයංක්‍රීය වායු සමීකරණ පද්ධතිය පිළිබඳ	10	දින 12 (සති අන්ත)		0.18	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - මොටර් රථ විද්‍යුත් තාක්ෂණ	14	දින 15 (සෙනසුරාදා සහ ඉරිදා)		0.57	-	දේශීය	විෂයට අදාලව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම ක්‍රීඩා සම්බාහකයින් සහ චිකිත්සක සහායකයින් පිළිබඳ සහතික පත් පාඨමාලාව	2	එක් අවුරුදු (බ්‍රහස්පතින්දා)		0.17	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම ආගන්තුක සත්කාර සහ	15	දින 08 (සෙනසුරාදා සහ ඉරිදා)		0.90	-	දේශීය	විෂයට අදාලව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
වැඩසටහන් කළමනාකරණයේ මූලිකාංග							
නිලධාරීන් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම පුහුණුව සහ මානව කුසලතා පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDTHTD)	2	වසරක් (01) (ඉරිදා)		0.16	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන්/ගුවන් හටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම චුම්භක අංශු පරීක්ෂාව පිළිබඳ වැඩසටහන සෘජු මට්ටම ii	5	2023 ඔක්. 18 සිට 2023 ඔක්. 26 දක්වා		0.39	-	දේශීය	විෂයට අදාලව
ගුවන් හටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම සම්බාහකයින් සහ චිකිත්සක සහායකයින් පිළිබඳ සහතික පත් පාඨමාලාව	2	2023 නොවැ. 02 සිට 2024 නොවැ. 01 දක්වා (එක් අවුරුදු)		0.17	-	දේශීය	විෂයට අදාලව
නිලධාරීන්/ ගුවන් හටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම Programmable Logic Controller (PLC)	3	දින 05 (2023 ඔක්. 04,05,18,19 සහ නොවැ. 23)		0.08	-	දේශීය	විෂයට අදාලව
කනිෂ්ඨ ජාතික නීති සම්මන්ත්‍රණය සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම 2023	2	2023 ඔක්. 13 සිට 2023 ඔක්. 15 දක්වා		0.05	-	දේශීය	විෂයට අදාලව
භූ තොරතුරු එක් සති පුහුණු වැඩසටහන සඳහා ගාස්තු ප්‍රතිපූරණය	15	2023 නොවැ. 27 සිට 2023 දෙසැ. 01 දක්වා		0.17	-	දේශීය	විෂයට අදාලව
ගුවන් හටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම – National Diploma in sports strength and conditioning	2	ඕෂ 18 (බ්‍රහස්පතින්දා)		0.17	-	දේශීය	විෂයට අදාලව
